

වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT

2017

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
மூன்றாம் நிலைக்கல்வி, தொழிற்கல்வி ஆணைக்குழு
TERTIARY AND VOCATIONAL EDUCATION COMMISSION

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி அமைச்சு
Ministry of Skills Development and Vocational Training

පටුන **පිටු අංකය**

කොමිෂන් සභා තොරතුරු		II
දැක්ම හා මෙහෙවර		III
සභාපතිතුමාගේ පණිවිඩය		IV
අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය		V
1.0	හැඳින්වීම	1
2.0	නෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය	1
3.0	කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය	4
4.0	පාලන හා මුදල් අංශය	6
5.0	සැලසුම් හා පර්යේෂණ අංශය	17
6.0	පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	23
7.0	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය	30
8.0	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	35
9.0	කර්මාන්ත සබඳතා අංශය	42
10.0	තොරතුරු පද්ධති අංශය	49
11.0	ජාත්‍යන්තර සහයෝගීතාව	63
මූල්‍ය ප්‍රකාශය		65 - 86
	මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය	65
	මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	66
	ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	67
	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	68
	මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්	70
	මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ උප සටහන්	77
	මූල්‍ය තත්ත්ව ප්‍රකාශ උප සටහන්	84
විගණකාධිපති වාර්තාව		87
විගණකාධිපති වාර්තාවේ පැහැදිලි කිරීම් හා පිළිතුරු		109

කොමිෂන් සභා තොරතුරු

ආයතනය	:	තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
අමාත්‍යාංශය	:	නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
ලිපිනය	:	තුන්වන මහල නිපුණතා පියස, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.
ඊමේල් ලිපිනය	:	info@tvec.gov.lk
වෙබ් අඩවිය	:	www.tvec.gov.lk
දුරකථන අංකය	:	011 - 7608000
ෆැක්ස් අංකය	:	011 - 2555007
විගණකවරු	:	විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
බැංකු කරුවන්	:	මහජන බැංකුව, වයි.එම්.බී.ඒ. ශාඛාව, බොරැල්ල.

දැක්ම

රැකියා වෙළඳපොළට ගැළපෙන හා ගුණාත්මක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය අපේක්ෂා කරන සියළු දෙනාට වෘත්තීය පුහුණුව ලැබීම අපගේ දැක්ම වේ.

මෙහෙවර

අභියෝගාත්මක ලෝක වෙළඳ අවශ්‍යතා හා සමාජ ආර්ථික අරමුණු ඉටුවන කාර්යක්ෂම, ඵලදායී හා ගුණාත්මභාවය සහතික කළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිතකර පවත්වාගෙන යෑම අපගේ මෙහෙවර වේ.

සභාපතිතුමාගේ පණිවිඩය

2017 දී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පෙර වසර ආරම්භ කරන ලද බොහෝ කාර්යයන් ඇමතිවරයා විසින් දක්වන ලද ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය මත පදනම් විය. 2017 මැයි මාසයේ දී තනතුරේ වැඩ භාරගත් නව ඇමතිතුමා, ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍යතාවය සහ වැඩ ලෝකය සඳහා වඩා හොඳ අවධානයක් ලබා දුන් අතර ඒ සඳහා ඉලක්කගත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට උපදෙස් දී ඇත.

ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පිහිටුවා ඇති ආංශික නිපුණතා සභා සඳහා උපදේශනය දෙන ලද අප ආයතනය, නව රැකියා අරමුණු කරගත් විෂයමාලා හඳුන්වා දීම සඳහා ආංශික සභා තුනක් සමඟ ඵලදායීව කටයුතු කලත්. අවාසනාවකට මෙන් එම සැලසුම් පුහුණු ආයතන විසින් නොසළකා හැර සැපයුම් මත පදනම් වූ අධ්‍යාපනය පිළිබඳව විශ්වාස කරන බැවින්, පැරණි ක්‍රමය සමඟ රැඳී සිටීමට හේතු කිහිපයක් සොයා ගෙන ඇත. ඉංග්‍රීසි හා මෘදු කුසලතා ගුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමට මෙම ආයතන අසමත් වී ඇති අතර, අමාත්‍යාංශය විසින් විශාල වෙනසක් ඇති කරනු නොලැබුවහොත්, පෙර ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් මෙන්ම මේ සඳහා ගන්නා විදෙස් ණයද අසාර්ථක උත්සාහයකට යොමු වෙනු වැළැක්විය නොහැක.

වාසනාවකට මෙන් 2017 වසර අවසානයේ දී විශිෂ්ඨ තරුණ බාහිර උපදේශකයින්ගේ සේවය දීර්ඝ කිරීමට වෘත්තීය පුහුණු අධිකාරිය අසමත් වීම නිසා ස්ථිර තනතුරුවලට බඳවා ගැනීම කරන ලෙස අමාත්‍යාංශය උපදෙස් දී ඇතත් වසරක සිට එම පරිපාලනය මේ සඳහා විරෝධය පළකරමින් සිටී. පුහුණුව සහ උපදේශක පුහුණුව සම්බන්ධීකරණය කිරීම සඳහා ඉල්ලීම් කළ පරිදි අමාත්‍යාංශය විසින් කමිටු පිහිටුවා ඇති අතර, මේ වන විට ඒවායේ සාධනීය වර්ධනයක් ඇති බවක් පෙනෙන්නට නිබුණත් ඵලදායිභාවය පිළිබඳ තහවුරු කිරීම තවදුරටත් පිරික්සීමෙන් කල යුතුය.

මේ අතර නව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතක් හඳුන්වා දීමට දරන ප්‍රයත්නයන් අඛණ්ඩව සිදු වුවත්, අමාත්‍යතුමාගේ නීති උපදේශක විසින් අපගේ අවසන් කෙටුම්පත පිළිගන්නා තෙක් බලා සිටිමු. කෙසේ වෙතත් 2016 වන විට අප ආයතනය විසින් අනුගමනය කරන ලද නව ප්‍රතිපත්ති ප්‍රකාශය සහ ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රියාකාරී අත්පොත සඳහා එම නියාමන කමිටුව සමඟ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම පුහුණු ආයතන විසින් එකඟ වී ඇත.

අප ජාතික තරුණ සේවා සභාව හා ජාතික යොවුන් සේනාංකය සමඟ සමීපව කටයුතු කරන නමුත්, අවාසනාවකට මෙන් ඔවුන් තවමත් වෙනත් අමාත්‍යාංශයක් යටතේ දිගටම කටයුතු කරගෙන යන අතර, ඇමතිතුමාගේ උපදේශකයින්ගේ අදහස වන්නේ ඔවුන් වඩා හොඳ සම්බන්ධීකරණයක් සඳහා අනිකුත් පුහුණු ආයතන සමඟ එක්ව සිටීමයි.

මීට අමතරව, සාමාජිකයින් විසින් විසුරුවා හැරීමට ඡන්දය දුන් සංචාරක අංශික සභාවට අමතරව, විෂයමාලා සංවර්ධනය සඳහා වඩාත් ප්‍රායෝගික වන ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සමඟ අප සමීපව කටයුතු කර ඇත. ඉල්ලා ඇති පරිදි ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය හා ප්‍රමුඛ හෝටල් සමඟද වඩාත් සමීපව කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙමු. තවද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ සහයෝගීතාවය අඛණ්ඩව සතුටුදායක තත්ත්වයක පවතී.

පසුගිය වසර කිහිපය තුළ බොහෝ අභියෝගවලට මුහුණ දුන් අප ආයතනයේ කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුදකරමි. තවදුරටත් ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම කලයුතු අතර විශේෂයෙන් ඔවුන්හට වියදම් අධික උපදේශකයින්ට වඩා හොඳ විශ්ලේෂණයන් කළ හැකි වීම අපට ආඩම්බර වියහැකි කාරණයකි.



මහාචාර්ය රජීව විජේසිංහ
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

1990 අංක 20 දරන කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව කටයුතු කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ) වෙත බලය පැවරී ඇත.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පනත හා සංවර්ධන සැලැස්ම අනුව පුහුණු ආයතනවල තත්ත්ව සහතික කිරීම, ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම, කර්මාන්ත සම්බන්ධතා, පුහුණු ලේඛණ සංවර්ධනය සහ සැලසුම්කරණය සහ පර්යේෂණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් වේ. 2017 වර්ෂයේ දී අප ආයතනය ලියාපදිංචි වී ඇති පුහුණු සැපයුම්කරුවන්ගේ සහයෝගය ඇතිව උසස් නිපුණතාවෙන් හෙබි පුරවැසියන් බිහිකිරීම තුළින් රටේ ආර්ථිකයට වැදගත් දායකත්වයක් ලබා දී ඇත. සමාලෝචිත වර්ෂයේදී අප දැක්ම සහ මෙහවර සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබීය.

කර්මාන්ත සංවර්ධනය කේන්ද්‍ර කරගත් ජාතික නිපුණතා සම්මත හා ආශ්‍රිත පුහුණු ලේඛණ, කර්මාන්ත අංශික සභා පිහිටුවීම්, NVQ නොවන සුදුසුකම් සඳහා NVQ සුදුසුකම් අනුරූපණය කිරීම් 2017 දී ඉටු කරන ලද ක්‍රියාකාරකම් අතර වැදගත් වේ.

ලියාපදිංචිය හා ප්‍රතිතන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය කිරීම මගින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතනවලට හා මහජනතාවට විශාල වාසියක් වී ඇති අතර විනිවිදභාවය ද යහපාලනය හා වගවීමේ ක්‍රියාවලීන් සඳහා දායක වී ඇත. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය මගින් ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රියාකාරිත්වයන් පිළිබඳ වැදගත් රැස්වීම්හිදී ගන්නා ලද තීරණ ප්‍රකාශ කිරීමෙන් යාවත්කාලීන කරන ලද ප්‍රවෘත්ති හා තොරතුරු එහි ප්‍රසිද්ධ කර ඇත.

තව දුරටත්, ඊ.රාජ්‍ය හා තොරතුරු දැනගැනීමේ (2016-12) පනත යටතේ එම රෙගුලාසිවල සඳහන් අවශ්‍යතාවයන් සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව කටයුතු කර ඇත. එමගින් විනිවිදභාවය, වගවීම සහ යහපාලනය ප්‍රවර්ධනය කිරීම දිරිගන්වයි.

2017 වර්ෂය තුළදී අප පාලක සභා රැස්වීම් 13 ක් පවත්වන ලද අතර එම රැස්වීම් වලදී සියලුම ඝණපුරණය සම්පූර්ණ කර ඇත. 2017 වර්ෂය තුළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සියලුම අංශවල ඉලක්ක සපුරා ගැනීම පිළිබඳව මාහට සෑහීමකට පත් විය හැකිය. තව දුරටත් 2017 වර්ෂයේදී ආයතනය මගින් උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන 15.9 ක් විය. මෙහි ඇස්තමේන්තුගත මුදල රුපියල් 15.3 කි. මෙම මුදල් මහා භාණ්ඩාගාරයට බැරකර ඇත.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා 2018 වර්ෂයේ දී අප ආයතනයේ කටයුතු ව්‍යාප්ත කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි. අවසාන වශයෙන්, මගේ කාර්ය මණ්ඩලයට, සභාපතිතුමාට, ලේකම්තුමාට සහ ගරු ඇමතිතුමන්ට අප වෙත ලබා දුන් නිවැරදි මාර්ගෝපදේශ ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

මල්කාන්ති ජයවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

1.0 හැඳින්වීම

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපනය කරන ලද අතර 1990 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධිත) පනත මඟින් 1999 දෙසැම්බර් 16 දින සිට ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වේ.

කොමිෂන් සභාවේ පොදු අරමුණු පහත සඳහන් පරිදි වේ.

(අ) ආර්ථිකයේ මිනිස් සම්පත් අවශ්‍යතාවලට සරිලන අයුරින් සියළුම මට්ටම්වල තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම.

(ආ) සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ඇතුළුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රධානයන් පිරිනැමීම සඳහා ජාතික වශයෙන් පිළිගත් ක්‍රමයක් සංවර්ධනය කිරීම, සහ

(ඇ) තෘතියික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සලස්වන ශිල්ප ආයතන, නියෝජ්‍ය ආයතන සහ වෙනත් සියළු ආයතනවල ශාස්ත්‍රීය හා පුහුණුවීම් සම්මතයක් පවත්වාගෙන යාම.

2.0 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කොමිෂන් සභාව 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ දැක්වෙන විධි විධාන අනුව පත් කරනු ලබන සභාපතිවරයෙකු ඇතුලු සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත වේ.

2017 වසර තුල කොමිෂන් සභා සංයුතිය

පනතේ 6(1) (ඈ) වගන්තිය යටතේ කර ඇති පත්වීම්

1) මහාචාර්ය රජීව විජේසිංහ මහතා - සභාපති
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

2) කමල් බී සිරිවර්ධන මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

3) ආර්.ඒ.ඩී.ආර්. මාලනී පීරිස් මහත්මිය - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

4) ආචාර්ය පුජ්‍ය කිරිින්දේ අස්සජි හිමි - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

5) නිර්මලී වී. හෙට්ටිආරච්චි මහත්මිය - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

6) බුද්ධික රුවන් මඩිහහේවා මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

7) ගරු එන්. ඇන්තනී හියුමර් පින්ටෝ පියතුමා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

8) වඩිවෙල් පුත්තිරසිගමනි මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

10) පේ දේවපිරාන් මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත
(2016 .12 .07 සිට)

පනතේ 6 (1) (අ) සිට (ළ) වගන්ති යටතේ කර ඇති පත්විම්

අ) මල්කාන්ති ජයවර්ධන මහත්මිය - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්

ආ) ආචාර්ය ඒ .යූ .සී අතුකෝරල මහතා - සාමාජික
සභාපති
ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය

ඇ) මේජර් ජනරාල් ගාමිණී හෙට්ටිආරච්චි මහතා - සාමාජික
සභාපති
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ඈ) පේ.ඒ. රංජිත් මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තුමේන්තුව

ඉ) ආචාර්ය හිලරි ඊ සිල්වා මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ඊ) හේමාල් කස්තූරිආරච්චි මහතා - සාමාජික
මුදල් අමාත්‍යාංශය
මහා භාණ්ඩාගාර නියෝජිත

පනතේ 6(1)(ළඉ) වගන්තිය යටතේ කර ඇති නව පත්විම් (2017 ජූලි මස 14)

1) මහාචාර්ය රජීව විජේසිංහ මහතා - සභාපති
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

2) ආචාර්ය ටී ඒ පියසිරි මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

3) ආචාර්ය කේ.එල්ගවන්ද්‍රතිලක මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

4) ආචාර්ය පුජ්‍ය කිරින්දේ අස්සජි හිමි - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

5) එන්. කේ. කිත්සිරි ආනන්ද මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

6) බුද්ධික රුවන් මඩිහේවා මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

7) ගරු එන්.ඇන්තනී හියුමර් පින්ටෝ පියතුමා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

9) වඩිවෙල් පුත්තිරසිගමනි මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

10) එච්.එල්.සී.පී. විජේසේකර මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

11) පී.කේ.ඒ. ගුණවර්ධන මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

12) අංජන දොඩම්ගොඩ මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

පනතේ 6 (1) (අ) සිට (ළ) වගන්ති යටතේ කර ඇති පත්වීම්

අ) මල්කාන්ති ජයවර්ධන මහත්මිය - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්

ආ) ෂෙහාන් සෙනවිරත්න මහතා - සාමාජික
සභාපති
ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය

ඇ) ආචාර්ය ලයනල් පින්ටෝ මහතා - සාමාජික
සභාපති
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ඈ) පී.එන්.කේ. මලලසේකර මහත්මිය - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තුමේන්තුව

ඉ) ආචාර්ය හිලරි ඊ සිල්වා මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ඊ) හේමාල් කස්තුරිආරච්චි මහතා - සාමාජික
මුදල් අමාත්‍යාංශය
මහා භාණ්ඩාගාර නියෝජිත

3.0 කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිළධාරියා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරන අතර ඔහුගේ සහාය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු, අධ්‍යක්ෂවරුන් පස් දෙනෙකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් අට දෙනෙකු ඇතුළු 96 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් මගින් 2017 වසර තුලදී කොමිෂන් සභාවේ කාර්යභාර්ය ඉටු කරන ලදී. ඒ අනුව කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ කාර්යක්ෂමව ඉටු කර ගැනීම පිණිස පහත දැක්වෙන අංශ යටතේ කටයුතු සංවිධානය කරනු ලැබ ඇත.

- පාලන හා මුදල් අංශය
- සැලසුම් හා පර්යේෂණ අංශය
- පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත අංශ
- තත්ව ආරක්ෂණ හා ඇගයුම් පැලන අංශය
- කර්මාන්ත සම්බන්ධතා අංශය
- ජාතික වෘත්තීය සුදුසකම් අංශය
- තොරතුරු පද්ධති අංශය

කළමණාකරන සේවා දෙපරේතමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව කොමිෂන් සභාව සඳහා 116 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමතව ඇතත් 2017.12.31 දිනට කාර්ය මණ්ඩලය 96 දෙනෙකුගෙන් සමන්විත විය. විස්තර පහත දක්වා ඇත.

වගුව 3.1 කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය - 2017

තනතුරු නාමය	අනුමත සංඛ්‍යාව	2016/12/31 දිනට සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව
1 අධ්‍යක්ෂ ජනරාල්	01	01
2 නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	01	00
3 අධ්‍යක්ෂ	06	04
4 අධ්‍යක්ෂ පාලන	01	01
5 ශ්‍රම වෙළඳපොල විශ්ලේෂක	01	01
6 නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ	29	25
7 නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)	01	01
8 නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක හා විමර්ශන)	01	01
9 නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු සේවා)	01	01
10 සහකාර අධ්‍යක්ෂ (නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)	01	01
11 සංඛ්‍යාලේඛඥ	01	01
12 පරිපාලන නිළධාරි	01	00
13 භාෂා පරිවර්තක (සිංහල/දෙමල/ඉංග්‍රීසි)	01	01
14 වැඩසටහන් සම්බන්ධීකරණ නිළධාරි	06	06
15 සංවර්ධන නිළධාරි	17	07
16 තොරතුරු තාක්ෂණ නිළධාරි	01	00
17 තොරතුරු තාක්ෂණ සහකාර	02	02
18 පරිගණක යෙදවුම් සහායක	06	06
19 කළමණාකරන සහකාර (I ශ්‍රේණිය/II ශ්‍රේණිය/III ශ්‍රේණිය)	17	16
20 රියදුරු (I ශ්‍රේණිය / II ශ්‍රේණිය /III ශ්‍රේණිය)	14	14
21 කාර්යාල කාර්ය සහායක	07	07
එකතුව	**116**	**96**

සහකාර අධ්‍යක්ෂ තනතුරු 04ක් සඳහා පුවත්පත් දැන්වීම් පළකර හා වෙබ් අඩවියෙහි පල කර අයදුම්පත් කැඳවන ලදී. එම ලද අයදුම්පත් වලින් සුදුසුකම්ලත් අයදුම්පත් සංඛ්‍යාව 59 ක් විය. එම සුදුසුකම් ලත් අයදුම්පත් පදනම් කර ගනිමින් 2017.12.14 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලදී. නමුත් මැතිවරණය හේතුවෙන් සියළු සම්මුඛ පරීක්ෂණ අත්හිටුවන ලදී.

සංවර්ධන නිළධාරි තනතුර සඳහා අයදුම්පත් 1086 ක් ලැබුණු අතර සුදුසුකම් ලත් අයදුම්පත් සංඛ්‍යාව 799 ක් පමණි. එම අයදුම්පත් සංඛ්‍යාව විශාල වු බැවින් විභාගයක් පවත්වා එම ලකුණු පදනම් කරගනිමින් අයදුම්කරුවන් 59 දෙනා සඳහා සම්මුඛ පරීක්ෂණයක් 2017.12.13 දින පවත්වන ලදී. නමුත් මැතිවරණය හේතුවෙන් සියළු සම්මුඛ පරීක්ෂණ අත්හිටුවන ලදී.

තොරතුරු තාක්ෂණ නිළධාරි තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්පත් සංඛ්‍යාව 04කි. එම සුදුසුකම් අයදුම්පත් සඳහා විභාගයක් පවත්වා එම ලකුණු පදනම් කරගනිමින් සම්මුඛ පරීක්ෂණයක් 2017.12.13 දින පවත්වන ලදී. අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ) හා අධ්‍යක්ෂ (කර්මාන්ත සම්බන්ධතා) තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. නමුත් මැතිවරණය හේතුවෙන් සියළු සම්මුඛ පරීක්ෂණ අත්හිටුවන ලදී.

4.0 පාලන හා මුදල් අංශය

කොමිෂන් සභාවේ කාර්යභාරය කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුකරලීමට අවශ්‍යයවන මානව හා මුල්‍ය සම්පත් කළමනාකරණය ඇතුළුව යටිතල පහසුකම් සැපයීමේ කාර්යය ඉටුකරනු ලබයි.

මානව සම්පත් කළමනාකරණයට අදාලව තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත නම් සඳහන් නිළධාරීන් 2017 වසර තුළදී කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ලදී.

4.1 2017 වසරේ පත්වීම්

නම	තනතුර	දිනය
එම්. ඉසඩ් එෆ්. සියාමා මිය	පරිවර්තක	2017.06.29
එච්.ජී. නිපුන හසංක මයා	කළමණාකරන සහකාර	2017.05.22
ඊ.ඩබ්ලිව්.ඩී. විජයංග මයා	කළමණාකරන සහකාර	2017.05.24
ඩී.කේ.ඩබ්ලිව්. ඉෂානි මිය	කළමණාකරන සහකාර	2017.05.24
ජයමිණි මධුෂා මෙනවිය	කාර්යාල කාර්යය සහායක	2017.05.24
ටී.ජී. රවිඳු රන්දික කුමාර	කාර්යාල කාර්යය සහායක	2017.08.30
කේ.ඩබ්ලිව්.ඒ. සුජානි දිල්හාරා මෙනවිය	පරිගණක යෙදවුම් සහායක	2017.08.25
වී.එන්. රම්මාවඩු මිය	තොරතුරු තාක්ෂණ සහකාර	2017.08.30

4.2 2017 වසරේ සේවයෙන් ඉල්ලා අස්වීම්

නම	තනතුර	දිනය
බී.එස් මල්ලිකාරච්චි මයා	සහකාර අධ්‍යක්ෂ	2017.06.25
එච්.කේ. තිසුරි මධුෂිකා මිය	කළමණාකරන සහකාර	2017.12.01
කේ.ඒ. ඊෂා දිප්ති මිය	සංවර්ධන නිළධාරි	2017.06.05
සනෝජා නිරෝෂනී වේරගල මයා	සංවර්ධන නිළධාරි	2017.05.05

4.3 2017 වසරේ සේවයෙන් විශ්‍රාම ගැන්වීම

නම	තනතුර	දිනය
පී.කේ. සුනිල් මයා	අධ්‍යක්ෂ	2017.03.16
පී.සී.පී. ජයතිලක මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	2017.09.29
ඩී.කේ.ඩබ්. නිමල් මයා	කාර්යාල කාර්යය සහායක	2017.12.29

4.4 2017 වර්ෂය තුල ක්‍රියාත්මක වූ වැඩ බැලීමේ/වැඩ ආවරණය කිරීමේ තනතුරු සඳහා කොමිෂන් සභාව තුලින් තේරී පත් වූ නිළධාරීන්

නම	තනතුර	දිනය
මංජුල විද්‍යානපතිරණා මයා	අධ්‍යක්ෂ(කර්මාන්ත සම්බන්ධතා)වැඩ බැලීම සඳහා	2017.03.16
ජී.ඒ.එන්.යු. ගනේපොල මයා	අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ) වැඩ ආවරණය සඳහා	2017.10.25
ඩබ්.පේ.එල්.ඒ. දමයන්ති මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ(ශ්‍රම වෙළඳපොල විශ්ලේෂණ)වැඩ ආවරණය	2016.09.09
සුමින්ද අරුණාකීර්ති මයා	පරිපාලන නිළධාරි වැඩ ආවරණය කිරීම	2016.10.06

4.5 දේශීය හා විදේශීය පුහුණු

කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වර්ධනය කිරීම පෙරදැරිව නිළධාරීන් දේශීය හා විදේශීය පුහුණුවීම් / සම්මන්ත්‍රණවලට යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දේශීය හා විදේශීය පුහුණු විමී/ සම්මන්ත්‍රණාවලට සහභාගී වු නිළධාරීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

4.5.1 දේශීය පුහුණු 2017

කාර්ය මණ්ඩලය වෙත දේශීය පුහුණු ලබාදීම පහත සඳහන් ආකාරයට සිදු කරන ලදී.

වගුව - දේශීය පුහුණු

නම	අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
පී.ඒ.එම්.යූ. ගනේපොල මයා	සැලසුම් හා පර්යේෂණ අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.බ)	Procurement capacity development training programme	SSDP	5 Days
ඒ.එස්. අමරසිංහ මිය	ගිණුම් අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)	Accounting & Financial Management for the staff of finance division of the TVET institutions	Miloda Institute	1 Day
පී.එම්.සී.පී. ගුණාතිලක මයා	තොරතුරු පද්ධති අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.බ)	Procurement capacity development training programme	SSDP	5 Days
අනුර වීරකෝන් මහතා	තොරතුරු පද්ධති අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	Lead auditor (on ISO 9001:2015)	SLSI	2 Days
එච්.පී.කේ.එන්. බණ්ඩාර මයා	සැලසුම් හා පර්යේෂණ අංශය	සහකාර අධ්‍යක්ෂ	Improving staff Contribution Towads Institutional Development	SLFI	2 Days
කේ.ඩී.එල්.පී කරුණාදාස මයා	තොරතුරු පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂ	Terms, Condition & Types of Em[loynent	NILS	2 Days
			Procurement capacity development training programme	SSDP	5 Days
ඩී.එන්.අයි.ඩී. ද සිල්වා මයා	තොරතුරු පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂ	Lead auditor (on ISO 9001:2015)	SLSI	2 Days
සී.යූ. ගුණතුංග	තොරතුරු පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂ	Communication and Negotiation Skills	NILS	2 Days

නම	අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
වපිර බණ්ඩාර මයා	ආයතන ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂ	How to Reduce Auditing Problems in Government Institutions	SDFL	2 Days
කේ.ඒ.ඩී. හසන්ති ලක්මිණි මිය	කර්මාන්ත සබඳතා අංශය	සහකාර අධ්‍යක්ෂ	How to Reduce Auditing Problems in Government Institutions	SDFL	2 Days
පී.ඩබ්.එස්. භාෂිණී මෙනවිය	සැලසුම් හා පර්යේෂණ අංශය	සහකාර අධ්‍යක්ෂ	Communication and Negotiation Skills	NILS	2 Days
බී.එස්. මල්ලිකාරච්චි මයා	ආයතන ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂ	Lead auditor (on ISO 9001:2015)	SLSI	2 Days
උපේක්ෂා උපමාලි මිය	නිපුණතා සම්මත හා ජාතික වෘත්තීය සුදුසු	සහකාර අධ්‍යක්ෂ	How to Reduce Auditing Problems in Government Institutions	SDFL	2 Days
වයි.පී.එස්. උදයකාන්ති මිය	නොරතුරු පද්ධති අංශය	වැඩසටහන් සම්බන්ධීකරණ නිළධාරී	How to Reduce Auditing Problems in Government Institutions	SDFL	2 Days
ප්‍රසංග මුතුකුමාරණ මයා	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	වැඩසටහන් සම්බන්ධීකරණ නිළධාරී	Terms, Condition & Types of Em[loynent	NILS	2 Days
ටී.ඒ.ඩබ්. මධුෂානි මෙනවිය	සැලසුම් හා පර්යේෂණ අංශය	සංවර්ධන නිළධාරී	Office Management for productivity Enhancement	NILS	3 Days
			How to Reduce Auditing Problems in Government Institutions	SDFL	2Days
			Diploma in English for Professionals	NIBM	1 Year
ඒ.එච්.එන්. සඳමාලි මෙනවිය	කර්මාන්ත සබඳතා අංශය	සංවර්ධන නිළධාරී	Office Management and financial Regulation	NILS	One Day
			Diploma in English for Professionals	NIBM	1 Year
එම්.එස්. දයාරත්න මයා	නොරතුරු පද්ධති අංශය	සංවර්ධන නිළධාරී	How to Reduce Auditing Problems in Government Institutions	SDFL	2Days

නම	අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
එල්.කේ. කොහොම්බන් මෙනවිය	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය	සංවර්ධන නිළධාරී	Lead auditor (on ISO 9001:2015)	SLSI	2Days
එච්.ඒ.ඩී.දර්ශනිකා මෙනවිය	අභ්‍යන්තර විගණක හා විමර්ෂණ අංශය	සංවර්ධන නිළධාරී	Public Sector Salary Payment Procedure	NILS	One Day
සුමින්ද අරුණාකීර්ති මයා	පාලන අංශය	කළමනාකරණ සහකාර	Duties of Human Resource Manager	NILS	One Day
එන්.ඩබ්.පී.නදීක පිවන්ත මයා	පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	වැඩසටහන් සම්බන්ධීකරණ නිළධාරී	Terms, Condition & Types of Em[loynent	NILS	2 Days
නිසංසලා දිල්රුක්ෂි විජේසේකර මිය	පාලන අංශය	කළමනාකරණ සහකාර	Office Management for Productivity Enhancement	NILS	3 Days
			Bachelor of Labour studies degree	University of Colombo	
එස්.එස්.කල්පගේ මයා	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	කළමනාකරණ සහකාර	Office Management for Productivity Enhancement	NILS	3 Days
			General Clark NVQ Certificate	NITA	
පී. කේ. හෑගොඩආරච්චි	අධ්‍යක්ෂ ජනරාල් අංශය	කළමනාකරණ සහකාර	How to Reduce auditing Problems in Government Institutions	SDFL	2 Days
පී.සී. ජනක් ද සිල්වා මයා	අභ්‍යන්තර විගණක හා විමර්ශන අංශය	කළමනාකරණ සහකාර	Role & Responsibility of Leave officer in charge	NILS	One Day
			How to Reduce auditing Problems in Government Institutions	SDFL	2 Days
බී.එල්.කේ. සන්දීපනී මෙනවිය	නීති අංශය	කළමනාකරණ සහකාර	How to Reduce auditing Problems in Government Institutions	SDFL	2 Days
ඊ.ඩබ්.ඩී. විජයංග මයා	පාලන අංශය	කළමනාකරණ සහකාර	Filining Systam	NILS	One Day

නම	අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
එච්.පී. නිපුන හසංක මයා	පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	කළමනාකරණ සහකාර	Filining Systam	NILS	One Day
එන්.ටී.කේ. දෙල්පචිත්‍ර මයා	තොරතුරු පද්ධති අංශය	තොරතුරු තාක්ෂණ සහකාර	Office Management for Productivity Enhancement	NILS	3 Days
එස්.බී. කරුණානායක මයා	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	පරිගණක යෙදවුම් සහායක	Office Management & Financial regulation	NILS	One Day
එච්.එම්.වී.එම්. හේරත් මෙනවිය	පාලන අංශය	පරිගණක යෙදවුම් සහායක	Office Management for Productivity Enhancement	NILS	3 Days
කේ.ටී. අමරසිංහ මෙනවිය	සැලසුම් හා පර්යේෂණ අංශය	පරිගණක යෙදවුම් සහායක	Diploma in English for Professionals	NIBM	1 Year
කේ.ඩබ්.ඒ. අනුරුද්ධිකා මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	පරිගණක යෙදවුම් සහායක	bachelor of Commerce Degree	USJP	
			Computer application Assistant NVQ Certificete	NITA	
සුජානි දිල්හාරා මෙනවිය	පාලන අංශය	පරිගණක යෙදවුම් සහායක	How to Reduce auditing Problems in Government Institutions	SDFL	2 Days
කේ.සිරිසේන මයා	පාලන අංශය	රියදුරු	Skill Development for Drivers	SDFL	1 Day
බී.කේ.ශ්‍රියන්ත දිනේෂ් මයා	පාලන අංශය	රියදුරු	Skill Development for Drivers	SDFL	1 Day
එස්. විජේසේකර මයා	පාලන අංශය	රියදුරු	Skill Development for Drivers	SDFL	1 Day
පී. බන්දුල මයා	පාලන අංශය	රියදුරු	Skill Development for Drivers	SDFL	1 Day
චතුර නානායක්කාර	පාලන අංශය	රියදුරු	Skill Development for Drivers	SDFL	1 Day
චම්පික වික්‍රමසිංහ	පාලන අංශය	රියදුරු	Skill Development for Drivers	SDFL	1 Day

4.5.2 විදේශීය සම්මන්ත්‍රණවලට සහභාගී වීම

2017 වර්ෂයේ දී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට ලැබූ ආරාධනා මත පහත සඳහන් සම්මන්ත්‍රණවලට සහභාගී වී ඇත.

වගුව - විදේශීය පුහුණු

නම	අංශය	තනතුර	පාඨමාලාවේ නම	රට	කාල සීමාව
ජේ.එම්.සී.එම්. ජයවර්ධන මැණිකේ මිය	අධ්‍යක්ෂ ජනරාල්	අධ්‍යක්ෂ ජනරාල්	Temasek foundation international @ 10 Asia Skills leaders form 2017	Singapoor	2017/08/21 to 2017/08/26
			2017 chaina asian vocational education and forum	China	2017/09/09 to 2017/09/13
ඩබ්.පී.එම්.පී. ප්‍රේමචන්ද්‍ර	පාලන	අධ්‍යක්ෂ	Seminar on Vocational Education Macro Policy For Developing Countries	China	2017/04/06 to 2017/04/26
එස්.යූ.කේ. රූබසිංහ මයා	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම්	අධ්‍යක්ෂ	Curriculum Development usirs DACUM Process	Mala-yasiya	2017/11/26 to 2017/12/16
වපිර පෙරේරා මයා	පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති	අධ්‍යක්ෂ	Seminar on E-commerce Training,	China	2017/06/25 to 2017/06/29
			Adb intenational forum	Pilipin	2017/12/12to 2017/12/14
මංජුල විද්‍යානපතිරණ මයා	කර්මාන්ත සබඳතා	අධ්‍යක්ෂ (වැ.ඔ)	Temasek founda-tion international @ 10 Asia Skills leaders form 2017	Singapoor	2017/08/21 to 2017/08/26
ජේ.ඒ.ඩී.ජේ. ජයලත් මයා	තොරතුරු පද්ධති	අධ්‍යක්ෂ	Conference on Skills on the move "Globel Trends Local reso-nances"	China	2017/07/03 to 2017/07/07
පී.එම්.සී.පී. ගුණාතිලක මයා	තොරතුරු පද්ධති	නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.ඔ)	Seminar on e - commerce	China	2017/06/25 to 2017/06/29
අනුර වීරකෝන් මයා	තොරතුරු පද්ධති	නියෝජ්‍ය අධ්‍යක්ෂ	Seminar For Textile Standard and Testing Officials for Developing Countries	China	2017/06/03 to 2017/06/29
ආර්.ජේ. සමරවීර මයා	අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	Seminar on Vocational Education Macro Policy For Developing Countries	China	2017/04/06 to 2017/04/26

නම	අංශය	තනතුර	පාඨමාලාවේ නම	රට	කාල සීමාව
ඩබ්.පේ.එල්.ඒ. දමයන්ති මිය	තොරතුරු පද්ධති අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.බ)	Seminar on Vocational Education for Principals of Developing Countries	China	2017/04/06 to 2017/04/26
			Macro policies,Job & inclusive Growth	Italian	2017/11/20-24
පී.ඩී.එස්. කාරියවසම් මිය	නීති අංශය	සහකාර අධ්‍යක්ෂ	Seminar on Vocational Education for Principals of Developing Countries	China	2017/04/06 to 2017/04/26
පී.පී.පී. නානායක්කාර මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.බ)	Curriculum Development usirs DACUM Process	Mala-yasiya	2017/11/26 to 2017/12/16
ඩබ්.කේ.ඩී. හරිස්චන්ද්‍ර මයා	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම්	සහකාර අධ්‍යක්ෂ	Seminar For Textile Standard and Testing Officials forDeveloping Countries	China	2017/06/03 to 2017/06/29
ටී. සෙන්තූරන් මයා	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම්	නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.බ)	Teacher Learning and peer Menitoring Programme.	Honkong	2017/06/16 To 2017/06/21
එච්.බී.අයි. සම්පත් මයා	පාලන අංශය	වැඩසටහන් සම්බන්ධීක-රන නිලධාරී	Seminar on Vocational Education Macro Policy For Developing Countries	China	2017/04/05 to 2017/04/25
නදීක පීවන්ත මයා	පාඨමාලා ලියාපදිංචි,පිළිග ැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති	වැඩසටහන් සම්බන්ධීක-රන නිලධාරී	Seminar on Vocational Education Macro Policy For Developing Countries	China	2017/04/12 to 2017/04/29
ඩී.බී.ආර්. මංජුලා	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම්	වැඩසටහන් සම්බන්ධීක-රන නිලධාරී	Seminar For Textile Standard and Testing Officials forDeveloping Countries	China	2017/06/03 to 2017/06/29
වයි.පී.එස්. උදයකාන්ති මිය	තොරතුරු පද්ධති	වැඩසටහන් සම්බන්ධීක-රන නිලධාරී	Seminar on Vocational Education for Principals of Developing Countries	China	2017/04/05 to 2017/04/26

4.5.3 වැඩිදුර අධ්‍යාපන සඳහා විදේශ පුහුණු

පහත නම් සඳහන් නිළධාරීන් දෙදෙනා වැඩිදුර අධ්‍යන කටයුතු සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් මූල්‍යාධාර ලබාගෙන වැටුප් සහිතව විදේශ ගතවී ඇත.

1. අජිත් පොල්වත්ත මහතා (ආචාර්ය උපාධියක් සඳහා චීනයට)

2. පේ.ඒ.ඩී.පේ. ජයලත් මයා (ආචාර්ය උපාධියක් සඳහා තායිලන්තයට)

ඊට අමතරව එම්.එල්.එන්.එස්. එදිරිසූරිය මහත්මිය විසින් කරුණු ඉදිරිපත් කර තේරී ඇති ආචාර්ය උපාධිය සඳහා ඇමරිකාවේ Southern Mississippi විශ්ව විද්‍යාලයට වසර තුනක වැටුප් සහිතව නිදහස් කර ඇත.

4.6 වාර්ෂික වෘත්තීය සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය

කොමිෂන් සභාවේ නිළධාරීන් වෘත්තීය ආයතනවල සාමාජික ගාස්තු ගෙවීමේ දී පහත සඳහන් නිළධාරීන් සඳහා ඔවුන්ගේ සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය කර ඇත.

1.	ඩබ්.පී.එම්.පී.ප්‍රේමචන්ද්‍ර මයා අධ්‍යක්ෂ(පාලන)	-	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික ගාස්තු
2.	එස්.යු.කේ. රුබසිංහ මයා අධ්‍යක්ෂ(පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම්)	-	ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු ආයතනය
3.	පේ.ඒ.ඩී.පේ. ජයලත් මයා අධ්‍යක්ෂ(තොරතුරු පද්ධති)	-	වරලත් පරිගණක ආයතනය - බ්‍රිතාන්‍ය

4.7 මූල්‍ය ප්‍රගතිය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මගින් ලබා දෙන ලදී.

2017 වර්ෂය සඳහා කොමිෂන් සභාව සිය වියදම් සඳහා පහත පරිදි ඇස්තමේන්තු කරන ලදී.

පුනරාවර්තන වියදම සඳහා රුපියල් මිලියන 120 කි.

ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 16.3 කි.

මෙම ප්‍රතිපාදන වලින් 2017 වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරය විසින් පහත පරිදි කොමිෂන් සභාව වෙත මුදල් නිදහස් කර තිබුණි.

පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 119.85 ක්ද, ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 13.20 ක්ද වශයෙනි.

2016 වර්ෂය සඳහා ඇස්තුමේන්තු ගත වියදම් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී පුනරාවර්තන ඇස්තමේන්තුවෙහි වෙනසක් නොවන අතර ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව 11% වැඩිවීමක් දක්නට ලැබේ.

2017 වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරය විසින් නිදහස් කර ඇති අරමුදල් පසුගිය වර්ෂය සමඟ සැසඳීමේ දී පහත පරිදි සැසඳීම් කල හැක.

පුනරාවර්තන නිදහස් කිරීම් සැසඳීමේදී 13.2% ක වැඩිවීමක් පෙන්නුම් කල අතර ප්‍රාග්ධන නිදහස් කිරීම්වල 10.6%ක වැඩිවීමක් පෙන්වන ලදී.

2017 වර්ෂයෙහි උපයන ලද ආදායම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

	ඇස්තමේන්තුගත ආදායම (රු.)	සත්‍ය ආදායම (රු.)
ආයතන ලියාපදිංචි ආදායම	1,830,000	1,475,000
ආයතන ප්‍රතිනත හා ඇගයුම්	1,770,000	1,511,000
සහතිකපත් නිකුත් කිරීම	1,630,000	1,360,000
විභාග ගාස්තු	6,300,000	8,118,000
පොත් අලෙවිය	610,000	441,000
ශිෂ්‍ය වාර්තා පොත් අලෙවිය	2,780,000	2,613,000
ඇගයුම් හා ඇගයුම් ආදායම්	380,000	423,000
මුලු ආදායම	**15,300,000**	**15,941,000**

2016 වසර හා සැසඳීමේදී 2017 වසරෙහි උපයනලද ආදායමෙහි 17% වර්ධනයක් පෙන්නුම් කෙරේ.

	ඇස්තමේන්තු ගත ආදායම(රු.)	සත්‍ය ආදායම(රු.)
වෘත්තීය පුහුණු ක්ෂෙත්‍රයේ පොත් විකිණීමෙන්	380,000.00	135,435.00
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් ශුද්ධ ආදායම	350,000.00	13,026.18
ආයතන ලියාපදිංචිකිරීමේ ගාස්තු	470,000.00	479,900.00
ආයතන ප්‍රතිනතය කිරීමේ ගාස්තු	750,000.00	730,900.00
වෙනත්	250,000.00	801,146.79
එකතුව	**2,200,000.00**	**2,160,470.97**

එය පසුගිය වර්ෂය සමග සැසඳීමේදී 10.2% ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

4.8 අභ්‍යන්තර විගණනය හා විමර්ශනය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන්ට අදාලව විගණන පරීක්ෂණ පැවැත්වීම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ඇත. පෙර වර්ෂවල දී මෙන් අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණවත් බව, චක්‍රලේඛ උපදෙස් වලට, කොමිෂන් සභා පනත හා කොමිෂන් සභාවට අදාල වන වෙනත් නීතිරීතිවලට අනුකූලවීම විමසමින් කාර්ය සාධනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන හා විමර්ශන කටයුතු විගණන සැළැස්මට අනුව ඉදිරියට ගෙන යන ලදී.

අභ්‍යන්තර විගණන හා විමර්ශන වැඩසටහන අනුව සැලසුම් කරන ලද ප්‍රධාන විගණන ප්‍රදේශ 6ක් ට ආවරණ කරන ලද අතර අභ්‍යන්තර විගණන හා විමර්ශන වැඩසටහන අනුව සැලසුම් නොකරන ලද විගණන විමර්ශනයන් ද අභ්‍යන්තර විගණනය විසින් අධ්‍යක්ෂ ජනරාල්ගේ හා විගණන හා කළමණාකරන කමිටුවේ උපදෙස් පරිදි ඉටු කරන ලදී.

විගණන හා විමර්ශන කටයුතු සහ නව ප්‍රතිපත්ති යෝජනා කිරීම හෝ වෙනස් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙන්ම විගණන හා කළමනාකරණ කමිටුව විසින් කෙරුණු අතර කොමිෂන් සභාවේ දුර්වලතා හා ඌනතා අවම මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය යෝජනා අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කිරීමට අවශ්‍ය කටයුතු අදාල වර්ෂයේ දී සිදු කරන ලදී.

1. විගණන හා කළමනාකරණ කමිටුව

2017 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටුව අවස්ථා හතරක දී රැස්වූ අතර එම අවස්ථාවලදී විගණන හා කළමනාකරණ කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ තීරණ කොමිෂන් සභාව වෙත නිර්දේශ කරන ලදී.

i අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
ii මූල්‍ය වාර්තා සමාලෝචනය හා ඒ සම්බන්ධ කළමනාකරණ තීරණ
iii වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධ කළමනාකරණ තීරණ
iv අභ්‍යන්තර විගණනයේ හා විමර්ශනයන්හි කාර්ය සාධනය
v කොමිෂන් සභාවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සමාලෝචන හා කළමනාකරණ තීරණය
vi විගණකාධිපති වාර්තා සමාලෝචන
viii අනිකුත් මෙහෙයුම් හා පාලන කාර්යයන් සම්බන්ධ විවිධ කලමනාකරණ තීරණ

මේ අනුව විගණන හා කළමනාකරණ කමිටුව මනා ලෙස ඉහත තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලදී.

මෙම කමිටු කාර්යයන් ඉටු කිරීමේදී විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

2017 ජනවාරි මස 01 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා විගණන හා කළමනාකරණ කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් යුක්ත විය.

i 2017 පෙබරවාරි 27 විගණන හා කළමනාකරණ කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් සමන්විත විය.

- හේමාල් කස්තුරිආරච්චි මයා - කමිටු සභාපති
- ආචාර්ය ඩබ්ලිව්.හිලරී ඊ සිල්වා - කමිටු සාමාජික
- ආර්.එම්.ඩී.එම්.කුමාරි - නිරීක්ෂක
- ටී.පී.අයි. පද්මිණී මහත්මිය - නිරීක්ෂක

ii 2017 ජූලි 12 විගණන හා කළමනාකරණ කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් සමන්විත විය.

- හේමාල් කස්තුරිආරච්චි මයා - කමිටු සභාපති
- ආචාර්ය ඩබ්ලිව්. හිලරී ඊ සිල්වා - කමිටු සාමාජික
- ආර්.එම්.ඩී.එම්. කුමාරි - නිරීක්ෂක
- ටී.පී.අයි. පද්මිණී මහත්මිය - නිරීක්ෂක

iii 2017 ඔක්තෝබර් 17 විගණන හා කළමනාකරණ කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් සමන්විත විය.

- හේමාල් කස්තුරිආරච්චි මයා - කමිටු සභාපති
- ආචාර්ය ඩබ්ලිව්.හිලරී ඊ සිල්වා - කමිටු සාමාජික
- බුද්ධික මඩිහහේවා මයා - කමිටු සාමාජික
- ආර්.එම්.ඩී.එම්.කුමාරි - නිරීක්ෂක
- ටී.පී.අයි. පද්මිණී මහත්මිය - නිරීක්ෂක

iv 2017 දෙසැම්බර් 29 විගණන හා කළමනාකරණ කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් සමන්විත විය.

- හේමාල් කස්තුරිආරච්චි මයා - කමිටු සභාපති
- ආචාර්ය ඩබ්ලිව්.හිලරී ඊ සිල්වා - කමිටු සාමාජික
- බුද්ධික මඩිහහේවා මයා - කමිටු සාමාජික
- ආර්.එම්.ඩී.එම්. කුමාරි - නිරීක්ෂක
- ටී.පී.අයි. පද්මිණී මහත්මිය - නිරීක්ෂක

4.9 නීති කටයුතු

පනත සංශෝධනය කිරීමේ ප්‍රගතිය

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත 1990 අංක 50 දරණ (සංශෝධන) පනත මගින් සංශෝධන වී ඇත. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ආයතන ලියාපදිංචි කිරීම විධිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන පනතට අන්තර්ගත කිරීමේ වැදගත්කම හඳුනාගැනීමෙන් පසු අදාළ පනත තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී.

නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව විසින් සකසන ලද කෙටුම්පත කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. තවද 2017 ජූලි මස නව කොමිෂන් සභාව පත්වීමෙන් අනතුරුව එම කෙටුම්පත යලිත් සංශෝධන සහිතව අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර එම කෙටුම්පත අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

ලියාපදිංචි නොවූ තෘතීයික හා වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචි කිරීමට ගන්නා ලද පියවර

කොමිෂන් සභාවේ ලියාපදිංචි වීමෙන් තොරව පවත්වා ගෙන යනු ලබන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ආයතන ලියාපදිංචි කර කොමිෂන් සභාවේ නීත්‍යානුකූල අවසරය යටතේ පවත්වාගෙන යාමට අවශ්‍ය පියවරයන් ගනු ලැබිණ. ඒ අනුව පුවත්පත් දැන්වීම් පලකරමින් ලියාපදිංචි නොකර පවත්වා ගෙන යනු ලබන ආයතන වෙත දැනුවත් කිරීමේ ලිපි යැවීම මගින් අදාළ ආයතන ලියාපදිංචිය සඳහා යොමු කරන ලද අතර මේ වන විට 2017 වසර සඳහා එවැනි ලිපි 25 ක් පමණ යවා ඇති අතර ආයතන 15 ක් පමණ මේ සඳහා යහපත් ප්‍රතිචාර දක්වා ඇත.

මූල්‍යාධාර නිසිලෙස භාවිත නොකල ආයතනයන් සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය පියවර

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 04(ඊ) හා 04(උ) වගන්තිය යටතේ පෞද්ගලික අංශයේ / රාජ්‍ය නොවන අංශයේ ආයතනයන්ට දී ඇති මූල්‍ය ප්‍රදානයන් නිසිලෙස ක්‍රියාත්මක නොකර හා පාඨමාලා ප්‍රතිපාදන නොවී පවත්වා ගෙන යනු ලබන ආයතනයක් මගින් එම ණය මුදල අයකර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීම ද සිදු කරන ලදී. එහිදී පහත සඳහන් ආයතන සමඵ මණ්ඩලයට කැඳවීම මගින් මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට පියවර ගෙන ඇත.

1. සමාධි ප්‍රජා සංවර්ධන පදනම - මාතර
2. ශ්‍රී සෝභිත වෘත්තීය පුහුණු ආයතනය - බිබිල
3. හ/ශ්‍රී කාවන්තිස්ස වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - තිස්සමහාරාමය
4. සණස තොරතුරු තාක්ෂණ හා කලමණාකරණ අධ්‍යාපන ආයතනය - කුලියාපිටිය

සමාධි ප්‍රජා සංවර්ධන පදනම හා ශ්‍රී සෝභිත වෘත්තීය පුහුණු ආයතනය සමඵ මණ්ඩල කැඳවූ අතර සහභාගී නොවිය. එසේ හෙයින් මේ වන විට සමඵ නොකිරීමේ සහතිකයක් නිකුත් කර ඇති අතර නඩු පැවරීමේ කටයුතු සඳහා නීතිපති දෙපාර්තුමේන්තුවට යොමු කරනු ලැබේ. ශ්‍රී සෝභිත වෘත්තීය පුහුණු ආයතනය වෙත එන්තරවාසි නිකුත් කිරීමෙන් අනතුරුව ඔවුන් කළ ඉල්ලීම සලකා බලා මෙම නඩුව සමඵයකට පත්කරමින් ලබා දී තිබූ භාණ්ඩ යළි කොමිෂන් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර ඇත.

විමර්ශන පැවැත්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මෙම කේෂත්‍රයේ නියාමන ආයතනය වශයෙන්, විවිධ කේෂත්‍රයන්ට අදාල පුහුණු මධ්‍යස්ථානවල සිදුවන ගැටලු සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට අදාල ආයතන, පුහුණුවන්නන් සහ ඇගයීම් නිලධාරීන් ද පෙලඹී තිබේ. එහිදී අපක්ෂපාති මැදිහත්කරුවෙකු වශයෙන් එම ගැටලු සමඵයකට පත්කිරීමත් ඊට අවශ්‍ය ඇතැම් පරීක්ෂණ පැවැත්වීමක් සිදුකරයි. ඒ අනුව 2017 වර්ෂයේ දී අදාල ආයතන පහක් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමට කටයුතු කරන ලදී.

කොමිෂන් සභා රැස්වීම පැවැත්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) සහ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද කටයුතු කරන අතර 2017 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලදී.

5.0 සැලසුම් හා පර්යේෂණ අංශය

කොමිෂන් සභාවේ සැලසුම් හා පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතෙහි පළමු අරමුණ වූ, ශ්‍රී ලංකාවේ ආර්ථික හා මානව සම්පත් සංවර්ධන අවශ්‍යතාවන් අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම සඳහා සක්‍රීය දායකත්වය ලබාදීමයි. සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම සඳහා වගකීම දරයි.

- රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම හා විමර්ශනය කිරීම
- වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම
- ශ්‍රී ලංකාවේ පළාත්බද වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්ති සකස්කිරීම හා යාවත්කාලීන කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන සම්බන්ධීකරණය හා සිදුකිරීම
- තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම හා ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම
- කොමිෂන් සභාවේ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තා සකස්කිරීම

ඉහත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් හා පර්යේෂණ අංශය කාර්යමණ්ඩල සාමාජිකයින් 08 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම අංශය අධ්‍යක්ෂකවරයෙකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, සහකාර අධ්‍යක්ෂකවරු දෙදෙනෙකු, සංවර්ධන නිළධාරීනියක, පරිගණක යෙදවුම් සහයක, කළමණාකරණ සහකාර සහ කාර්යාල කාර්ය සහයකු වනසේ සංවිධානය වී ඇත.

ඒ අනුව, සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන වැඩසටහන් 2017 වසරේදී ක්‍රියාත්මක කර ඇත.

5.1 රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම හා විමර්ශනය කිරීම.

රාජ්‍ය, පුද්ගලික අංශවල හා රාජ්‍ය නොවන සංවිධානවල පුහුණු ආයතනයන් හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය හා කාර්මික පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා ශ්‍රම වෙළෙඳපොල අදාලත්වය දියුණු කිරීම සඳහා අවශ්‍යවන පුහුණු උපකරණ ලබාදීම පිණිස කොමිෂන් සභාව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ මගින් රාජ්‍ය හා පුද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල පුහුණු පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතීතනයකර ඒ තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට හැකියාව ලැබේ.

2017 මූල්‍යාධාර වැඩසටහන සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන තුළින් අයදුම්පත්‍ර කැඳවන ලදී. ඒ අනුව, එවන ලද අයදුම්පත්‍ර අතුරින් තෝරාගන්නා ලද පුහුණු ආයතනයන් ඇගයීමට ලක්කර මූල්‍යාධාර ලබාදීමට කටයුතු කරන ලදී. 2017 වර්ෂය තුලදී රාජ්‍ය, පෞද්ගලික යන අංශයන්ට මූල්‍යාධාර ලබාදීම පිළිබඳ විස්තර අංශ අනුව පහත වගු අංක 5.1 මගින් දැක්වේ.

වගුව 5.1 ලබාදුන් මූල්‍යාධාර ආංශික ව්‍යාප්තිය - 2017

අංශය	2016 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන (රු. මිලියන)		මූල්‍යාධාර ප්‍රදානය සඳහා අනුමත පාඨමාලා සංඛ්‍යාව	ආයතන සංඛ්‍යාව	අනුමත මුදල (රු. මිලියන)
	ආරම්භක	සංශෝධිත			
රාජ්‍ය අංශය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය	2.00	2.8	06	03	2.7
එකතුව	**2.0**	**2.8**	**06**	**03**	**2.7**

මූල්‍යාධාර ප්‍රදානය පිළිබඳ විස්තර වෙන්වෙන් වශයෙන් පහත දක්වා ඇත.

5.1.1 රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතන සඳහා මූල්‍යාධාර සැපයීම

මෙම වැඩසටහනේ අරමුණ වන්නේ කොමිෂන් සභාව විසින් සකස් කරන වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් මගින් හා ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂණ මගින් හඳුනාගත් පුහුණු වැඩසටහන් රාජ්‍ය අංශයේ පුහුණු ආයතන තුළින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලට ගැනීමට මූල්‍යාධාර ලබාදීමයි. හඳුනාගත් පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතිනයකර ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමට අවකාශ සැලසීම මෙහිදී සිදුවේ. මූල්‍යාධාර ලැබූ වෘත්තීය පුහුණු ආයතන රාශියක පාඨමාලාවන් ගුණාත්මකව පවත්වාගෙන යනු ලබයි.

2017 වර්ෂයේදී නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතට අයත් කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පවත්වාගෙන යනු ලබන තෙවැයි මාසික කෙටි කාලීන පාඨමාලා ප්‍රතිනයය සඳහා අවශ්‍ය පුහුණු උපකරණ ලබා ගැනීමට මූල්‍යාධාර ප්‍රදානය කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී. මේ අනුව එම පාඨමාලාවලට අදාල අයඳුම්පත් කැඳවන ලද අතර වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු මධ්‍යස්ථාන 03 ක් සඳහා මූල්‍යාධාර ලබාදීම නිර්දේශ කරන ලදී. මෙම ආයතන මගින් පවත්වනු ලබන තෝරාගත් පාඨමාලාවලට අදාල උපකරණ සඳහා මිල අයඳුම්පත් නියමිත කාලය තුල ඉදිරිපත් නොකළ බැවින් මූල්‍යාධාර ප්‍රදානය නොකරන ලදී.

5.1.2 පුද්ගලික අංශය හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම

2016 වර්ෂයේදී පුද්ගලික අංශය හා රාජ්‍ය නොවන සංවිධානවල පුහුණු මධ්‍යස්ථාන විසින් ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා අදාලත්වය ඉහළ නැංවීම පිණිස මූල්‍යාධාර ලබාදීම සඳහා රුපියල් මිලියන 2.8 ක ප්‍රතිපාදන වෙන්වී තිබුණි (සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව). ඒ අනුව, ලැබුණු අයඳුම්පත් 52 අතුරින් තෝරාගන්නා ලද ආයතන 03 ක් භෞතික ඇගයීමට ලක්කිරීමෙන් අනතුරුව එම ආයතන 03 මූල්‍යාධාර ලබාදීම සඳහා තෝරාගන්නා ලදී. එම ආයතන සමග ගිවිසුම් අත්සන් කරන ලද අතර වෙන්කරන ලද මූල්‍යාධාර මුදල් එම ආයතන විසින් භාණ්ඩ මිලදී ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අප ආයතනයේ නිළධාරීන් පරීක්ෂා කිරීමෙන් පසුව ගෙවනු ලැබේ.

ඒ අනුව, 2017 වර්ෂයේදී සංශෝධිත ප්‍රතිපාදන වලින් 96% ක ප්‍රතිශතයක් මූල්‍යාධාර ප්‍රදානය සඳහා වෙන්කිරීමට හැකියාව ලැබුණි. පෞද්ගලික/රාජ්‍ය නොවන සංවිධාන අංශයේ එක් එක් වෘත්තීය පුහුණු ආයතන වෙත ලබාදුන් මූල්‍යාධාර ප්‍රමාණයන් පහත වගු අංක 5.2 මගින් දක්වා ඇත.

වගුව 5.2: පෞද්ගලික අංශය සහ රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර ලබාදීම - 2017

2017 වර්ෂයේදී මූල්‍යාධාර ප්‍රදානය සඳහා වෙන්කරන ලද ආයතන පිළිබඳ විස්තර

අංකය	ආයතනයේ නම	කර්මාන්ත ක්ෂේත්‍රය	පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම	අනුමත කරන ලද මුදල (රු.)
1.	දොන් බොස්කෝ වෘත්තීය පුහුණු ආයතනය - නොච්චියාගම	රෝද එකලිකරු	3 වන මට්ටම	237,650.00
		බේකරි ශිල්පී (පාන් සහ පේස්ට්‍රි)	3 වන මට්ටම	1,026,760.00
		ජලනල කාර්මික	3 වන මට්ටම	240,478.00
		වඩු කාර්මික (ගොඩනැගිලි)	3 වන මට්ටම	67,238.50
2.	දොන් බොස්කෝ වෘත්තීය පුහුණු ආයතනය - මන්නාරම	ආධුනිකයන් සඳහා වූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	3 වන මට්ටම	596,400.00
3.	දොන් බොස්කෝ වෘත්තීය පුහුණු ආයතනය මැටියාගනය	ආධුනිකයන් සඳහා වූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	3 වන මට්ටම	518,000.00
අනුමත කරන ලද මුළු මුදල				**2,686,526.50**

වගුව 5.3: කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ලබාදීම (පෞද්ගලික අංශය හා රාජ්‍ය නොවන සංවිධාන)

කර්මාන්ත ක්ෂේත්‍රය	පාඨමාලා ගණන	අනුමත කළ මුදල (රු.)	ප්‍රතිශතය(%)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	02	1,114,400.00	41.5%
හෝටල් හා සංචාරක	01	1,026,760.00	38.2%
ඉදිකිරීම්	02	307,716.50	11.5%
මෝටර් රථ කාර්මික	01	237,650.00	8.8%
එකතුව	**06**	**2,686,526.50**	**100%**

ප්‍රස්ථාරය 5.1: කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ප්‍රදානය - පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය



2017 වර්ෂය තුලදී ලබාදුන් මූල්‍යාධාර එක් එක් ක්ෂේත්‍රය අනුව එම මුදල් බෙදීගොස් ඇති ආකාරය වගු අංක 5.3 මගින් දැක්වෙන අතර ප්‍රස්ථාර අංක 5.1 මගින් එහි විශ්ලේෂණය දැක්වේ.

5.1.3 මූල්‍යාධාර විමර්ශනය කිරීමේ වැඩසටහන

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතනවලට ලබාදෙන මූල්‍යාධාර නිසිපරිදි භාවිතා කොට ඇත්දැයි විමර්ශනය කිරීම සඳහා වාර්ෂික විමර්ශන වැඩසටහනක් ක්‍රියාත්මක කරයි.

මෙම වැඩසටහන යටතේ 2014, 2015, 2016 වර්ෂයේදී කොමිෂන් සභාව මගින් මූල්‍යාධාර ලබාදුන් පුහුණු ආයතන වෙත ගොස් විමර්ශනයට ලක්කරන ලද අතර, ඒ යටතේ මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා 16 ක් පිළිබඳව විමර්ශනය සිදුකරනු ලදී.

මෙම වැඩසටහන තුලින් හඳුනාගත් පරිදි මූල්‍යාධාර ලබාදුන් පෞද්ගලික අංශයේ පාඨමාලා වලින් 73 ක් ප්‍රතිනතය වී ඇත. අනෙකුත් පාඨමාලාද ප්‍රතිනත ක්‍රියාවලියට ඇතුලත්ව අවශ්‍ය කටයුතු සිදුවෙමින් පැවැති බැව් නිරීක්ෂණය විය. රාජ්‍ය අංශයේ මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා තුලින් 64 ක් ප්‍රතිනතයවී ඇති බව නිරීක්ෂණය විය.

5.2 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම

සැලසුම් හා පර්යේෂණ අංශය වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීමෙහි නිරතව සිටී. මෙම වැඩසටහන යටතේ නව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීම මෙන්ම දැනට සකස්කර ඇති සැලසුම් යාවත්කාලීන කිරීම සිදුවේ. 2017 වර්ෂය අවසන් වනවිට වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් 21 ක් සකස්කර ඇති අතර සැලසුම් 15 ක් යාවත්කාලීන කර ඇත.

5.2.1 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් යාවත්කාලීන කිරීම

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැසුම් යාවත්කාලීන කිරීමේ වැඩසටහන යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා සැලැස්ම යාවත්කාලීන කිරීම 2015 වර්ෂයේ අවසාන කාර්තුවේදී ආරම්භ කරන ලද අතර, මෙම වාර්ථාව සකස් කිරීම මෙම වර්ෂය තුලදී අවසන් කරන ලදී.

5.2.2 වෘත්තීය පුහුණු සැලසුම් පරිවර්තනය කිරීම

උතුරු මැද පළාත සඳහා සකස් කරන ලද වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම සිංහල හා දෙමළ භාෂාවටත් වයඹ පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම දෙමළ භාෂාවටත් පරිවර්ථනය කර කොමිෂන් සභා වෙබ් අඩවියේ පලකරන ලදී. ඒ සඳහා 2017 වර්ෂය තුලදී රු. මිලියන 0.218 ක මුදලක් වැයකරන ලදී.

5.2.3. වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම්වල පැතිකඩ සකස්කිරීම

2017 වර්ෂය අවසන් වන විට දකුණ, සබරගමුව, වයඹ, නැගෙනහිර, උතුර, ඌව, මධ්‍යම සහ උතුරු මැද පළාත් සඳහා පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම්වල පැතිකඩයන් සකස්කර අවසන්කර ඇත. එමඟින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ හා ආගන්තුක සත්කාර කළමණාකරණ ක්ෂේත්‍රයේ පළාත් වශයෙන් වෘත්තීය අධ්‍යපානය හා පුහුණු සැලසුම් පිළිබඳ වැදගත් වූ තොරතුරු සාරාංශයක් ලෙස පළකිරීමට හැකි වී ඇත.

5.3 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම

සැලසුම් හා පර්යේෂණ අංශය මගින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ කවය පවත්වාගෙන යනු ලබයි (Research Cell). 2005 වර්ෂයේ සිට ආරම්භ කරන ලද පර්යේෂණ කවය මේවන විට කාර්මික හා වෘත්තීය ක්ෂේත්‍රයට වැදගත් පර්යේෂණ (රාශියක්) එළි දැක්වීම සඳහා මූල්‍යමය හා ශ්‍රම දායකත්වය ලබාදී ඇත. එමෙන්ම නිමකරන ලද පර්යේෂණ අපගේ වෙබ් අඩවිය තුල ඇතුලත්කර ඇත. 2017 වර්ෂයේදී පර්යේෂණ කවය පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

5.3.1 නව පර්යේෂණ අධ්‍යයන

2017 වර්ෂය තුලදී, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අයත් පුහුණු ආයතන තුලින් පර්යේෂණ යෝජනා කැඳවන ලදී. එම පර්යේෂණ අධ්‍යයනවල ගුණාත්මකභාවය රැකගැනීම සඳහා පර්යේෂණ කටයුතු මෙහෙයවීම හා අවශ්‍ය උපදෙස් ලබා දීම, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ කවය සහ නිපුණතා සංවර්ධන ව්‍යපෘතියේ උපදේශකවරයෙකු විසින් සිදු කරන ලදී.

ඒ අනුව, විවිධ ආයතන නියෝජනය කරමින් පර්යේෂණ යෝජනා 26 ක් පර්යේෂණ කවය වෙත ලැබුණි. එම යෝජනා නිපුණතා සංවර්ධන ව්‍යපෘතියේ උපදේශකවරයා විසින් ඇගයීමට ලක්කිරීමෙන් පසුව ක්ෂේත්‍රයට අයත් උචිත, කාලීන පර්යේෂණ අධ්‍යයන 08 ක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගන්නා ලදී. ඒ සඳහා රු. මිලියන 1.0 ක මූල්‍ය අනුග්‍රහය නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් දරනු ලැබේ. එක් එක් පර්යේෂණ අධ්‍යයනය සඳහා වෙන්කරන ලද වියදම් පහත වගු අංක 5.5 මගින් දැක්වේ.

වගුව 5.5: නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් මූල්‍ය අනුග්‍රහය දක්වන පර්යේෂණ අධ්‍යයනයන් 2017

අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2017 වර්ෂයේ දී වැයවූ මුදල (රු.)	2018 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල (රු.)
1.	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවත්වනු ලබන ඉදිකිරීම් සහ ආගන්තුක සත්කාර කළමණාකරණය පාඳක කරගත් පාඨමාලා සඳහා අඩු කාන්තා සහභාගීත්වය පිළිබඳ අධ්‍යයනය	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	210,000.00	105,000.00	105,000.00
2.	ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිපුණ ශ්‍රමිකයින්ගේ හිඟය සඳහා හේතුවන කරුණු සහ ඒවාට විසඳුම් හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනය	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	200,000.00	100,000.00	100,000.00
3.	බස්නාහිර පළාතේ වර්තමාන රැකියා වෙළෙඳපොළ තුල කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ රූපවාහිනී, ගුවන් විදුලි සහ ඒ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියාව පාඨමාලාවේ සිසුනගේ රැකියාගත පුහුණුවේ අදාලත්වය ඇගයීම පිළිබඳ අධ්‍යයනය	කාර්මික දෙපාර්තමේන්තුව	120,000.00	60,000.00	60,000.00
4.	රත්නපුර දිස්ත්‍රික්කයේ තරුණයන් අතර රැකියා විරහිත ගැටලු අවම කිරීම සඳහා කාර්මික අධ්‍යාපනයේ ඇති කාර්යභාරය පිළිබඳ අධ්‍යයනය	කාර්මික දෙපාර්තමේන්තුව	100,000.00	50,000.00	50,000.00
5.	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පාඨමාලා හදාරන සහ පාඨමාලා හැදෑරීමෙන් පසු රැකියාගත වීම පිළිබඳ පසුවිපරම් අධ්‍යයනය (නුවර, රත්නපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කතුල කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මධ්‍යස්ථාන මඟින් විසින් පවත්වාගෙන යනු ලැබූ වැඩසටහන් වලට විශේෂ අවධානයක් දෙමින් අධ්‍යයනය සිදුකරයි)	කාර්මික දෙපාර්තමේන්තුව	84,000.00	42,000.00	42,000.00
6.	ශ්‍රී ලංකාවේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ රැකියාගතභාවය ඉහළනැංවීම සඳහා ජා.වෘ.සු. 4 වන මට්ටමේ ඇගයීම්වල ඇති ඵලදායීතාවය පිළිබඳ අධ්‍යයනය කාර්මික දෙපාර්තමේන්තුව	කාර්මික දෙපාර්තමේන්තුව	80,000.00	40,000.00	40,000.00

අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2017 වර්ෂයේ දී වැයවූ මුදල (රු.)	2018 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල (රු.)
7.	ලෝහ හා මෘදු ලෝහ ඉංජිනේරු ක්ෂේත්‍රයේ වායු හා වාප පෑස්සුම් ශිල්පීන්ගේ විධිමත් වෘත්තීය අධ්‍යාපනය ශ්‍රම වෙළෙඳපොල රැකියාගතවීම කෙරෙහි බලපාන ආකාරය කොළඹ දිස්ත්‍රික්කය ඇසුරින් අධ්‍යයනය කිරීම	කාර්මික දෙපාර්තමේන්තුව	120,000.00	60,000.00	60,000.00
8.	ශ්‍රී ලංකාවේ කාර්මික අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු ආයතනයවල සේවා ගුණාත්මකභාවය පිළිබඳ සිසුන්ගේ හැඟීම ඇගයීම පිළිබඳ අධ්‍යයනය	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහ වෘත්තීය පුහුණු අධිකාරිය	120,000.00	60,000.00	60,000.00
මුළු එකතුව			1,034,000.00	**517,000.00**	**517,000.00**

2017 වර්ෂයේදී ආරම්භකල පර්යේෂණ අධ්‍යයන සඳහා රු. මිලියන 0.517 ක මුදලක් වැයවිය. ඒ අනුව, 2017 වර්ෂයේදී අනුමත ප්‍රතිපාදන වලින් 50% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි. ඉතිරි මුදල පර්යේෂණ අධ්‍යයන නිමකිරීමෙන් අනතුරුව 2018 වර්ෂයේදී ගෙවීමට නියමිතය.

5.3.2 පර්යේෂණ සමුළුව හා පර්යේෂණ වැඩමුළු පැවැත්වීම

5.3.2.1 පර්යේෂණ සමුළුව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් 05 වන පර්යේෂණ සමුළුව 2017 අගෝස්තු මස 10 වන දින පැවැත්වීමට කටයුතු කරනලදී. එහිදී පර්යේෂණ කවය විසින් 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද පර්යේෂණ අධ්‍යයන 11 ක් එළිදැක්වීම නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා අනුබද්ධ ආයතන රාශියක නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් සිදුකරන ලදී.

5.3.2.2 පර්යේෂණ වැඩමුළු

තාක්ෂණික හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු විධිමත් කිරීමේ අරමුණින් පර්යේෂණකරුවන් පුහුණු කරවීමේ වැඩමුළු 03 ක් පවත්වන ලදී. ඒ සඳහා 2017 වර්ෂයේදී රු. 128,965.00 ක මුදලක් වැයකරන ලදී.

6.0 පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ත්ව කළමනාකරණ පද්ධති අංශය

1990, අංක 20 දරණ TVEC පනතට අනුව සහ වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය උදෙසා වූ සංවර්ධන සැලැස්මට අනුව, (1995 සැප්තැම්බර් 05 වන දින) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සියළු වෘත්තීය පුහුණු ආයතන සඳහා තුන් වැදෑරුම් තත්ත්ව සුරක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබයි. ඒ අනුව,

1. වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය
2. පාඨමාලා ප්‍රතිනය - NVQ සහතික ලබාදීම සඳහා
3. තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම හා සහතිකකරණ

ඉහත කරුණු 3 ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශයේ නිලධාරීන් 09 දෙනෙකුගේ සංයුක්තියකින් සමන්විත අතර, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයකු, සහකාර අධ්‍යක්ෂවරු තිදෙනෙකු, සංවර්ධන නිලධාරියෙකු, වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරියෙකු, කළමනාකරණ සහකාරවරයෙකු, කාර්යාල කාර්යය සහාකයකයෙකු මීට ඇතුලත් වේ.

6.1 වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය

වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය නෛතික අවශ්‍යතාවක් වන අතර,රට තුල ක්‍රියාත්මකවන සියළු වෘත්තීය පුහුණු ආයතන කොමිෂන් සභාවේ ලියාපදිංචියට යටත් වියයුතුය. (ඉහත සඳහන් කරන ලද පනතට අනුව)ලියාපදිංචිය සඳහා ආයතනයන්හි අවම යටිතල පහසුකම්වල ප්‍රමාණවත්බව, පුහුණු උපකරණ, උපදේශකයන්ගේ සුදුසුකම්, පුහුණුව ලබාදීමේ ක්‍රමවේදය ,විෂය මාලාවන්හි ප්‍රමාණවත්බව, පිළිබඳ විමර්ශණය කර ඒ අනුව වර්ෂ දෙකක කාලයකට ලියාපදිංචිය ලබා තහවුරු කලයතු අතර ඉන් අනතුරුව කොමිෂන් සභාව එම ආයතන සඳහා ලියාපදිංචිය ලබාදේ.

2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කොමිෂන් සභාව 360 ආයතන ප්‍රමාණයක් පරීක්ෂා කිරීමට ඉලක්ක ගත කර ඇතිවුවත් ආයතන 719 ප්‍රමාණයක් පරීක්ෂාකරබලා ආයතන 433 සඳහාලියාපදිංචිය ලබා දී ඇත.

වගුව (i) - ආයතන ලියාපදිංචිය (නව සහ යාවත්කාලීන)

2017	ආයතන ප්‍රමාණය
ඉලක්ක ගත ප්‍රමාණය	360
ලියාපදිංචි කල ප්‍රමාණය	433

අනෙකුත් ආයතන නිර්ණායක සපුරාලීමේ අඩපාඩුකම් ඇතිබැවින් ඒ අනුව ඒවා සඳහා ලියාපදිංචිය නිර්දේශ කරනැත.

වගුව (ii) - 2017 වර්ෂයේ ලියාපදිංචි ආයතන වර්ගීකරණය පිළිබඳ දත්තයන් ද පහත දැක්වේ.

ආයතන වර්ගය	ප්‍රමාණය (නව)	ප්‍රමාණය (යාවත්කාලීන)	එකතුව
රාජ්‍ය ආයතන	15	50	
ව්‍යවස්ථාපිත හෝ සංස්ථා, මණ්ඩල	7	118	
රාජ්‍ය නොවන සංවිධාන	-	10	
පුද්ගලික	97	136	
එකතුව	119	314	433

වගුව (iii) - 2016 ට සාපේක්ෂව 2017 වර්ෂයේ නව ලියාපදිංචිය ලබා ඇති ආයතන ප්‍රමාණය,

ආයතන වර්ගය	2016	2017
රාජ්‍ය ආයතන	60	15
ව්‍යවස්ථාපිත හෝ සංස්ථා, මණ්ඩල	13	7
පුද්ගලික ආයතන	102	97
එකතුව	193	119



මීට අමතරව, ලියාපදිංචිය යාවත්කාලීන කරන ලද ආයතන ප්‍රමාණ 314 ක් වන අතර එහි විස්තර පහත වගුව (iv) අයුරු වේ.

වගුව (iv)

2017	ආයතන ප්‍රමාණය
ඉලක්ක ගත ප්‍රමාණය	400
ලියාපදිංචිය යාවත්කාලීන කල ප්‍රමාණය	314

2017 ලියාපදිංචිය යාවත්කාලීන කරන ලද ආයතනයන්හි ප්‍රමාණයන් පහත වගුව (v) දක්වා ඇත.

වගුව (v)

ආයතනය	යාවත්කාලීන වූ ප්‍රමාණය
1. රාජ්‍ය ආයතනය	50
2. ව්‍යවස්ථාපිත සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල	118
3. රාජ්‍ය නොවන ආයතන	10
4. පෞද්ගලික	136
	314

6.2 පාඨමාලා ප්‍රතීතනය - NVQ සහතික ලබා දීම සඳහා

ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව 2004 වර්ෂයේ දී හඳුන්වාදුන් අතර පාඨමාලා ප්‍රතීතනයේ මුඛ්‍ය අරමුණාවන්නේ, පාඨමාලාවන්හි තත්ත්වය නැංවීම වේ. තවද මේ සඳහා අනිවාර්යයෙන්ම ආයතනය ලියාපදිංචිය ලබාසිටිය යුතුය.

ප්‍රතීතනය ලත් පාඨමාලා පමණක් NVQ සහතික දීම සඳහා සුදුසුකම් ලබන අතර ජාතික නිපුණතා සම්මතයට අදාල නිපුණතා අඩංගු පැකේජය (Package) අනුව සකස් වූ විෂය මාලාවක් යටතේ පුහුණුව හා අධ්‍යාපනය ලබාදිය යුතුය.

පහත වගුවෙන් 2017 වර්ෂය තුල ප්‍රතිතනය ලබාගත් පාඨමාලා ප්‍රමාණය දක්වා ඇත.

වගුව (vi) - 2017

2017	ආයතන ප්‍රමාණය
අපේක්ෂිත ඉලක්කය	500
ප්‍රතිතනයකල පාඨමාලා ප්‍රමාණය	573

මෙහිදී අපේක්ෂිත ඉලක්ක අබිබවමින් පාඨමාලා ප්‍රතිතනය කිරීමට කොමිෂන් සභාවට හැකි වී ඇත.

රාජ්‍ය ආයතනයන්හි පාඨමාලා ප්‍රතිතනය 2285 දක්වා වැඩිවී ඇති අතර, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානයන්හි පාඨමාලා ප්‍රතිතනය 947 දක්වා වැඩි වී ඇත.

ඒ අනුව, පාඨමාලා 3232 ක් 2017 වර්ෂයේ අවසානෙය් දී ප්‍රතිතනය කර NVQ සුදුසුකම් ප්‍රදානය සඳහා සුදුසුකම් ලබා ඇත.

6.3. ලියාපදිංචිය ලත් වෘත්තීය පුහුණු ආයතන නිකුත් කරන ලද සහතික තහවුරු කිරීමේ ක්‍රියාවලිය

වෘත්තීය පුහණු ආයතන මගින්නිකුත් කරන ලද සහතික තහවුරුකරලීම විදේශ රැකියා බලාපොරොත්තු වන්නන් සඳහා අවශ්‍යවන අතර, මේ සඳහා විදේශකටයුතු අමාත්‍යාංශය වෙත මෙසේ තහවුරු කරන ලද ලියවිලි 2300ට වඩා ප්‍රමාණයක් නිකුත් කර ඇත. මෙහිදී අදාල වෘත්තීය පුහුණු ආයතනයේ ලියාපදිංචිය හා එහි විස්තර මෙම ලියවිල්ලේ දී සඳහන්කරනු ඇත.

තවද, රාජ්‍ය ආයතනයන් හි බඳවා ගැනීම් සඳහා ද මෙවැනි තහවුරුකරන ලද සහතික 327 ක් 2017 තුල නිකුත් කර ඇත.

6.4. වෘත්තීය පුහුණු ආයතන තුල තත්ත්ව කළමණාකරන පද්ධතිය ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය සහ සහතිකකරණය.

පහත සඳහන් වෘත්තීය පුහුණු ආයතන 76 ක් (වගුව - vii) සඳහා 2017 වර්ෂය තුල බාහිර තත්ත්ව විගණන දෙක බැගින් පවත්වා තත්ත්ව කළමණාකරන පද්ධතිය ස්ථාපනය කිරීම වෙනුවෙන් සහතික නිකුත් කරන ලදී. මෙසේ ලබාදෙන සහතික වර්ෂ තුනකට වලංගු වේ.

වගුව (vii)

වෘත්තීය පුහුණු ආයතනයේ නම		ප්‍රදානය කල දිනය	කල් ඉකුත්වීමේ දිනය
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය			
1	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - බණ්ඩාරගම	1/19/2017	1/18/2020
2	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - බිබිල	2/16/2017	2/15/2020
3	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - මොණරාගල	3/23/2017	3/22/2020
4	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - පාදුක්ක	3/23/2017	3/22/2020
5	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - කන්තලේ	3/23/2017	3/22/2020
6	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - තඹුත්තේගම	4/25/2017	4/24/2020
7	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - දික්වැල්ල	4/25/2017	4/24/2020
8	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - උරුබොක්ක	4/25/2017	4/24/2020

වෘත්තීය පුහුණු ආයතනයේ නම		ප්‍රදානය කල දිනය	කල් ඉකුත්වීමේ දිනය
9	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - රුහුණුගම	5/19/2017	5/18/2020
10	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - මොරවක	5/19/2017	5/18/2020
11	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය ඇතිමලේ	5/19/2017	5/18/2020
12	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - මඩුල්ල	5/19/2017	5/18/2020
13	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - රන්මුතුගල	5/19/2017	5/18/2020
14	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - කටුගස්තොට	5/19/2017	5/18/2020
15	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - වලාන	5/19/2017	5/18/2020
16	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - කුඹල්ගම	5/19/2017	5/18/2020
17	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - ගම්පහ	7/26/2017	7/25/2020
18	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - අකුරැස්ස	7/26/2017	7/25/2020
19	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - කළුතර උතුර	7/26/2017	7/25/2020
20	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - නුවර	8/24/2017	8/23/2020
21	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - හොන්නන්තර	8/24/2017	8/23/2020
22	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - පරමුල්ල	8/24/2017	8/23/2020
23	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - වීරවිල	10/24/2017	10/23/2020
24	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - හික්කඩුව	10/24/2017	10/23/2020
25	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය - තිරප්පනේ	11/21/2017	11/20/2020
26	දිස්ත්‍රික්ක වෘත්තීය පුහුණු ආයතනය - තංගල්ල	7/26/2017	7/25/2020
27	දිස්ත්‍රික්ක වෘත්තීය පුහුණු ආයතනය - මහරගම	8/24/2017	8/23/2020
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව			
1	කාර්මික විද්‍යාලය - වව්නියාව	4/25/2017	4/24/2020
2	කාර්මික විද්‍යාලය - දෙහිඅත්තකන්ඩිය	4/25/2017	4/24/2020
3	කාර්මික විද්‍යාලය - ත්‍රිකුණාමලය	7/26/2017	7/25/2020
4	කාර්මික විද්‍යාලය - පොළොන්නරුව	8/24/2017	8/23/2020
5	කාර්මික විද්‍යාලය - මොණරාගල	11/21/2017	11/20/2020
6	කාර්මික විද්‍යාලය - මැදගම	11/21/2017	11/20/2020
7	සී.ජී.ටී.ටී.අයි. - රත්මලාන	2/16/2017	2/15/2020
ජාතික තරුණ සේවා සභාව			
1	ජාතික තරුණ සේවා සභාව - තංගල්ල	8/24/2017	8/23/2020
කෘෂිකර්ම විද්‍යාලය			
1	ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - අනුරාධපුරය	4/25/2017	4/24/2020
විශ්වවිද්‍යාල විද්‍යායතනය			
1	විශ්වවිද්‍යාල විද්‍යායතනය - යාපනය	1/19/2017	1/18/2020
2	විශ්වවිද්‍යාල විද්‍යායතනය - අනුරාධපුරය	7/26/2017	7/25/2020
මහවැලි සංවර්ධන අධිකාරිය			
1	මහවැලි සංවර්ධන පුහුණු ආයතන - ගල්ගමුව	5/19/2017	5/18/2020
පෞද්ගලික වෘත්තීය පුහුණු ආයතන			
1	ලන්ඩන් ටෙක් සිටි විශ්ව විද්‍යාලය	9/19/2017	9/18/2020
2	ඇපියරන්ටිස් පුහුණු ආයතනය - යටිවාවෙල	10/24/2017	10/23/2020
3	සුනේත්‍රා කොණ්ඩා හා රූපලාවන්‍ය පුහුණු ඇකඩමිය - නුවර	1/19/2017	1/18/2020
4	සැලෝන් රන්මලී - බොරලැස්ගමුව	1/19/2017	1/18/2020
5	ලංකා නිපෝන් බිස්ටෙක් පෞද්ගලික ආයතනය - මහරගම	1/19/2017	1/18/2020

	වෘත්තීය පුහුණු ආයතනයේ නම	ප්‍රදානය කල දිනය	කල් ඉකුත්වීමේ දිනය
6	පිනසේන අයි.ටී.අයි - ජා ඇල	1/19/2017	1/18/2020
7	බිටාකොම් පෞද්ගලික ආයතනය - ගම්පහ	1/19/2017	1/18/2020
8	ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාලය - නාරහේන්පිට	1/19/2017	1/18/2020
9	හයි ටෙක් ලංකා - මාවතගම	1/19/2017	1/18/2020
10	ලංකා හෙද විදුහල	3/23/2017	3/22/2020
11	බිටාකොම් - මීරිගම	3/23/2017	3/22/2020
12	සෙත් සෙවණ වෘත්තීය සංවර්ධන ආයතනය	3/23/2017	3/22/2020
13	සවුත් ඒෂියන් ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතනය - නුගේගොඩ	4/25/2017	4/24/2020
14	යෙස් ඇකඩමිය සහ සැලෝන්	4/25/2017	4/24/2020
15	බාන්තා විද්‍යාලය (අයි.පී.ඇස්)	4/25/2017	4/24/2020
16	සවුත් ඒෂියන් ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතනය - නුවර	4/25/2017	4/24/2020
17	සදර්න් ලක්මා හොටල් පාසල	4/25/2017	4/24/2020
18	ඩීම්ඩ්‍රන් කලා හා රූපලාවන්‍ය පාසල	4/25/2017	4/24/2020
19	බ්‍රටිෂ් පාසල - ගල්කිස්ස	5/19/2017	5/18/2020
20	සවුත් ඒෂියන් ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතනය - රත්නපුර	5/19/2017	5/18/2020
21	සවුත් ඒෂියන් ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතනය - බණ්ඩාරවෙල	5/19/2017	5/18/2020
22	ඇම්.ඩී.පි පුහුණු ආයතනය	5/19/2017	5/18/2020
23	ඇස්.ඇම්.අයි වෘත්තීය පුහුණු ආයතනය	5/19/2017	5/18/2020
24	ප්ලාස්ටික් හා රබර් ආයතනය	5/19/2017	5/18/2020
25	බ්‍රටිෂ් පාසල - කොළඹ 06	5/19/2017	5/18/2020
26	බ්‍රටිෂ් පාසල - නුවර	5/19/2017	5/18/2020
27	බුද්ධි විශේෂ අධ්‍යාපන සංවර්ධන පදනම	5/19/2017	5/18/2020
28	ලංකා යෝග්‍යතා හා පෝෂක ආයතනය	5/19/2017	5/18/2020
29	රපුන්සල් පුද්ගලික සමාගම	5/19/2017	5/18/2020
30	වයඹ තාක්ෂණික විද්‍යාලය	7/26/2017	7/25/2020
31	ට්‍රන්ගල් ලිවින් කෙයා හෙද පුහුණු පාසල	7/26/2017	7/25/2020
32	ශීලා ප්‍රනාන්දු ඇකඩමිය	7/26/2017	7/25/2020
33	සවුත් ඒෂියන් ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතනය - කුරුණෑගල	7/26/2017	7/25/2020
34	සවුත් ඒෂියන් ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතනය - ගාල්ල	7/26/2017	7/25/2020
35	ඇගියෝ ශ්‍රී ලක් සහන සෝවා වෘත්තීය පුහුණු ආයතනය	7/26/2017	7/25/2020
36	ලයිසියම් ජාත්‍යන්තර පාසල	8/24/2017	8/23/2020
37	වෘත්තීය පරිගණක පුහුණු ආයතනය	8/24/2017	8/23/2020

මීට අමතරව තත්ත්ව කළමනාකරණ පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීම සඳහා එක්දින වැඩසටහන් 11ක් පවත්වා ඇත. මේ සඳහා වෘත්තීය පුහුණු ආයතනයන්හි නිලධාරීන් 400 ආසන්න ප්‍රමාණයක් සහභාගී වී ඇත.



6.5 ලියාපදිංචි හා ප්‍රතීතන වැඩමුළු

තවද, කොමිෂන් සභාව දින දෙකේ අභ්‍යන්තර තත්ත්ව විගණන සඳහාවූ වැඩසටහන් එකක් පවත්වා ඇත. මේ සඳහා ආයතන කාර්යය මණ්ඩලය 35 දෙනෙක් සහභාගී වී ඇත. මෙම වැඩසටහන අවසානයේ ලිඛිත පරීක්ෂණයක් ද පවත්වනු ඇත. තවද, මේ සඳහා 70% කට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීම සිදුකළ යුතුය. සාර්ථකව අවසන්කරන සහභාගීවන්හට පිළිගත් සහතිකයක් ද පිරිනැමේ.



6.6 QMS වැඩමුළු

2017 වර්ෂයේදී 04 නිලධාරීන් (Lead Auditor) ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයේ සුදුසුකම ලබා ඇත.දැනට වෘත්තීය විගණනකවරුන්ගේ අවශ්‍යතාවයක් පවතින අතර, ඒ අනුව QMS විගණන සංසදයේ විගණකවරු 29 දෙනෙකු සක්‍රීය සේවයේ සිටී. ඒ සඳහා තවත් නිලධාරීන් පුහුණු කිරීමට නියමිතය.

6.7 මෙම අංශය විසින් ක්‍රියාවට නැංවූ වෙනත් ක්‍රියාකාරකම්

නව මුහුණුවරකින් යුතු NVQ සහතිකයක් NVQ Level 5 හා 6 සඳහා හඳුන්වා දී ඇත.

A) කොමිෂන් සභාවේ ISO:9001:2015 සඳහා සහතිකය යාවත්කාලීනකර ගැනීමේ ක්‍රියාවලිය සාර්ථකවී ඇත.

B) සුදුසුකම් සම කිරීම

6.8 NVQ නොවන සුදුසුකම් NVQ 5 සහ 6 වන මට්ටම් හා සම කිරීමේ ක්‍රියාවලිය

පුහුණු ආයතන මගින් පිරනමනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් NVQ රාමුවට මෙතෙක් ඇතුලත් නොවූ වෘත්තීය පාඨමාලාවන් සඳහා සුදුසුකම් සමකිරීම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීම් ප්‍රතීත හා තත්ත්ව කළමණාකරන අංශය මගින් NVQ නොවන පාඨමාලා සඳහා NVQ සුදුසුකම් මට්ටම සම කිරීමේ කාර්යය සිදුකරනු ලබයි. මෙමගින් NVQ 5 සහ 6 වන මට්ටම් සඳහා සුදුසුකම් සහිත පුහුණු පාඨමාලා පමණක් මෙසේ සමකිරීම සිදු කරනු ලැබේ. ඒකීය වෘත්තීය සුදුසුකම් රාමුවක් ගොඩනැගීම මෙහි ප්‍රධාන අරමුණ වී ඇත.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද NVQ Circular No 5/2016 යන අංක දරණ චක්‍ර ලේඛනයට අනුව NVQ නොවන පාඨමාලා සඳහා NVQ සුදුසුකම් මට්ටම සම කිරීම සිදුකරනු ලැබේ. මෙම චක්‍ර ලේඛනට අනුව යමින් NVQ නොවන පාඨමාලා සඳහා NVQ සුදුසුකම් මට්ටම සම කිරීම සිදුකරනු ලද ආයතන සහ ඒවායේ පාඨමාලා පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	ආයතනයේ නම	පාඨමාලාවේ නම	NVQ මට්ටම
1	National Institute of Business Management - NIBM	ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලොමාව - අර්ධ කාලීන	6 වන මට්ටම
2	International College of Business & Technology (ICBT)	පරිගණක මෘදුකාංග පිළිබඳ උසස් ඩිප්ලොමාව - පූර්ණ කාලීන	6 වන මට්ටම
3	The Association of Accounting Technicians of Sri Lanka (AAT)	මූල්‍යකරණය හා ගිණුම්කරණය - පූර්ණ කාලීන	6 වන මට්ටම
4	Department of Technical Education & Training (DTET)	ප්‍රමාණ සමීක්ෂක ජාතික සහතික පත්‍ර පාඨමාලාව - පූර්ණ කාලීන	6 වන මට්ටම

C) 2017 වර්ෂය තුල කොමිෂන් සභාව ආයතන ලියාපදිංචිය පාඨමාලා ප්‍රතිනතය සහ අදාල කටයුතු තුලින් උපයා ඇති මුදල පහත අයුරු වේ.

වගුව (viii)

ලියාපදිංචි ගාස්තු ආදායම	- රු. 669,000/-
ප්‍රතිනත ගාස්තු ආදායම	- රු. 1,146,000/-
ශිෂ්‍ය වාර්තා පොත් විකිණීමෙන් (Student Record books)	- රු. 2,666,405/-
තත්ත්ව කළමනාකරණ (QMS) සහතික පත්‍ර නිකුත් කිරීම	- රු. 1,081,000/-
සුදුසුකම් සමකිරීම	- රු. 150,000/-
මුළු ආදායම	**- රු. 5,712,405/-**

මෙම මුදල භාණ්ඩාගාරයට බැර කර ඇත.

7.0 පුහුණු සම්මත, විෂයමාලා සහ ජාතික වෘත්තීය සුදුසුකම් අංශය

7.1 ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීන්ට අදාලව ජාතික නිපුණතා සම්මතයන් සහ ජාතික විෂය මාලාවන් සකස් කිරීම ප්‍රධාන අවශ්‍යතාවයකි. ඒ අනුව 2017 වසරේදී පහත සඳහන් නව ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කරන ලදුව ඒවා බලලත් කරන ලදී.

7.1.1 කර්මාන්ත කේෂ්ත්‍ර සහා මගින් යෝජනා වූ උපදෙස් මත විෂය මාලාවන්ද ඇතුලත්ව සකස් කරන ලද නව ජාතික නිපුණතා සම්මත

- තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී - 4වන මට්ටම
- ටයිල් අතුරන්නා - 3වන මට්ටම
- විදුලි කාර්මික ශිල්පී (ගෘහස්ථ) - 3වන මට්ටම
- හෝටල් ගෘහපාලනය - 4වන මට්ටම
- වෘත්තියමය සූප ශාස්ත්‍රය - 4වන මට්ටම
- ආපනශාලා සහ අවන්හල් සේවා - 4වන මට්ටම
- අමුත්තන් පිළිගැනීමේ කළමණාකරු - 4වන මට්ටම
- ලොන්ඩ්‍රි මෙහෙයුම් - 4වන මට්ටම
- බේකරි ශිල්පී (පාන් සහ පේස්ට්‍රි) - 4වන මට්ටම
- කම්බි නැවුම්කරු - 3වන මට්ටම
- කණිෂ්ඨ මෘදුකාංග සංවර්ධනකරු - 4වන මට්ටම
- උපදේශනය - 4වන මට්ටම
- සමාජ රැකවරණය - 4වන මට්ටම
- රැකවරණ මධ්‍යස්ථාන කළමණාකරණය (සාමාන්‍ය රැකවරණය) - 5 වන මට්ටම

7.1.2 සකස් කරන ලද නව ජාතික නිපුණතා සම්මත

- ගුවන් කිමිදුම් (බිම් මෙහෙයුම් නියෝජිත) - 3 වන මට්ටම
- පැරෂුට් හසුරුවන්නා - 3 වන මට්ටම

7.2. පහත සඳහන් ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා යාවත්කාලීන කිරීමෙන් අනතුරුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක කරන ලදී.

7.2.1 යාවත්කාලීන කරන ලද නිපුණතා සම්මත

- ඇඳුම් මසන්නා - 4 වන මට්ටම
- විද්‍යුත් උපකරණ තාක්ෂණ ශිල්පී - 4 වන මට්ටම
- විදුලි කාර්මික ශිල්පී - 4 වන මට්ටම

7.2.2 යාවත්කාලීන කරන ලද විෂය මාලා

- කාන්තා ඇඳුම් මසන්නා - 4 වන මට්ටම
- ඇඳුම් මසන්නා - 3 වන මට්ටම
- පිරිමි ඇඳුම් මසන්නා - 4 වන මට්ටම
- විද්‍යුත් උපකරණ තාක්ෂණ ශිල්පී - 3 වන මට්ටම
- විද්‍යුත් උපකරණ තාක්ෂණ ශිල්පී - 4 වන මට්ටම
- විදුලි කාර්මික ශිල්පී (කර්මාන්ත) - 4 වන මට්ටම
- විදුලි කාර්මික ශිල්පී (ගොඩනැගිලි) - 3 වන මට්ටම

7.3. සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා

7.3.1 විෂයමාලාවන් ද ඇතුලත් පහත සඳහන් ජාතික නිපුණතා සම්මත සිංහල භාෂාවට පරිවර්තනය කරන ලදී.

- සත්කාර සේවා ලබා දෙන්නා
- තැබෑරුම් සේවක
- බේකරි ශිල්පී
- සැපයුම් සහයක
- වැඩිහිටි රැකවරණය
- පිළිගැනීමේ සහයක
- පෑස්සුම් කාර්මික ශිල්පී (අත් ලෝහ චාප)
- ලොන්ඩ්‍රි මෙහෙයුම්
- ආපනශාලා සහා අවන්හල් සේවා
- හෝටල් ගෘහපාලනය
- අමුත්තන් පිළිගැනීමේ කළමණාකරු
- වෘත්තීමය සූප ශාස්ත්‍රය
- සමාජ රැකවරණය
- උපදේශනය

7.3.2 සිංහල භාෂාවට පරිවර්තනයකරන ලද ජාතික නිපුණතා සම්මත

- මැණික් ගල් කැපුම් ශිල්පී
- සහකාර කේෂ්ත්‍ර නිලධාරී - තේ
- ගොඩනැගිලි සේවා කාර්මික ශිල්පී
- ව්‍යාපාර සහයක
- වෑද්දුම් ශිල්පී
- පෑස්සුම් ශිල්පී
- සැලසුම් ශිල්පී

7.3.3 සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද විෂයමාලා

- කොණ්ඩා සැකසුම් ශිල්පී

7.4. පහත සඳහන් නිපුණතා සම්මත හා විෂයමාලා දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලදී.

7.4.1 දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද විෂයමාලාවන් ඇතුලත් ජාතික නිපුණතා සම්මත

- සහකාර සූපවේදී
- තැබෑරුම් සේවක
- බේකරි ශිල්පී
- ඉදිකිරීම් ශිල්පී - කොන්ක්‍රීට්
- ඉදිකිරීම් ශිල්පී - පදනම
- සැපයුම් සහයක
- වාහන බඳ අලුත්වැඩියාව
- ඩීසල් එන්ජින් කාර්මික ශිල්පී
- සමාජ රැකවරණය
- උපදේශනය
- රැකවරණ මධ්‍යස්ථාන කළමණාකරණය
- ඇඳුම් මසන්නා
- ආපනශාලා සහා අවන්හල් සේවා
- හෝටල් ගෘහ පාලනය
- අමුත්තන් පිළිගැනීමේ කළමණාකරු
- වෘත්තීයමය සූප ශාස්ත්‍රය
- ලොන්ඩ්‍රි මෙහෙයුම්

7.4.2 දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත

- කිරි ගොවිපල සහයක
- ප්‍රමාණ සමීක්ෂණ සහයක
- ගොඩනැගිලි සේවා කාර්මික ශිල්පී
- රැකවරණය සපයන්නා
- ඖෂධ සහයක
- සම්භාණ්ඩ නිෂ්පාදන ශිල්පී
- ව්‍යාපාර සහයක
- පෑස්සුම් ශිල්පී
- යතුරුපැදි කාර්මික ශිල්පී
- නියුමැටික් කාර්මික ශිල්පී

7.4.3 දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද විෂයමාලා

- ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී (අවසාන මොඩියුල දෙක)

7.5 පහත සඳහන් විෂයමාලාවන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලදී.

- ඉදිකිරීම් වැඩබිම් සුපරීක්ෂක
- යන්ත්‍ර ශිල්පී

7.6. ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලාවන්හි සුදුසුකම් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් වලට සමාන කිරීම.

7.6.1 ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලාවන් හදාරණ ලද අයදුම්කරුවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් සමාන සහතික නිකුත් කිරීම සඳහා වෘත්තීය සමාලෝචන පරීක්ෂණ සිදුකරන ලද අතර එමගින් සමත් වූවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කිරීමේ සහතික නිකුත් කරන ලදී.

පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	පැවැත්වූ වෘත්තීය සමාලෝචන සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	සමාන සහතික ලබාදුන් සංඛ්‍යාව
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු)	5 වන මට්ටම	09	35	19
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (විදුලි හා විද්‍යුත් ඉංජිනේරු)	5 වන මට්ටම	02	14	10
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (ප්‍රමාණ සමීක්ෂණ)	5 වන මට්ටම	01	08	02
කර්මාන්ත තාක්ෂණ ජාතික සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු)	5 වන මට්ටම	09	37	29

තවද පහත දක්වා ඇති සහතික පත්‍ර සඳහා ද ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කිරීමේ සහතික නිකුත් කිරීම සිදුකර ඇත.

පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	නිකුත් කරන ලද සමාන කිරීමේ සහතික සංඛ්‍යාව
තොරතුරු සන්නිවේදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	33
කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	02
ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	01
ඉංජිනේරු විද්‍යාව ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	08
ප්‍රමාණ සමීක්ෂණ ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	18

7.6.2 පළපුරුද්ද සහිත තාක්ෂණ සහතික පත්‍ර ලාභීන් 460 දෙනෙකු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව ලිපි නිකුත් කරන ලදී.

7.7 ජාතික නිපුණතා සම්මත හා විෂය මාලාවන් හි පිටපත් සැකසීම.

සකස් කර ඇති ජාතික නිපුණතා සම්මත හා ඒවායේ ලේඛන ඇතුලත් මෘදුපිටපත් සහිත CD තැටි විකිණීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. 2017 වසර තුල දී මෙම CD තැටි 939 ක් විකුණා ඇති අතර එමඟින් රු 469,500.00 ක ආදායමක් උපයා ඇත.

7.8 අන්තර් ආයතනික ජාතික වෘත්තීය සුදුසුකම් මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම.

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලූ හඳුනා ගෙන ඒවාට විසදුම් සෙවීම සාමුහික තීරණ ගැනීම නව යෝජනා ක්‍රියාත්මක කිරීම අරමුණු කර ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය ක්‍රියාත්මක කරන රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන් හි ජේෂ්ඨ නිලධාරීන් කමිටුවක් පිහිටුවා ඇත. 2017 වසර තුළ එම කමිටු රැස්වීම් 10 ක් පවත්වා ඇත.

8. තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය

8.1 හැඳින්වීම.

අප කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ ජූලි මාසයේ දී ජාතික වෘත්තීය සුදුසුකම් අංශය හා NVQ සහතිකපත් අංශය ඒකාබද්ධ කරමින් තත්ත්ව ආරක්ෂණ හා ඇගයීම් පාලන අංශය ස්ථාපනය කරන ලදී. ඒ සඳහා ආංශික නිපුණතා සංවර්ධන අරමුදලේ මූල්‍ය දායකත්වය ලබා දෙන ලදී.

ඒ අනුව අප අංශය අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂවරුන් 04, වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් 02, සංවර්ධන නිලධාරීවරයකු, කළමණාකාර සහකාරවරු 03 හා පරීගණක යෙදවුම් සහකාර 03 දෙනෙකුගෙන් සමන්විත වේ. ඒ අනුව අප අංශය මගින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

8.2 ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කරලීම හා නියාමනය කිරීම.

8.2.1 ඇගයීම් නිලධාරි සංචිතය පවත්වා ගෙන යාම.

8.2.2.1 අවශ්‍ය වන ඇගයීම් නිලධාරි ප්‍රමාණය පුරෝකථනය කිරීම.

සකසා ඇති ජාතික නිපුණතා සංඛ්‍යාවන් හා 2017 වර්ෂය අවසන් වන විටදී සංචිතයේ ලියාපදිංචි වී සිටි ඇගයීම් නිලධාරි/ නිලධාරිනියන් සංඛ්‍යාවත්, එම නිලධාරීන්ගේ භූගෝලීය පැතිරීමත්, යන කරුණු සැලකිල්ලට ගෙන අවශ්‍ය වන ප්‍රමාණයන් පිළිබඳ පුරෝකථන වාර්තාව සකස් කරන ලදි.

8.2.2.2 නිපුණතා පාදක ඇගයීම් නිලධාරි/නිලධාරිනියන් ලෙස පුහුණු කිරීම සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

නිපුණතා පාදක ඇගයීම් නිලධාරි/නිලධාරිනියන් ලෙස පත්වීම සඳහා පෞද්ගලික වශයෙන් ඉල්ලුම් කළ යුතුයි. මෙහිදී අයදුම්පත් කැඳවීම සඳහා නිශ්චිත කාල වකවානුවක් නොමැති අතර, ලැබෙන අයදුම්පත් අතරින් සුදුස්සන් තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයන් මගින් සිදු වේ.

අදාල වෘත්තීන් පිළිබඳව විශේෂඥ දැනුමින් යුත් පුද්ගලයන් මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පත්කරන අතර, එවැනි සම්මුඛ පරීක්ෂණ දින 08ක් 2017 වසර තුළ පැවැත්වීමට සැලසුම් කර සිටි නමුදු ඉල්ලුම හා අවශ්‍යතාවයන්ට අනුව එවැනි දින 22ක් ගත වූ වසර තුළ පවත්වා ඇත.

8.2.2. ඇගයීම් නිලධාරි පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වීම හා එයට පහසුකම් සැපයීම.

අදාල පුහුණු කිරීමේ වැඩසටහන් 13ක් වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයත් සමග පහත සඳහන් ලෙස පවත්වන ලදි.

	සහභාගී වූ සංඛ්‍යාව
● 85 වනකණ්ඩායම	26
● 86 වනකණ්ඩායම	32
● 87 වනකණ්ඩායම	30
● 88 වන කණ්ඩායම	20
● 89 වන කණ්ඩායම	39
● 90 වන කණ්ඩායම	35
● 91 වන කණ්ඩායම	41
● 92 වන කණ්ඩායම	20
● 93 වන කණ්ඩායම	23
● 94 වන කණ්ඩායම	19
● 95 වනකණ්ඩායම	39
● 96 වනකණ්ඩායම	35
ඇගයීම් සංචිතයට අළුතින් ඇතුළත් වූ සංඛ්‍යාව	268

8.2.3. ඇගයීම්කරුවන් වෙත බලපත්‍ර ලබා දීම

අදාළ ලිඛිත විභාගයකින් අනතුරුව එම විභාගය සමත්වන්නන් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයට අනුව අදාළ ඇගයීම් නිලධාරි/නිලධාරිනියන්ට බලපත්‍ර ලබා දීමට කටයුතු කෙරේ. එම ලිඛිත විභාගය 2018 වසරේදි කිරීමට සැලසුම් කර ඇත. වලංගුතාවය අවසන් වූ බලපත්‍ර අළුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.

8.2.4 නිපුණතා පාදක ඇගයීම් කටයුතු පසු විපරම් කිරීම.

මෙය යටතේ කාර්යයන් 03ක් පහත සඳහන් පරිදි සිදු කෙරේ.

- පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.
- රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල/ආයතනවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

8.2.5 පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල නිපුණතා පාදක ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල/ මධ්‍යස්ථානවල ප්‍රතීතනය කර ඇති පාඨමාලාවන් අවසානයේ එම පාඨමාලා හදාරනු ලැබ තිබූ ආධුනික/ ආධුනිකාවන් ඇගයීමට ලක්කොට නිපුණතාවය ලබා ඇති ආධුනික/ ආධුනිකාවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් පිරිනැමේ.

එහිදී අදාළ නිර්ණායකයන් පරීක්ෂා කොට ඒවා සපුරන ලද අවස්ථාවන්හී දී කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඇගයීම් සංචිතයේ සිටින ඇගයීම් කරුවන් පත්කොට ඔවුන් ලවා ඇගයීම් කටයුතු සංවිධානය කල යුතුය. විවිධ පුහුණු මධ්‍යස්ථාන/ ආයතන විසින් 2017 වසර තුළ ඇගයීම් සඳහා කෙරුණ ඉල්ලීම් ප්‍රමාණය 839කි. 2017 වසරේ ඉලක්කය 550 වුවද එම ඉලක්කය ඉක්ම වූ මෙම ඉල්ලීම් ප්‍රමාණයට හේතුව වූයේ පෞද්ගලික අංශය තුළ මෙම ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය බෙහෙවින් ජනප්‍රිය තත්වයකට පත්ව තිබීම යැයි අනුමාන කල හැක. ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 අ.පො.ස. (සා.පෙ.) මට්ටම 4 අ.පො.ස. (උ.පෙ.) සමාන කිරීමද හේතු වන්නට ඇත.

8.2.6. රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල/ ආයතනවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.

රාජ්‍ය අංශයට අයත් පුහුණු ආයතනවල/ මධ්‍යස්ථානවල ඇගයීම් කටයුතු සඳහාද ඇගයීම් පැවැත්වීම සඳහාද අනුමැතිය ලබා දීමේ කාර්යය කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ සහ ඇගයීම් අංශය විසින් ඉටු කරන ලදි. එවැනි අනුමත ලබා දීම් ගත වූ වසර තුළ 2597 ක් ඉටු කරන ලද අතර, එම ඉල්ලීම් ඉදිරිපත් වූයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අයත් මෙන්ම ඊට පරිභාහිරව පිහිටන ලද රාජ්‍ය අංශයට අයත් පහත සඳහන් පුහුණු මධ්‍යස්ථාන/ ආයතනවලින් වේ.

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අයත් ආයතන/ පුහුණු මධ්‍යස්ථානයන්.

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
- සාගර විශ්ව විද්‍යාලය
- ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශයට අයත් නොවන රාජ්‍ය ආයතන.

- ජාතික තරුණ සේවා සභාව
- ශ්‍රී ලංකා යොවුන් බලකාය
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- සමාජ සේවා දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- ශ්‍රී ලංකා නාවුක හමුදාව

කෙසේ වෙතත් රාජ්‍ය ආයතන/ පුහුණු මධ්‍යස්ථාන තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් පිරිනැමීම සඳහා වන ඇගයීම් සඳහා ගත වූ වසර තුළ දැඩි ඉල්ලුමක් පැවති බවක් දක්නට ඇති අතර, එය ඉලක්ක කළ ප්‍රමාණයට වඩා ඉහළ යාමක් වේ. මෙවැනි අනුමත කිරීම් 2500ක් ගත වූ වසරේ ඉලක්කය වූ අතර, සත්‍ය ලෙසම එවැනි ඉල්ලීම් 2597ක් ගත වූ වසර තුළ ලබා දී ඇත.

මෙසේ වීමට පහත සඳහන් කරුණු හේතුවන්නට ඇතැයි අනුමාන කළ හැක.

- විදේශ රැකියා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම පිළි ගැනීම.
- රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය විසින් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු ආයතන සඳහා පුද්ගලයින් බඳවා ගැනීමේදී හා උසස් වීම් ලබා දීමේ දී ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය භාවිත කරන ලෙස අදාල ආයතනයන් වෙත රාජ්‍ය පරිපාලන අංශය මගින් දැනුම් දීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රම ක්‍රමයෙන් සමාජය තුළ ප්‍රචලිත වීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 අ.පො.ස. (සා.පෙ.) ටත් මට්ටම 4 අ.පො.ස. (උ.පෙ.) ටත් සමාන කිරීම

නිපුණතා පාදක පුහුණු පාඨමාලා තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රධානය කරන අතිරේකව අතර තවත් එක් ක්‍රමයකට එම සුදුසුකම් ලබා දේ. කර්මාන්තය තුළ වෘත්තීන්හි නියැලි අත්දැකීම් ලබා ඇති පුද්ගලයන්ට පාඨමාලාවක් හැදෑරීමට අපහසු නිසා NVQ සුදුසුකම සඳහා ඉල්ලුම් කළ හැකි අතර, අත්දැකීම් ලබා ඇති පුද්ගලයන්ගේ නිපුණතාවය ඇගයීම කර NVQ සහතිකය ලබා දෙනු ලැබේ. එම ක්‍රමය පෙර දැනුම හැඳිනීමේ ක්‍රමය (RPL) ලෙස හැඳින්වේ.

එම ක්‍රමය තුළින් ජාතික වෘත්තීය සුදුසුකම ලබා දීමට පහත සඳහන් රාජ්‍ය ආයතන 3කට බලය පවරා ඇත.

එම ආයතන 03 වන්නේ,

- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

8.2.7. පෙර දැනුම් ක්‍රමය පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවතීම.

වරින් වර ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. එමෙන්ම මෙහෙයුම් කමිටු රැස්වීම් වලදී ''විභාග මණ්ඩල රැස්වීම් වලදීද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සහ වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ පෙර දැනුම හැඳින්වීම ක්‍රමය පිළිබඳ ගැටළු හා අභියෝග පිළිබඳව එම නිලධාරීන් සමඟ සාකච්ඡා පැවති අතර, ඊට අතිරේකව විදේශ සේවා නියුක්ති කාර්යංශයේ නිලධාරි/නිලධාරිනියන් සමඟ රැස්වීම් වාරයක් පවත්වන ලදී. එම කාර්යංශය තුළින් ''ගෘහස්ථ ගෘහ පාලිකා'' තනතුර සහ ''සාත්තු සහායක'' සඳහා විදේශ ගතවන්නන් හට විශේෂ පුහුණු පාඨමාලා දිවයින පුරා පිහිටි එම කාර්යංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වේ. එම පාඨමාලාවලින් අවසාන ඇගයීම් පවත්වා ඔවුන්හට ජාතික වෘත්තීය සුදුසුකම් ලබා දේ.

8.3. නිපුණතා පාදක ඇගයීම් වල සංඝතභාවය (Consistency) තහවුරු කිරීම.

8.3.1. සංඝතභාවය තහවුරු කරලිමේ හා ඇගයීම් නිලධාරි/ නිලධාරිනියන්ගේ අදාල දැනුම යාවත්කාලීන කිරීමේ වැඩමුළු පැවැත්වීම.

ඉහත සඳහන් කරන ලද අභිමතාර්ථය සපුරා ගැනිමේ අරමුණින් වැඩ මුළු 5 ක් වසර තුල පැවැත්වීමට සැලසුම් කරන ලදී.. මෙම නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය ආරම්භ කරන ලද්දේ 2005 වසරේ දී වන අතර ඒ පිලිබඳව ඇගයීම් කරුවන් පුහුණු කිරීම අරඹා ඇත්තේ ද එම වසරේදීම වේ. එම වැඩමුළුවලදී නිලධාරි/ නිලධාරිනියන්ගේ ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව සහ ක්ෂේත්‍ර දැනුම යාවත්කාලීන කරන ලදී.

8.3.2. රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වෙන නිපුණතා පාදක ඇගයීම් කටයුතු අධීක්ෂණය කිරීම.

ගත වු වසර තුල රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල පවත්වන ලද නිපුණතා පාදක ඇගයීම් 97 ක ඇගයීම් ක්‍රියාවලිය මෙම අංශය විසින් අධීක්ෂණය කරන ලදී. එම අධීක්ෂණවලින් පසු NVQ වක්‍රලේඛණ අංක 2017/1 අනුව සහ ඉහල කළමණාකාරීත්වයේ උපදෙස් මත ඇගයීම් නිලධාරි/ නිලධාරිනියන් ඇගයීම් ක්‍රියාවලියට පටහැනිව කටයුතු කළ අවස්ථාවල අදාළ තීරණ ගන්නා ලදී.

8.4 පැමිණිලි විභාග කිරීම

ගතවු වසර තුල ඇගයීම් පිළිබඳ ලැබූ ලිඛිත පැමිණිලි විභාග කිරීම සඳහා නීති නිළධාරිනිය වෙත යොමු කරන ලදී.

8.5. පොදු ලිඛිත විභාගය පැවැත්වීම

8.5.1. ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 3 හා 04 ප්‍රදානය කිරීම සඳහා පොදු ලිඛිත විභාගය පැවැත්වීම.

රූපලාවන්‍ය, කේෂාලංකරණ, පෙර පාසල් ගුරු, සැලසුම් ශිල්පී, විදුලි ශිල්පී, මෝටර් රථ කාර්මික ශිල්පී සහ ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පී යන වෘත්තීය ක්ෂේත්‍රයන්හි පොදු ලිඛිත විභාග පවත්වන ලදී.

ක්ෂේත්‍රය	ජනවාරි	ජූලි
රූපලාවන්‍ය	1743	2432
කේෂාලංකරණ	1617	2003
පෙර පාසල් ගුරු	-	130
සැලසුම් ශිල්පී	-	255
විදුලි ශිල්පී	-	2018 ජනවාරි මස පවත්වන ලදී
මෝටර් රථ කාර්මික ශිල්පී	-	
ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පී	-	

ඉහත සඳහන් වන පාඨමාලාවල (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 3 හා 4) ලිඛිත පරීක්ෂණය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2017 ජනවාරි සහ ජූලි මාසවල පවත්වන ලදී.

8.5.2. ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 ලිඛිත විභාගයන් පැවැත්වීම

ගත වූ වසර තුල අයදුම්පත් කැඳවා ICT, Quantity Surveying, Construction Technology, Cosmetology, Agriculture Production Technology, Mecatronic Technology, Ref & AC Technology යන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 පාඨමාලාවල පොදු ලිඛිත විභාගය 2017 වසර තුල ආයතනවල ඉල්ලීම මත පවත්වන ලදි.

8.6 ඇගයීම් නිලධාරීන් වෙත ගෙවීම

අප අමාත්‍යංශය යටතේ එන පහත සඳහන් ආයතනයන්හි පවත්වන ලද ඇගයීම් සඳහා සහභාගි වූ ඇගයීම් නිලධාරි/ නිලධාරිනියන්ගේ දිමනා හා ගමන් ගාස්තු අප කොමිෂන් සභාව විසින් ගෙවීම සඳහා කටයුතු කරන ලදි.

1. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (නිපුණතා පාදක පාඨමාලා සඳහා)
2. ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය (නිපුණතා පාදක පාඨමාලා සඳහා)
3. ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (නිපුණතා පාදක සහ ආයතන ගත පුහුණු පාඨමාලා සඳහා)

මෙම ශීර්ෂය යටතේ ඇගයීම් නිලධාරීන්ගේ වවුචර්පත් 4987 ක දිමනා ඇගයීම් ඒකකය විසින් සහතික කොට ගිණුම් අංශයට ඉදිරිපත් කරන ලදි. එම වවුචර් පත් වල මුළු වටිනාකම 23,50,000ක් විය.

8.7. ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නිකුත් කිරීම

8.7.1. ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නිකුත් කිරීම

2017 වසර තුළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහතිකපත් 65212 ක්නිකුත් කර ඇති අතර ඒ පිලිබඳ විස්තර පහත දැක්වේ.

වගුව 8.7.1 2017 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත්ලාභීන් (ආයතන අනුව)

ආයතනය	සහතිකපත් ලාභීන්			සහතිකපත් ප්‍රමාණය		
	නිපුණතා පාදක ඇගයීම් පදනම මගින්	පෙර දැනුම ඇගයීම් පදනම මගින්	මුළු සහතික ලාභීන්	නිපුණතා පාදක ඇගයීම් මගින් නිකුත්කල සහතික	පෙර දැනුම ඇගයීම් අනුව නිකුත්කල සහතික	මුළු සහතික ප්‍රමාණය
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	5314	1	5315	6103	1	6104
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	2290 733	4908	7926	2487 832	5479	8798
වෘත්තීය පුහුණු අධිකාරිය	18698	1348	20030	22093	1797	23890
ජාතික තරුණාසේවා සභාව	1091	-	1091	1219	-	1219
පෞද්ගලික අංශය	22922	-	22922	25201	-	25201
එකතුව	**50315 733**	**6257**	**57305**	**57103 832**	**7277**	**65212**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

වගුව 8.7.2 න් 2017 වර්ෂය සඳහා 2016 වර්ෂයේ නිකුත් කර ඇති සහතිකපත් 65212 ඒ ඒ ආයතන වලින් පහත පරිදි NVQ 1 සිට NVQ 6 දක්වා මට්ටම් වලට නිකුත්කර ඇත.

වගුව 8.7.2

ආයතනය	Level 1	Level 2	Level 3	Level 4	Level 5	Level 6	මුළු සහතික ප්‍රමාණය
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	4	1057	4593	3144	0	0	8798
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	52	476	2640	2347	558	31	6104
ජාතික තරුණසේවා සභාව	0	211	486	522	0	0	1219
වෘත්තීය පුහුණු අධිකාරිය	372	2182	14129	6876	331	0	23890
පෞද්ගලික අංශය	10919	1070	10166	2477	299	270	25201
එකතුව	**11347**	**4996**	**32014**	**15366**	**1188**	**301**	**65212**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2017 වර්ෂයේදී පුහුණු ආයතන විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව) වගුව 8.7.3 හි දැක්වේ.

වගුව 8.7.3 2017 වර්ෂය සඳහා නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත්‍ර ප්‍රමාණය (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව)

ආයතනය	පුරුෂ	එකතුව	ස්ත්‍රී	එකතුව
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	4504	6104	1600	6104
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	5955	8798	2843	8798
වෘත්තීය පුහුණු අධිකාරිය	15294	23890	8596	23890
ජාතික තරුණ සේවා සභාව	451	1219	768	1219
පෞද්ගලික අංශය	13226	25201	11975	25201
එකතුව	**39430**	**65212**	**25782**	**65212**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2017 වසර සඳහා සහතිකපත් 1095ක් නැවත මුද්‍රණය කරන ලදී. ඒ පිළිබඳ විස්තර වගු අංක 8.7.4 දැක්වේ.

වගුව 8.7.4 නැවත මුද්‍රණය කරන ලද සහතික පත්‍ර පිළිබඳ විස්තර - 2016

සහතික වර්ගය	සහතික පත්‍ර ප්‍රමාණය
මුද්‍රණ දෝෂ හේතු කොටගෙන නැවත මුද්‍රණය කරන ලද සහතිකපත්‍ර	1095
අස්ථානගත වූ සහතික වෙනුවට අනු පිටපත් මුද්‍රණය	61
එකතුව	**1156**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

පහත වගු අංක 8.7.5 මගින් 2017 වර්ෂයේ නිකුත්කල NVQ සහතික පෙර වර්ෂය 2016 සමඟ සැසඳීමක් දැක්වේ.

වගුව 8.7.5 2016 හා 2017 වර්ෂ වලදී නිකුත් කල ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ප්‍රමාණය අතර සංසන්දනයක් (පෙර දැනුම ඇගයුම හා නිපුණතා පාදක ඇගයීම මගින්)

සහතික වර්ගය	2016	2017	වර්ධනය (සහතිකපත් ප්‍රමාණය)	වර්ධනය ප්‍රතිශතයක් ලෙස %
නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය	37 987	57103	19116	50.3
පෙර දැනුම ඇගයීම් ක්‍රමය	9030	7277	(1753)	-19.4

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2006 වර්ෂයේ සිට මුද්‍රණය කරන ලද සහතික පිළිබඳ විස්තර වගු අංක 7.14.6 හි දැක්වේ.

වගුව 8.7.6 2006 සිට 2017 දක්වා මුද්‍රණය කරන ලද මුළු සහතික පත්‍ර ප්‍රමාණය

වර්ෂය	සහතිකපත්‍ර සංඛ්‍යාව
2006	259
2007	1,629
2008	8,915
2009	11,249
2010	13,256
2011	16,572
2012	18,111
2013	22,855
2014	28,546
2015	44,148
2016	47,017
2017	65212
එකතුව	**277769**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය



තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ආරම්භයේ සිට 2016 වර්ෂය අවසාන වන විට සහතිකපත් 277769 ක් නිකුත්කර ඇත.

9.0 කර්මාන්ත සබඳතා අංශය

9.1 පසුබිම

කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය කරන නිපුණතාවයෙන් හෙබි පුද්ගලයන් බිහි කිරීම වෘත්තීය අධ්‍යාපන හා කාර්මික ක්ෂේත්‍රයේ මූලික පරමාර්ථයයි. විරින්වර වෙනස්වන කර්මාන්තයන්ට අනුකූලව වෘත්තීය අධ්‍යාපන හා කාර්මික ක්ෂේත්‍රය ඒ හා සමානව වෙනස් වීම ඕනෑම රටක ආර්ථික තත්ත්වය වෙනස් වීම උදෙසා බලපාන්නකි. අනෙකුත් රටවල් හා සසඳා බලන කල කාර්මික ක්ෂේත්‍රයේ එම වෙනස්වීම කාර්මික අධ්‍යාපන හා කාර්මික පුහුණු ක්ෂේත්‍රය තුළ ස්ථාපිත කිරීමෙහි වගකීමද පවතනුයේ කර්මාන්ත ක්ෂේත්‍රයේමය.

ඒ අනුව 2016 වර්ෂයේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි කර්මාන්ත සබඳතා අංශය නමින් වෙනම අංශයක් බිහි වීම තුළින් සෘජුව කර්මාන්ත ක්ෂේත්‍රය හා සවිමත් වෙමින් කාර්මික අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම මේ වනවිට සැළකිය යුතු මට්ටමින් වැඩිදියුණු වී ඇත.

ඒ අනුව කර්මාන්ත සබඳතා අංශය මගින් ආංශික නිපුණතා සභාවන් ත්‍රිත්වයක් ඉතා ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට හැකි වූ අතර එහිදී වෘත්තීය කාර්මික ක්ෂේත්‍රයට වඩාත් ඵලදායී සේවාවන් ඉටු කරගත හැකි විය.

එමෙන්ම සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාවද නොයෙක්වර ක්‍රියාත්මක මට්ටමට ගෙන ඒමට අවශ්‍ය පියවර ගත්තද ඒ සඳහා විවිධාකාරයේ ගැටළු උද්ගත වීම හේතු කොටගෙන එම නිපුණතා සභාව මේ වන විට අක්‍රීය මට්ටමක පවතී.

9.2 කර්මාන්ත සබඳතා අංශයේ අරමුණු

කර්මාන්තයට අවශ්‍ය කෙරෙන නිපුණතාවයන්ගෙන් හෙබි මානව ශ්‍රමය සැපයීමට හැකි කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයක් ඇති කිරීම කර්මාන්ත සබඳතා අංශයේ ප්‍රධාන අරමුණ ලෙස හැඳින්විය හැක. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් වන උප අරමුණු ක්‍රියාවට නැංවීම කර්මාන්ත සබඳතා අංශයේ වගකීම ලෙස හැඳින්විය හැක.

- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු කිරීම සඳහා භාවිත වන නිපුණතා සම්මත හා පුහුණු පාඨමාලා සංවර්ධනය සඳහා කර්මාන්තයේ දායකත්වය ලබා ගැනීම.
- කර්මාන්තයේ සිදුවන තාක්ෂණික වෙනස්කම් හා නව ප්‍රවණතාවයන් පිළිබඳව කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු කිරීම් කටයුතුවල නියැලෙන අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා ඒ සම්බන්ධව පුහුණුවීම් අවශ්‍ය වෙනොත් ලබා දීම.
- දැනට ලබාදෙනු ලබන වෘත්තීය පුහුණුවත් කර්මාන්තයේ ඉල්ලුමත් අතර නිපුණතා පරතරයන් ඇති දැයි විමසා බැලීම හා එකී හඳුනාගත් ඌණතාවයන් වෙනොත් ඒවා මඟ හැර ගැනීමට කටයුතු කිරීම.
- කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණුව ලබන ආධුනික ආධුනිකාවන් උදෙසා කර්මාන්ත ආශ්‍රිත පුහුණුව ලබා දීම සම්බන්ධීකරණය කොට එම ක්‍රියාවලියට සහය දැක්වීම.
- කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණුව අවසන් කරන ආධුනික ආධුනිකාවන් කර්මාන්තයේ පවතින රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධීකරණය කොට ඔවුන් හට රැකියා සොයා ගැනීමට සහය දැක්වීම.
- විධිමත් පුහුණුවකින් තොර කර්මාන්තයේ නියුතු ශිල්පීන් හට සුදුසුකම් සහතික ලබා දීම සඳහා ඔවුන් දැනුවත් කිරීම හා වෘත්තීය ගමන් මඟේ ඉහලට යාම සඳහා ඔවුන් සූදානම් කිරීම.
- කර්මාන්තයන් හා ඒවායෙහි රැකියා පිළිබඳව සමාජයේ සුබවාදී ප්‍රතිරූපයක් ඇති කිරීම.
- පාසල් හැරයන සිසු සිසුවියන් සඳහා කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව පිළිබඳව දැනුවත් කොට ඔවුන් මෙම කාර්මික පුහුණු ක්ෂේත්‍රය වෙත ආකර්ශනය කර ගැනීම.

9.3 කාර්ය භාරය

ඉහත දක්වන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීමේ පරමාර්ථයෙන් පහත සඳහන් වන කාර්යයන් කර්මාන්ත සබඳතා අංශය විසින් ගත වූ 2017 වසර තුළ ඉටු කර ඇත.

9: 3: 1 ජාතික නිපුණතා සම්මතයන් හා විෂය මාලා අලුතින් සංවර්ධනය කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා ආංශික නිපුණතා සභාවලට අත්තිකාරම් මුදල් ලබා දීම.

9: 3: 2 ආංශික නිපුණතා සභාවන් හා වෘත්තීය පුහුණු ආයතනයන්හි වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුවන්නන් හට කර්මාන්තගත පුහුණුව සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

9: 3: 3 ආංශික නිපුණතා සභාවන් සමඟ සම්බන්ධ වෙමින් කර්මාන්තයන්ගේ තොරතුරු එක්රැස් කර ශ්‍රම වෙළඳපොල තොරතුරු වාර්තා සකස් කිරීම සඳහා අප කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශය සමඟ කටයුතු කිරීම.

9: 3: 4 සිසුන්ව රැකියාගත වීම සඳහා පහසුකම් සැලසීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙහි දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

9: 3: 5 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලෙන උපදේශකවරුන් හට ආංශික නිපුණතා සභාවන් සමඟ සම්බන්ධීකරණය වෙමින් පුහුණු සැසි පැවැත්වීම.

9: 3: 6 ආංශික නිපුණතා සභා කාර්යාල පවත්වාගෙන යාම සඳහා එනම් ක්‍රියාකාරිත්වයෙහි තබා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය අත්තිකාරම් ලබා දීම.

9: 3: 7 ආංශික නිපුණතා සභාවන් වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

9: 3: 8 දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හා ආංශික නිපුණතා සභා සමඟ සම්බන්ධවෙමින් පළාත් මට්ටමින් පාසල් සිසුන් සඳහා වැඩමුළු පැවැත්වීම.

9: 3: 9 දිස්ත්‍රික වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ඇගයීම් කමිටුවක් මගින් අධීක්ෂණය හා ඇගයීම් කටයුතු සිදු කිරීම.

9: 3: 10 කර්මාන්ත සබඳතා අංශයෙහි දායකත්වයෙන් වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

9: 3: 11 Touch your Future 2017 නිපුණතා තරඟාවලිය පැවැත්වීම.

9: 3: 12 විශේෂ ක්‍රියාකාරකම්/යොවුන් පුරය වැඩසටහන් පැවැත්වීම.

9:3:1 ජාතික නිපුණතා සම්මතයන් හා විෂය මාලා අලුතින් සංවර්ධනය කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා ආංශික නිපුණතා සභාවලට අත්තිකාරම් මුදල් ලබා දීම. (B, 13)

★ **ඉදිකිරීම් ආංශික නිපුණතා සභාව මගින් ජාතික නිපුණතා සම්මත/විෂය මාලා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 සඳහා කෙටි කාලීන පාඨමාලා 7 ක් සකස් කිරීම.**

- Construction Craftsman (Mason)
- Construction Craftsman (Concreating)
- Tile Installer
- Bar Bender
- Plumber
- Wood Craftsman (Building)
- Painter (Building)

- **ජාතික නිපුණතා සම්මතයන් 22 ක් ඒවාට අදාල ඇඟයීම් සම්පත් යාවත්කාලීන කිරීම**

1. Bar Bender
2. Construction Site Supervisor
3. Construction Craftsman (Masonry)
4. Draftsperson
5. Industrial Plumber
6. Plumber
7. Wood Craftsman (Building)
8. Crane Operator
9. Building Service Technician
10. Construction Equipment Mechanic
11. Construction Equipment Operator
12. Multi Skilled Construction Craftsman
13. Road Construction Craftsman
14. Road Construction Site Equipment Operator
15. Scaffolder
16. Tile Installer
17. Painter (Building)
18. Laboratory Assistant for Construction Sector.
19. Survey Field Assistant
20. Assistant Quantity Surveyor
21. Elevator Technician
22. Occupational Safety and Health Officer

★ **තොරතුරු තාක්ෂණ ආංශික නිපුණතා සහාව මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් 3 මට්ටමේ ජාතික නිපුණතා සම්මත/විෂය මාලා 01 ක් සංවර්ධනය කරන ලදී. (F 12)**

- ICT for Biginners ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 3 සඳහා සකස් කරන ලදී.

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 4 සඳහා විෂය මාලා 3 ක් පහත අයුරින් සකස් කරන ලදී.

- IT Support
- Associate Software Developer
- Associate Creative Designer

★ **නිෂ්පාදන හා ඉංජිනේරු ආංශික නිපුණතා සභාව මඟින් ජාතික නිපුණතා සම්මත/විෂය මාලා 8 සංවර්ධනය කර ඇත. (F 12)**

1. Tractor Operator
2. Harvest Operator
3. Electrician
4. Maintanance Technician
5. Dry Rubber Machine Operator
6. Hydrolic and Pneumatic Technician
7. Technician Pharmaceutical
8. Manufacturing Maintanance Technician

ජාතික නිපුණතා සම්මත/විෂය මාලා 3 ක් යාවත්කාලීන කර ඇත.

1. Electrician
2. Welder
3. Plastic Processing Machine Operator

9:3:2 නිපුණතා ආංශික සභාවන් හා වෘත්තීය පුහුණු ආයතනයන්හි වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුවන්නන් හට කර්මාන්තගත පුහුණුව සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

ආංශික නිපුණතා සහ නිත්වයම එක්ව වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ආයතනයන්හි කර්මාන්තගත පුහුණුවට යොමු කිරීම හා සම්බන්ධ සියලුම නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා පළාත් 9 යෙහිම වැඩමුළු පවත්වා එහිදී දැනට පවත්නා තත්ත්වයන් පිළිබඳ සියලු තොරතුරු එක්රැස් කර අධ්‍යයනයන් සිදුකර එම නිර්දේශයන් අදාල ආයතනවල ප්‍රධානීන්ට වැඩමුළුවක් පවත්වා දැනුවත් කරන ලදී. මෙහිදී කර්මාන්තගත පුහුණුව වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීම උදෙසා පළාත් කර්මාන්ත සංසද පිළිබඳ සංකල්පය හඳුන්වා දෙන ලදී. (RIF – Regional Industry Form)

9:3:3 නිපුණතා ආංශික සභාවන් සමඟ සම්බන්ධ වෙමින් කර්මාන්තයන්ගේ තොරතුරු එක් රැස් කර ශ්‍රම වෙළඳපොල තොරතුරු වාර්තා සකස් කිරීම සඳහා අප කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයත් සමඟ කටයුතු කිරීම.

දැනට පවත්නා ආංශික නිපුණතා සහා තුනෙහිම වෙබ් අඩවි සැකසීම ක්‍රියාකාරී මට්ටමෙහි පවත්නා අතර එක් එක් නිපුණතා සභාව මඟින් ශ්‍රම වෙළඳපොල තොරතුරු එම නිපුණතා සභාවන්හි වෙබ් අඩවිවල පළ කිරීම සිදු කරන අතර එම වෙබ් අඩවි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි වෙබ් අඩවියට සම්බන්ධ කිරීම (link) තොරතුරු පද්ධති අංශය මඟින් සිදු කෙරේ.

9:3:4 සිසුන්ව රැකියාගත කිරීම සඳහා පහසුකම් සැලසීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙහි දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

ආංශික නිපුණතා සභාවන්හි වෙබ් අඩවිවල එම දත්ත ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් පවතින බැවින් එම වෙබ් අඩවිවල දත්ත යාවත්කාලීන කළ පසු හා එම වෙබ් අඩවි ක්‍රියාකාරී මට්ටමට පැමිණි පසු තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හා සම්බන්ධ කරනු ඇත.

9:3:5 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලෙන උපදේශකවරුන් හට ආංශික නිපුණතා සහාවන් සමඟ සම්බන්ධීකරණය වෙමින් පුහුණු සැසි පැවැත්වීම.

- ★ ඉදිකිරීම් ආංශික නිපුණතා සහාව මඟින් සංවර්ධනය කරන ලද කෙටි කාලීන පාඨමාලා සඳහා උපදේශකවරුන්ට ප්‍රායෝගික අත්දැකීම් වටහාගත හැකිවන පරිදි පුහුණු සැසි දෙකක් කොතලාවල ආරක්ෂක විද්‍යාලයෙහි පැවැත්වීම.

- ★ තොරතුරු තාක්ෂණ ආංශික නිපුණතා සහාව මඟින් පුහුණුකරුවන් හට පාඨමාලා සඳහා පුහුණු කිරීමේ වැඩමුළු දෙකක් පැවැත්වීම.

- ★ නිෂ්පාදන හා ඉංජිනේරු කර්මාන්ත ආංශික නිපුණතා සහාව මඟින් කෙටිකාලීන පාඨමාලා සඳහා උපදේශකවරුන්ට පුහුණු සැසි තුනක් පැවැත්වීම.

- ★ පැස්සුම්කරු සහ ඇළුම්නියම් පිරිසැකසුම්කරු යන පාඨමාලාවන්හි තෝරාගත් උපදේශකවරුන් සඳහා ප්‍රායෝගික අභ්‍යාස සහිත පුහුණු වැඩමුළු 02 ක්‍රියාත්මක කිරීම.

9:3:6 ආංශික නිපුණතා සහා කාර්යාල පවත්වාගෙන යාම සඳහා එනම් ක්‍රියාකාරිත්වයෙහි තබා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය අත්තිකාරම් ලබා දීම.

ආංශික නිපුණතා සහාවල ක්‍රියාකාරිත්වය සඳහා මිලියන 6 බැගින් වෙන්ව තිබූ හෙයින් කාර්තුමය වශයෙන් එම මුදල් සහාවන්වලට ලබාදෙන ලදීග එහිදී වියදම් සඳහා යොදන ලද මුදල් ප්‍රමාණ ඇතුළුව සියලු වාර්තා කර්මාන්ත සබඳතා අංශයෙන් සකස් කරනු ලබන අතර එම මුදල් වැයවීම සම්බන්ධ කටයුතු වඩාත් ක්‍රමවත්ව කිරීම පිළිබඳවද අවධානය යොමු කරනු ලබයි.

9:3:7 ආංශික නිපුණතා සහාවන් වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

ඉදිකිරීම් ආංශික නිපුණතා සහාවෙහි මණ්ඩලීය රැස්වීම් 6 ක් සඳහා ද තොරතුරු තාක්ෂණ ආංශික නිපුණතා සහාවෙහි මණ්ඩලීය රැස්වීම් 12 ක් සඳහා ද නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සහාවෙහි මණ්ඩලීය රැස්වීම් 12 ක් සඳහා ද ප්‍රතිපාදන ලබාදෙන ලදී. එමෙන්ම පොදුවේ ආංශික නිපුණතා සහාවන්හි පවත්නා ගැටළු සාකච්ඡා කිරීමට හා ඉදිරි වැඩපිළිවෙල සකස් කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ ආංශික නිපුණතා සහාවල සභාපතිවරුන් සමඟ රැස්වීම් 11 ක් 2017 වර්ෂය තුළදී පවත්වන ලදී.

9:3:8 දිස්ත්‍රික් මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හා ආංශික නිපුණතා සහා සමඟ සම්බන්ධවෙමින් පළාත් මට්ටමින් පාසල් සිසුන් සඳහා වැඩමුළු පැවැත්වීම.

කෑගල්ල හම්බන්තොට හා මාතලේ යන ප්‍රදේශයන්හි පාසල්වල දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා ආංශික නිපුණතා සභා හා දිස්ත්‍රික් මාර්ගෝපදේශන නිලධාරීන් ඉතාමත් ක්‍රියාකාරී මට්ටමින් සම්බන්ධ විය.

9:3:9 දිස්ත්‍රික් මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව හා ඇගයීම් කමිටුවක් මඟින් අධීක්ෂණය හා ඇගයීම් කටයුතු සිදු කිරීම.

දැනට පවත්නා දිස්ත්‍රික් මාර්ගෝපදේශන මධ්‍යස්ථාන හා ඒවායේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව දත්තයන් ලබා ගනිමින් අධීක්ෂණය කිරීම හා ඇගයීම් කටයුතු සිදු කිරීම කර්මාන්ත සබඳතා අංශය මඟින් සිදු කරන ලදී. ඒ අනුව පහත මධ්‍යස්ථාන අධීක්ෂණයට හා ඇගයීමට ලක් කරන ලදී.

1. අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය
2. වවුනියාව කාර්මික විද්‍යාලය
3. යාපනය තාක්ෂණ විද්‍යාලය
4. කිලිනොච්චිය ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරී කාර්යාලය
5. හොරණ දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය
6. පේරාදෙනිය දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය
7. මහනුවර තාක්ෂණ විද්‍යාලය
8. රත්නපුර තාක්ෂණ විද්‍යාලය
9. මඩකලපුව කාර්මික විද්‍යාලය
10. බදුල්ල ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරියෙහි කාර්යාලය
11. වාරියපොල කාර්මික විද්‍යාලය
12. මාතර ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරී කාර්යාලය
13. මාතර කාර්මික විද්‍යාලය

9:3:10 කර්මාන්ත සබඳතා අංශයෙහි දායකත්වයෙන් වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

වෘත්තීය මාර්ගෝපදේශනය හා ජාතික වෘත්තීය සුදුසුකම් පිළිබඳව නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උපදේශකවරුන් දැනුවත් කිරීමේ වැඩමුලු 8 ක් කර්මාන්ත සබඳතා අංශය මඟින් පවත්වන ලදීග එමෙන්ම පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් ද පවත්වන ලදී.

9:3:11 Touch your Future 2017 නිපුණතා තරඟාවලිය පැවැත්වීම.

ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගේ හැකියා/දක්ෂතා ඔප් නැංවීමේ අරමුණින් මෙම නිපුණතා තරඟාවලිය තෙවන වරටත් 2017 වර්ෂයේදී සිදු කරන ලදී. තරඟ වට තුනකින් සමන්විත මෙම තරඟාවලියේදී එක් එක් ක්ෂේත්‍රයන්ගේ දක්ෂතා දැක් වූ සිසුන් 33 දෙනෙකු අවසාන ජයග්‍රහන කරා ළඟා වූහඟ ඒ අනුව එකී ත්‍යාග සහ සහතික පත් ලබා දීම 2017 ජූලි මස 15 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් සිදු කරන ලද අතර එය සුගතදාස ක්‍රීඩාංගණයේදී අති උත්කර්ශවත් අන්දමින් නිමාවට පත් විය.

9:3:12 විශේෂ ක්‍රියාකාරකම්/යොවුන් පුරය වැඩසටහන් පැවැත්වීම

2017 වර්ෂයේ ත්‍රිකුණාමලයෙහිදී පැවැත්වුණු යොවුන් පුරය වැඩසටහන කර්මාන්ත සබඳතා අංශය මඟින් සම්බන්ධීකරණය කරන ලද අතර එහිදී සහභාගි වූ තරුණ තරුණියන්ව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යමින් අදාල තොරතුරු මහජනතාව වෙත ලබාදෙන ලදී.

★ ඉඳිකිරීම් ආංශික නිපුණතා සහාව මඟින් ඉදිරිපත් කරන ලද තෝරාගත් ඉඳිකිරීම් අංශයේ පාඨමාලාවන් සඳහා පාරිභාෂිත වචන රූප සටහන් ඇතුලත්ව සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමත මුල් අවස්ථාවේදී ජලනල කාර්මික පාඨමාලාවේ පාරිභාෂිත වචන ඇතුලත් පිටපත සකස් කරමින් පවතී.

★ ඉඳිකිරීම් ආංශික නිපුණතා සහාව හා තොරතුරු තාක්ෂණ ආංශික නිපුණතා සහාව මඟින් නිපුණතා පරතරය සමීක්ෂණ වාර්තා දෙකක් අවසන් කිරීම.

- ඉඳිකිරීම්
- තොරතුරු තාක්ෂණ

මෙම නිපුණතා පරතරය පිළිබඳව වාර්තාව අනුව පුහුණු සැලැස්ම සකස් කිරීමට දායකත්වය සැපයීම.

★ ආංශික නිපුණතා සභාවල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වීම.

- මංජුල විද්‍යානපතිරණ මහතා, වැඩ බලන අධ්‍යක්ෂ (කර්මාන්ත සබඳතා අංශය) ඉඳිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සභාවේ හා නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාවේ රැස්වීම් සඳහා සහභාගි වීම. මුල් අවස්ථාවේදී එයින් ජලනල කාර්මික විෂය සඳහා පාරිභාෂික වචන මාලාව සකස් කරමින් පවතී.

- කේ. ඒ. ඩී. හෂන්ති ලක්මිණි මිය, සහකාර අධ්‍යක්ෂිකා (කර්මාන්ත සබඳතා අංශය) තොරතුරු තාක්ෂණ ආංශික නිපුණතා සභාවේ හා සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාවේ රැස්වීම් සඳහා සහභාගි වීම.

★ TVET Guide සඟරාව සඳහා ලිපි ලබා දීම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයෙන් සම්පාදනය කරනු ලබන TVET Guide නැමැති සඟරාව සඳහා කර්මාන්ත සබඳතා අංශයෙන් ආංශික නිපුණතා සභාවන් මෙන්ම වෘත්තීය මාර්ගෝපදේශනය අලලා ලියවූ ලිපි කිහිපයක් පළ කරන ලදී.

★ ඇගයීම් ක්‍රියාවලිය සඳහා දායකත්වය සැපයීම.

නිපුණතා සංවර්ධන සහකාර/සංවර්ධන නිලධාරීන්ගෙන් පුහුණු පාඨමාලාව අවසානයේ තාක්ෂණ වෘත්තිකයන් පුහුණු කිරීමේ ආයතනයේ පැවති එම නිලධාරී ඇගයීම් කටයුතු සිදු කිරීම උදෙසා ඇගයීම් කමිටු සාමාජිකත්වය දැරීම කර්මාන්ත සබඳතා අංශයේ නිලධාරීන්ගෙන් සමන්විත විය.

★ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සඳහා සහභාගීත්වය.

දංකොටුවෙහි පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙහි කර්මාන්ත හිමියන්ගේ සේවය ඇගයීම හා ඉදිරි රැකියාස්ථ පුහුණුව සඳහා සිසුන් යොමු කිරීම උදෙසා ආරාධිත දේශනය හා උද්ගත වූ ගැටළුවලට ප්‍රායෝගික විසඳුම් ලබා දීම සඳහා කර්මාන්ත සබඳතා අංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී.

★ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම.

මහජනතාව හා සිසුන් දැනුවත් කිරීම සඳහා සංවිධානය කරන ලද ප්‍රදර්ශන සඳහා දායකත්වය සැපයීම මෙන්ම ඒ සඳහා කර්මාන්ත සබඳතා අංශයේ තොරතුරු ඇතුළත් අත් පත්‍රිකා බෙදා හැරීමද සිදු කරන ලදී.

10.0 තොරතුරු පද්ධති අංශය

කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශය මගින් විවිධ වූ තොරතුරු එක්රැස් කර අවශ්‍ය පරිදි පිරිසැකසුම් කර එම තොරතුරු අදාල පාර්ශවයන්ට ලබාදීමේ කාර්යය ඉටු කරනු ලැබේ. මෙම කාර්ය සඳහා පරිගණක හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගන්නා අතර, එමගින් තොරතුරු භාවිතයට ගැනීමට වැඩි පහසුවක් හා උපයෝගීතාවයක් ඇති වේ. තොරතුරු සාමුහිකව පරිහරණය කිරීම තුලින් ආයතනික සංවර්ධනය ලඟා කර ගත හැකිය. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයෙන් මෙම අත්‍යවශ්‍ය තොරතුරු සේවාව විධිමත් පරිදි ලබාදීම සඳහා නවීනතම තාක්ෂණය උපයෝගි කරගෙන එම තොරතුරු ආයතනික දියුණුව සඳහා සාර්ථකව පරිහරණය කිරීමට හැකි වන අයුරු උපාය මාර්ග හා විධිවිධාන සැලසීම මගින් දිනපතා සිඝ්‍රයෙන් වර්ධනය වන තොරතුරු සමුදාය හරහා සිදුවේ.

10.1 තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන අරමුණු

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන් විධිමත් හා පහසු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම,ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම ද සිදුවේ. තොරතුරු පද්ධති අංශය අධ්‍යක්ෂ, වැඩ බලන ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂක හා සංඛ්‍යාලේඛණඥ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා පුස්තකාලාධිපති, වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂක, සහකාර අධ්‍යක්ෂකවරු දෙදෙනෙක්, සංවර්ධන නිලධාරියෙකු, සම්බන්ධීකරණ නිළධාරි හා පරිගණක චිත්‍රක ශිල්පී හා පරිගණක දෘඩාංග ශිල්පී ඇතුළු කාර්යය මණ්ඩලයකින් 2017 වසරේදී සමන්විත විය.

10.2 තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන කාර්යයන් සහ වැඩසටහන් පහත දැක්වේ.

- ඉල්ලුම අනුව ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කිරීම.
- ඉදිරි වර්ෂය සඳහා වෘත්තීය අධ්‍යාපනයට හා වෘත්තීය පුහුණුවට මඟ (TVET Guide) ප්‍රකාශයට පත්කිරීම හා අවශ්‍ය තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම.
- UNEVOC ප්‍රාදේශීය මධ්‍යස්ථානය පවත්වගෙනයාම සහ එහි කාර්යයන් සහ වැඩසටහන් දිගටම ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය හා වෙබ් පිටුව සංවර්ධනය කර පවත්වාගෙන යාම.
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සංග්‍රහය සැකසීම හා ප්‍රකාශයට පත්කිරීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පුවත් ලිපිය (Newsletter) සැකසීම හා ප්‍රකාශයට පත් කිරීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් අංශයන්ගේ කටයුතු සාර්ථකව පවත්වා ගැනීම සඳහා පරිගණක පද්ධති නිර්මාණය කිරීම සහ පවත්වාගෙම යෑම.
- කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති සහ ලියාපදිංචි විය යුතු ආයතන සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යාම සහ එම කටයුතු සාර්ථකව කරගෙන යෑමට අවශ්‍ය තොරතුරු එම ආයතන වෙත ලබා දීම.
- අප ආයතනය යටතේ ක්‍රියාත්මක වන සේවාවන් පිළිබඳව තොරතුරු මහජනතාව සඳහා ලබා දීමට අවශ්‍ය වන ඔඑෑස වෙබ් අඩවිය නිර්මාණය කිරීම, පවත්වාගෙන යෑම සහ යාවත්කාලීන කිරීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත් මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යෑම, අවශ්‍ය දත්ත ඇතුලත් කිරීම සඳහා අනෙකුත් ලියාපදිංචි පුහුණු ආයතන වෙත උපදෙස් ලබා දීම හා එම දත්ත කළමනාකරණය.
- SSDP වැඩසටහන යටතේ නිර්මාණය වන කලමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) හා සම්බන්ධවී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට අවශ්‍ය තොරතුරු ලබාදීම.

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන සෑම අංශයකටම අවශ්‍ය වන පරිගණක යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගැනීමේදී ඇති වන අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය වන පිරිවිතරයන් ලබා දීම. හා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම.
- ආයතනය තුල පරිගණක ජාලගත කිරීම, අන්තර්ජාල සහ විද්‍යුත් තැපෑල පහසුකම් ලබා දීම, මේ සඳහා අවශ්‍ය Servers නිසි ආකාරයෙන් පවත්වාගෙන යෑම හා ඒවයේ දෘඩාංග හා මෘදුකාංග යාවත්කාලීන කිරීම.
- කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලයට පුස්තකාල සේවාව හා ආශ්‍රිත තොරතුරු පහසුකම් සැලසීම හා පුස්තකාලය පවත්වාගෙන යාම.
- අවශ්‍ය වූ විට අදාල පරිදි ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කර සම්පාදනය කිරීම, යනාදී කටයුතු මින් ප්‍රධාන ස්ථානයෙහි ලා ගැනේ.
- කොමිෂන් සභාවේ කටයුතු වලට අවශ්‍ය පරිගණක චිත්‍ර නිර්මාණය කිරීම.

මෙම අංශයේ ප්‍රධාන තොරතුරු පද්ධතිය සමන්විත වන්නේ ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය, ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමේ පද්ධතිය, සැලසුම් සහ පර්යේෂණ පද්ධතිය හා ආයතන ලියාපදිංචි කිරීමේ හා පාඨමාලා ප්‍රතිනතය කිරීමේ තොරතුරු පද්ධතිය යනාදී තොරතුරු පද්ධතීන්ගෙනි. 2017 වර්ෂය තුලදී මෙම අංශය මගින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් හා සේවාවන් ඉටුකිරීමට සමත් වී ඇත.

10.3 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ වර්තමාන රැකියා ඉල්ලුම සහ අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සැපයීම අරමුණු කරගෙන ඊට අදාල ශ්‍රම වෙළෙඳපොල තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර ඇත.

දත්ත සමීක්ෂණය හා විශ්ලේෂණය මගින් ලබාගන්නා ලද ශ්‍රම වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, වෘත්තීය මාර්ගෝපදේශකයන්, රැකියාගත කිරීමේ නියුතු ආයතන, පුහුණුකරුවන්, සේවායෝජකයන් හා රැකියා අපේක්ෂකයින් යනාදී පාර්ශවවල ප්‍රයෝජනය සඳහා ප්‍රකාශයට පත්කරනු ලැබේ.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ශ්‍රමවෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය (LMI Bulletin) මගින් හා කොමිෂන් සභාවේ අන්තර්ජාල පිටුව (TVEC website : www.tvec.gov.lk) මගින් ලබාගත හැක.

10.4 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය පිළියෙල කිරීම හා ප්‍රකාශ කිරීම.

2017 වසර තුළ දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන 2 ක් ප්‍රකාශයට පත්කිරීමට තොරතුරු පද්ධති අංශයට හැකිවිය.මෙම ප්‍රකාශන මගින් 2015 වසරේ අග භාගයේදී සහ 2017 වර්ෂයේ මුල් භාගය තුල ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළේ පැවැති ස්වභාවය විනිවිදව විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීමට සමත් වී තිබේ.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සංග්‍රහය පහත සඳහන් පරිදි කොටස් 5 කින් යුක්ත වේ.

1. රැකියා සඳහා ඇති ඉල්ලුම
2. සේවානියුක්තිය
3. සේවාවියුක්තිය
4. ශ්‍රම වෙළෙඳපොළ සැපයීම හෙවත් විවිධ රැකියාවලට ඇති ශ්‍රම සැපයුම
5. ශ්‍රම වෙළෙඳපොළ සඳහා ඇති ඉල්ලුම සහ පර්යේෂණ තොරතුරු

2017 වසර තුල දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා තොරතුරු පද්ධති අංශය ක්‍රියාකර ඇත.

ඒ අනුව, ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයට නව මුහුණුවරක් දෙමින් ශ්‍රම වෙළෙඳපොළ සම්බන්ධව කරන ලද පර්යේෂණ හා ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු,ශ්‍රම වෙළෙඳපොළ ගමන්මග පිලිබඳ විශේෂ උනන්දුවක් දක්වන අයට වඩා ප්‍රයෝජනවත් වන ආකාරයට මෙම ප්‍රකාශනය තුලින් එළි දැක්වීමට කටයුතු කරන ලදී.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ දේශීය හා විදේශීය වශයෙන් රැකියාවලට ඇති ඉල්ලුම,දේශීය හා විදේශීය වශයෙන් ඇති පුවත්පත් දැන්වීම් පදනම් කරගෙන එක් එක් කර්මාන්ත අංශයන් හී ඇති රැකියා අවස්ථා,රැකියාගත වීම්, අධ්‍යාපන සුදුසුකම්,ස්ත්‍රී/පුරුෂ භාවය හා පලපුරුද්ද ආදී වශයෙන් රැකියාවට සම්බන්ධ අදාල තොරතුරු අන්තර්ගත කර ඇත.

2006 සිට 2015 වර්ෂය දක්වා එක් එක් වර්ෂයන්හි "සිළුමිණ" හා "Sunday Observer" පුවත්පත් සහ රජයේ Gazette මගින් සමීක්ෂණය කරන ලද දැන්වීම් ගණන අංක 8.1 වගුවේ දැක්වේ.

වගුව 8.1 - සම්පාදනය කරන ලද රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව

වර්ෂය	රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව
2006	104.839
2007	113.060
2008	116.157
2009	82.167
2010	124.741
2011	108.193
2012	136.994
2013	107.698
2014	91.430
2015	81.369
2016	74.248

- රජයේ ප්‍රකාශිත ගැසට් පත්‍රයේ අන්තර්ගත රැකියා අවස්ථා ද අන්තර්ගත කර ඇත.



2006-2016 වර්ෂය දක්වා පැවති රැකියා පිළිබඳ දැන්වීම් පහත ස්ථම්භ ප්‍රස්ථාරය මගින් දැක්වේ.



පුවත්පත් දැන්වීම් මගින් පලකර ඇති රැකියා පුරප්පාඩු මට්ටම තවදුරටත් සාර්ථක කරගැනීමට විද්‍යුත් තැපෑල හා වෙබ් අඩවි තොරතුරු සලකා බලන ලදී.

10.5 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වෙබ් පිටුව

කාර්යක්ෂම හා ඵලදායී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සේවාවක් යාවත්කාලීනව ලබාදීමට ඒවා භාවිතා කරන්නන් හට ලබාදීමේ අරමුණින්ම වෙන් වූ මෙම වෙබ් අඩවිය 2017 වසර තුල යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත. එම තොරතුරු Interactive Graphs සහ Table ලෙස තවදුරටත් 2017 වසර තුල වැඩි දියුණු කරන ලදී. එමගින්,

- වත්මන් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය
- පුහුණු පාඨමාලා තොරතුරු අන්තර්ජාලයෙන් බලාගත හැකිවීම
- පසුගිය ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන
- ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ සංකල්ප හා අර්ථ දැක්වීම
- ප්‍රයෝජනවත් වෙබ් අඩවිවලට පිවිසුම
- සීව දත්ත සහිත ඉල්ලුම් පත්‍ර සාදා ගැනීමට සහය වීම
- රැකියා ඇබෑර්තු තොරතුරු ලබාගැනීමට හැකිවීම
- කාර්මික හා ඊට සම්බන්ධ වෘත්තීය ක්ෂේත්‍රයේ ඉහළ ඉල්ලුමක් ඇති රැකියා 10 ක් ප්‍රදර්ශනය කිරීම යනාදී වැදගත් කරුණු ලබාදීමට කටයුතු කර ඇත.
- වාර්ෂික TVET Guide (වෘත්තීය පුහුණුවට මඟ) පාඨමාලා විස්තර
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ සංකල්පීය යෙදුම් අර්ථ දැක්වීම් සහ පාරිභාෂික ශබ්දමාලා ,වචන ශ්‍රම වෙළෙඳපොළ රැකියා දැන්වීම් වලට අමතරව සේවා නියුක්තිකයන් විසින් ඉදිරිපත් කරන ලද විවිධ තොරතුරු යාවත්කාලීන කර මෙම වෙබ් පිටුව ප්‍රකාශයට පත්කර ඇත.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වෙබ් පිටුවේ අනුරුවක් පහත දැක්වේ



10.6 අන්තර්ජාලය,විද්‍යුත් තැපෑල හා පහසුකම්

විද්‍යුත් තැපෑල භාවිතා කිරීම පිළිබඳව වූ රජයේ චක්‍රලේඛය අනුව කාර්යාල තොරතුරු හුවමාරු කිරීමේදී කාර්යක්ෂමතාවය වැඩිකිරීම, වියදම අඩුකිරීම සහ කාලය ඉතුරු කර ගැනීම සඳහා නවතාවයකින් යුතුව අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල් පහසුකම් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකුටම භාවිතා කිරීමට පහසුකම් සලසා ඇත. එමගින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සන්නිවේදන කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට මෙන්ම අන්තර්ජාලය තුලින් නව දැනුම ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. කාර්යය මණ්ඩලය වෙත තොරතුරු ලබාදීම සඳහා අභ්‍යන්තර ජාලයක් නඩත්තු කරන ලබයි.

මෙම නව සන්නිවේදන ක්‍රමයේ ඇති නම්‍යශීලි බව හා එමගින් තොරතුරු ලබාගැනීමේ ඇති පහසුව නිසා එය පරිහරණය කරන්නන්ගේ අවධානයට ලක්ව තිබේ.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව තොරතුරු සන්නිවේදනය කර ගැනීමේ වැඩි ඉඩ ප්‍රස්ථාවක් සලසනු වස් විද්‍යුත් තැපෑල (Email) සහ අන්තර්ජාල පහසුකම් 2017 වසරේ දී වැඩිකර ඇත.

10.7 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා වෙබ්අඩවිය සංවර්ධනය හා පවත්වාගෙන යාම

තොරතුරු පද්ධති අංශය මගින් කොමිෂන් සභා අන්තර්ජාල අඩවිය පාලනය කරනු ලබයි.කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්, ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වඩාත් නිවැරදිව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම හා කොමිෂන් සභාවේ නව වැඩිදියුණු වීම් හා වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ නව සංවර්ධනයන් හඳුන්වාදීම් කොමිෂන් සභා අන්තර්ජාල වෙබ් අඩවියේ ඇතුලත් වේ. මෙම තොරතුරු එකී ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අයට අතිශයින්ම ප්‍රයෝජනවත් වේ.

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අන්තර්ජාල අඩවියේ අනුරුවක් පහත දැක්වේ.



NVQ ප්‍රතිඵල එම ආයතන වලට ලබාගැනීමේ පහසුකම් සැලසීම හා ඇගයීම් ප්‍රතිඵල එම ආයතනවලට අදාල තොරතුරු ලබාගැනීමේ පහසුකම් ලබාදීම සඳහා දත්ත ඇතුලත් කිරීමට 2015 වර්ෂයේ සලසා දී තිබු පහසුකම් 2017 වර්ෂයේ වැඩි දියුණු කර ඇත.

කොමිෂන් සභාවේ ප්‍රධාන අන්තර්ජාල වෙබ් අඩවිය තුලින් පහත සඳහන් වෙබ්අඩවිවලට පිවිසීමට අවස්ථාව සලසා ඇත.

- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු (LMI)
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)
- පාඨමාලා ලියාපදිංචිය හා ප්‍රතිනය (Registration & Accreditation)
- සැලසුම් හා පර්යේෂණ (Planning & Research)
- අභ්‍යන්තරජාලය (Intranet)
- කොමිෂන් සභාවේ පර්යේෂණාකවය
- පුවත් හා සිදුවීම්
- තොරතුරු පද්ධති
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු මගපෙන්වීම
- ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමේ ක්‍රමවේදය
- අයදුම්පත් හා තොරතුරු බාගත කිරීම
- අභ්‍යන්තර වෙබ් ජාලය

පහත දැක්වෙන වෙබ්අඩවි 2017 වසරේ දී තවදුරටත් සංවර්ධනය කර අන්තර්ජාලය වෙත සම්බන්ධ කර ඇත.

10.8 ලියාපදිංචි හා ප්‍රතීතන වෙබ් අඩවිය

මෙම වෙබ්අඩවිය මගින් ආයතන ලියාපදිංචිය හා පාඨමාලා ප්‍රතීතනය පිළිබඳ සියළුම තොරතුරු ලබාගැනීමට හැකිය. තවද මෙම වෙබ්අඩවියේ ලියාපදිංචි ආයතන හා කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු, තත්ත්ව කළමනාකරණ පද්ධතිය පිළිබඳ තොරතුරු, ලියාපදිංචි ඉල්ලුම්පත්, ලියාපදිංචිය අළුත්කිරීමේ ඉල්ලුම්පත්, පාඨමාලා ප්‍රතීතන අයදුම්පත් ආදිය අඩංගු කර ඇත. වෙබ්අඩවිය මගින් පාඨමාලා ලියාපදිංචිය, ආයතන ලියාපදිංචි කිරීම සඳහා ධබකසබැ ක්‍රමයට අයදුම්කල හැකිවීම සහ ධබකසබැ ක්‍රමයට මුදල් ගෙවීමට පහසුකම් සලසා ඇත. මෙම ක්‍රියාවලිය 2017 වසරෙ දි තවදුරටත් වැඩි දියුණු කරන ලදී.

මෙම වෙබ් අඩවියේ අනුරුවක් පහත දැක්වේ.



10.9 පුහුණු ආයතන

ලියාපදිංචි හා ප්‍රතීතන තොරතුරු වෙබ් පහසුකම

මෙම පහසුකම මගින් ලියාපදිංචි වී ඇති ආයතන හා ප්‍රතීතනය කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු අන්තර්ජාලය ඔස්සේ පරීක්ෂා කල හැකි අතර එමගින් ඕනෑම අයෙකුට පහත සඳහන් ක්‍රමවේදයන්ට අනුව තොරතුරු සොයාගත හැකිය.

1. පළාත් සහ ක්ෂේත්‍ර අනුව ආයතන විස්තර
2. පළාත් සහ හිමිකාරීත්වය අනුව ආයතන විස්තර
3. පළාත් නම හෝ නමින් කොටසක් මගින් ආයතන විස්තර
4. පාඨමාලා නම සහ දිස්ත්‍රික්ක අනුව ආයතන විස්තර



10.10 සැලසුම් සහ පර්යේෂණ වෙබ් අඩවිය

සැලසුම් හා පර්යේෂණ වෙබ් අඩවියේ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් ප්‍රතිපත්ති, ආයතනික සැලසුම, වාර්ෂික සැලසුම්, වෘත්තීය පුහුණු සැලසුම් සහ මූල්‍යාධාර පිළිබඳ විස්තර ආදිය ඇතුලත් කොට ඇත. පර්යේෂණ කවය සඳහා වෙනම ම වෙබ් අඩවියක් ස්ථාපිත කර ඇති අතර එහි පර්යේෂණ කවයේ පරමාර්ථ,

පර්යේෂණ කවය ස්ථාපිත කිරීම අරමුණු කරන ලද පර්යේෂණ වර්ග සහ වෙනත් පර්යේෂණ වල ප්‍රගතිය ඇතුලත් වේ. පර්යේෂණ සඳහා උනන්දුවක් දක්වන කණ්ඩායම්වලට පර්යේෂණවල ප්‍රගතිය සහ ඒ පිළිබඳ තොරතුරු ලබාගත හැකිය.

සැලසුම් හා පර්යේෂණ වෙබ්අඩවියේ අනුරුවක් පහත දැක්වේ.



තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මෙම වෙබ් අඩවියට ඇතුල්වන අයගේ දත්ත සමීක්ෂණය් කරන ලද අතර, 2017 වසරේදී ද මසකට 20,000 අධික පිරිසක් දේශීයව හා ජාත්‍යන්තරව මෙම පර්යේෂණ වෙබ් අඩවිය ප්‍රයෝජනයට ගෙන ඇත. මෙම වෙබ් අඩවියේ කොමිෂන් සභාව අනුග්‍රහය යටතේ දැනටමත් කෙරී අවසන් වූ පර්යේෂණ, වර්තමානයේ සිදුකෙරෙමින් පවතින පර්යේෂණ හා ඉදිරියේ දී කිරීමට සැලසුම්කරන ලද පර්යේෂණ පිළිබඳව ද විස්තර සඳහන් වේ.

10.11 තොරතුරු පද්ධති අංශයේ වෙබ් අඩවිය

තොරතුරු පද්ධති අංශය එම අංශයේ තොරතුරු ඉදිරිපත්කිරීම සඳහා මෙම වෙබ්අඩවිය 2017 වසරේ දී සංවර්ධනය කර පවත්වාගෙන යන ලදී.

මෙම වෙබ් අඩවියේ අනුරුවක් පහත දැක්වේ.



ඉහත තොරතුරු වලට අමතරව තොරතුරු පද්ධති අංශය 2017 වසරේ දී පහත දැක්වෙන දත්ත සමුදායන් සංවර්ධනය කර පවත්වාගෙන ගොස් ඇතග

- ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථාන හා ප්‍රතීතනය කල පාඨමාලා
- ජාතික වෘත්තීය සුදුසුකම්ලාභීන්ගේ තොරතුරු
- පුවත්පත් දැන්වීම් සමීක්ෂණ තොරතුරු

තවද තොරතුරු පද්ධති අංශය අභ්‍යන්තර පරිගණක ජාලයල අන්තර්ජාල හා ඉලෙක්ට්‍රෝනික තැපැල් පද්ධතිල පරිගණක ජාල පිවිසුම් බාධක (Network Firewall) ආදිය ආයතනයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු තිරීම සඳහා 2017 වසර තුළ පවත්වාගෙන ගොස් ඇත.



10.12 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන / පුහුණු මාර්ගෝපදේෂය (TVET Guide)

කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශය මගින් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශයට අමතරව 2018 වර්ෂය සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව පිළිබඳ මග පෙන්වීමේ ප්‍රකාශනය (TVET GUIDE 2018) 2017 වසර අවසානයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම (TVET GUIDE) ප්‍රකාශය පලාත් මට්ටමින් ආයතන අනුව හා අධ්‍යාපන ක්ෂේත්‍ර අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු පාඨමාලා විස්තරල පාඨමාලා බඳවා ගැනීමේ සුදුසුකම් ආදී විස්තරල පාඨමාලා ගාස්තුල ලියාපදිංචි පුහුණු ආයතන පිළිබඳ විස්තර හා ප්‍රතිපාදනය කල පාඨමාලා පිළිබඳ විස්තර එහි ඇතුලත් කර ඇත. පලාත් මට්ටමින් එක් එක් ආයතනවල පාඨමාලා හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් අනුව වර්ග කර දක්වා ඇත.

TVET GUIDE 2018 හි අනුරුවක් පහත දැක්වේ.



මෙම ප්‍රකාශනය පලාත් 9 ඇතුළත්වන සේ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති අතර. ඒ තුළින්

1. පලාත් සහ අධ්‍යයන ක්ෂේත්‍ර අනුව ආයතන විස්තර
2. පලාත් සහ අධ්‍යාපන සුදුසුකම් අනුව ආයතන විස්තර
3. පලාත් සහ අධ්‍යයන ක්ෂේත්‍ර අනුව පාඨමාලා තොරතුරු ලබා ගත හැක.

මෙම වෙබ් පිටුවේ අනුරුවක් පහත දැක්වේ.



10.13 TVEC පුවත් ලිපිය

2017 වසර තුළ දී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් TVEC පුවත් ලිපි (TVEC Newsletters) හා (TVET Newsletters) දෙකක් ප්‍රකාශයට පත්කර සියලුම ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථාන හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් අතරේ නොමිලයේ බෙදා හරින ලදී.

එම පුවත් ලිපි දෙකෙහි අනුරූ පහත දැක්වේ.









10.14 කොමිෂන් සභාවේ පුස්තකාලය

කොමිෂන් සභාවේ පුස්තකාලය තොරතුරු පද්ධති අංශය මගින් පාලනය වේග පුස්තකාලය මගින් දෙස් විදෙස් විවිධ අධ්‍යාපන ක්ෂේත්‍රවල නියුතු විවිධ තරාතිරම් වලට අයත් පර්යේෂකයන් විද්වතුන් වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ පුද්ගලයන්ට පුස්තකාල පහසුකම් සලසා ඇත. ඒ අනුව පුස්තකාලය මගින් පහත සඳහන් සේවාවන් ලබා දීම සිදුවේ.

- වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයට අදාල පොත්පත්, පර්යේෂණ වාර්තා සැපයීම.
- කොමිෂන් සභාවේ ප්‍රකාශන පාලනය හා බෙදාහැරීම.
- වාර සඟරා පරිහරණයට ඉඩ සැලසීම.
- දිනපතා පුවත්පත් පරිහරණයට ඉඩසැලසීම හා අනෙකුත් ප්‍රලේඛන කාර්යයන්
- වෙනත් විවිධ තොරතුරු පරිශීලනල ප්‍රලේඛන සේවා සහ තොරතුරු සේවා සැපයීමේ පහසුකම්

පසුගිය වසර කිහිපයක දී පුස්තකාලය මගින් කොමිෂන් සභාවේ ප්‍රකාශන මිළ දී ගැනීම් විස්තර පහත දැක්වේ.

2006 සිට 2017 වසර දක්වා පුස්තකාලයට පොත්පත් මිළ දී ගැනීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

වර්ෂය	වටිනාකම (රුපියල්)
2006	99,513.00
2007	150,000.00
2008	195,000.00
2009	99,288.00
2010	50,000.00
2011	25,000.00
2012	50,000.00
2013	50,000.00
2014	50,000.00
2015	50,000.00
2017	50,000.00

ඊට අමතරව කොමිෂන් සභාවේ පුස්තකාලයේ නොමැති එහෙත් උනන්දුවක් දක්වන පාඨකයන්හට අන්තර් පුස්තකාල පිරුළු සේවාව මගින් අවශ්‍ය පුස්තකාල තොරතුරු සේවාව සපයා ඇත. කාර්යය මණ්ඩලයේ නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටුකරනු වස් පසුගිය වසර තුළ ද වෙනත් පුස්තකාල මගින් තොරතුරු සම්පත් හුවමාරු කරගෙන ඇත.

බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ඇති පුස්තකාලයේ ආයතනික සාමාජිකත්වය ද ලබාගෙන තිබේග එමගින් අතිරේක පොතපත පරිශීලනය කිරීමට පහසුකම් සළසා ඇති අතර අන්තර්ජාතික දැනුම පාඨකයන්ට ලබා දීමට පුස්තකාලය 2017 වසරේ ද කටයුතු කර ඇත.

10.15 2017 වර්ෂයේදී තොරතුරු පද්ධති අංශය මගින් සංවිධානය කල විශේෂ වැඩසටහන් සහ අලුතින් සකස්කරන ලද විශේෂ සේවාවන්

2015 වර්ෂය සඳහා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාළ ජාතික නිපුණතා සංවර්ධන වාර්තාව (2017 දී සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී.

ජාතික නිපුණතා සංවර්ධන වාර්තාව 2015 දී ශ්‍රී ලාංකේය ශ්‍රම වෙළඳපොළ තුළ ලබාගත හැකි කුසලතාවන් පිළිබඳ මූලික වාර්තාවක් සපයයි. මෙම වාර්තාව ශ්‍රම වෙළඳපොළ දෙස බලන විට මධ්‍යම ප්‍රමාණයේ සිට දිගු කාලීන ප්‍රවණතා සහ හොඳම ඇස්තමේන්තු ලබා දීමට අපේක්ෂා කරයි.

තවද මෙම වාර්තාවෙන් පෙන්නුම් කරන්නේ ශ්‍රම සැපයුම හා ඉල්ලුමේ ප්‍රක්ශේපයන්ගේ ප්‍රතිඵලය, වෙනස්කම් කරන ප්‍රධාන සාධකයන් වටා අතීත දත්ත හා උපකල්පන පිළිබඳ අවබෝධය මත පදනම්ව ය. එවන් පුරෝකථනයන් පිටුපස ඇති තර්කයක් වන්නේ ශ්‍රම වෙළඳපොළේ සියලුම සහභාගිවන්නන් සඳහා ප්‍රයෝජනවත් ප්‍රමිතික තොරතුරු සහ විනිවිදභාවය සපයන ලද පුළුල්, ක්‍රමානුකූල, ස්ථාවර හා විනිවිද පෙනෙන ප්‍රක්ෂේපණ සංඛ්‍යාවක් බවය. මෙම වාර්තාව මගින් ප්‍රතිපත්ති විශ්ලේෂණය හා රැකියා නියුක්ති රටාවන් වෙනස් කිරීම හා නිපුණතා අවශ්‍යතා සඳහා වන බලපෑම් පිළිබඳ පොදු ස්වභාවය පිළිබඳව ප්‍රයෝජනවත් තොරතුරු සපයයි.

10.16 2017 වසරේ දී සකස්කල නව තොරතුරු පද්ධති මෘදුකාංග

2017 දී, තොරතුරු පද්ධති අංශය විසින් නියම කාල දත්ත ගබඩාව සම්බන්ධ කරන වෙබ් අඩවියේ ගතික තොරතුරු (Information Dash Board) සැපයීමේ අරමුණින් නිර්මාණය කර ඇත. සෑම පාර්ශ්වකරුවෙකුගෙන්ම ගතික තොරතුරු අවශ්‍යතා සපිරීමට භාවිතා කල හැකිය.

වෙබ් අඩවියේ නවීන දත්තයන් ලෙස පහත සඳහන් තොරතුරු පහත දැක්වේ.

- ක්‍රියාකාරී ලියාපදිංචි පුහුණු ආයතන
- ක්‍රියාකාරී ප්‍රතිනයය කල පාඨමාලා
- පුහුණු සැපයුම්කරුවන් විසින් සහතික නිකුත් කිරීම
- පුහුණු සැපයුම්කරුවන් විසින් සහතික ලබා දීම

තොරතුරු පුවරුව තිරය පහත දැක්වේ.



11.0 2017 වර්ෂය තුළ TVEC හි ජාත්‍යන්තර සහයෝගීතා කටයුතු

'දකුණු ආසියාතික කලාපය තුළ තිරසාර සංවර්ධනය සඳහා වෘත්තීය පුහුණුව හා තත්ත්ව පාලන ක්‍රම පිළිබඳ පිලිගත් නව්‍යකරණයන් හා පරිචයන් සඳහා TVET පද්ධති' පිළිබඳ උප-කලාපීය වැඩමුළුව, පෙබරවාරි 20-22, 2017, කොළඹ, ශ්‍රී ලංකාව.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ තත්ත්ව පාලනය සඳහා ශ්‍රී ලංකාව හා වෙනත් රටවල අත්දැකීම් ලත් පාර්ශ්වයන් අතර බෙදාහදා ගැනීමේ වැඩමුළුවක් ජර්මනියේ යුනෙස්කෝ සංවිධානයේ UNEVOC මූලස්ථානය එක්ව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. ඉන්දියාව, පකිස්ථානය, බංග්ලාදේශය, ඉරානය යන රටවල් සහ UNESCO-UNEVOC නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් 2017 පෙබරවාරි 20 සිට 22 දක්වා කොළඹ, රාමඩා හෝටලයේ දී පැවැත්විණි.

මෙම වැඩමුළුව, කලාපීය ජාලය තුළ සාමාජිකයින්ගේ අත්දැකීම් හුවමාරු කරගනිමින් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ තත්ත්ව සහතික කිරීම පිළිබඳ අන්‍යෝන්‍ය වශයෙන් ඉගෙන ගැනීම සහ කලාපීය සාමාජිකයින් අතර සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගෙන පැවැත්විණි. තවද, පහත සඳහන් අරමුණු අවධානයට ගෙන සාකච්ඡාවන් ආරම්භ කරන ලදී.

- කලාපීය මට්ටමේ වෘත්තීය පුහුණු හා වෘත්තීය සුදුසුකම් රාමු හා වෘත්තීය සුදුසුකම්වල තත්ත්වය පාලනය කිරීමේ ක්‍රමවේදයන් හා ප්‍රවේශයන් විශ්ලේෂණය කිරීම සහ

- දකුණු ආසියානු කලාපය තුළ රටවල් අතර අත්දැකීම් පිළිබඳ අවබෝධයන් වර්ධනය කිරීම හා අන්‍ය ප්‍රතිපත්ති වලින් ඉගෙන ගැනීම හෝ අනුගත වීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි ක්‍රම අධ්‍යයනය කිරීම.

මෙම වැඩමුළුව, ඉගෙනුම් සහ දැනුම හුවමාරු කිරීමේ අවස්ථාවන් සහ ප්‍රවේශයන්ගෙන් සමන්විත ඉදිරිපත් කිරීම් හා ඒ පිළිබඳ සාකච්ඡාවන්ගෙන් සමන්විත වූ අතර, ඉහත අරමුණු ඉටුකර ගැනීම කේන්ද්‍රගත වූ ඉදිරිපත් කිරීම් කරන ලදී. රටක තෘතීය පුහුණු වෘත්තිකයන් විසින් පිළිගත් සුදුසුකම් හා තත්ත්ව පාලන රාමු (Qualification Frameworks) සහ තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී අන්‍ය රටවලින් අත්දැකීම් හුවමාරු කර ගැනීමට සහ ඉගෙනීමට අවස්ථාව මෙමගින් ලබා දී තිබිණි. මෙම ප්‍රයත්නය මගින් බහු පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය හා තිරසාර ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පද්ධතියේ ක්‍රියාකරුවන් සමග සම්බන්ධීකරණය හා අවශ්‍ය ප්‍රවේශය ඇතිකිරීම අරමුණු කරන ලදී.

අධ්‍යයන කාලය තුළ ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව හා වෘත්තීය සුදුසුකම් පද්ධතිය පිළිබඳ දේශන මාලාවක් පවත්වනු ලැබූ අතර ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය සඳහා කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කරන රාජ්‍ය සහ පෞද්ගලික පුහුණු ආයතනවලට නියෝජිත පිරිස සංචාරය කළ අතර NVQ වල ක්‍රියාත්මක වන පුහුණු ආයතන; නිපුණතා පාදක පුහුණුව (CBT) විශේෂයෙන් ඉදිකිරීම් සහ සංචාරක අංශයන්හි එම පාඨමාලා ක්‍රියාත්මක වීම අධ්‍යයනය කරන ලදී.







11.2 නේපාල ජාතික නිපුණතා පිරික්සීමේ මණ්ඩලයේ (NSTB) කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකාව තුල NVQ හා RPL අධ්‍යයන චාරිකාව

තායිලන්ත රජයේ සහ ලංකාවේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET), නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය, කොළඹ ක්‍රමය පුහුණු විද්‍යාලය (CPSC) සමඟ අධ්‍යයන සංචාරයක් නේපාලයේ ජාතික නිපුණතා පිරික්සීමේ මණ්ඩලයේ (NSTB) සාමාජිකයින් සඳහා 2017 ජූලි 6 - 11 දක්වා ලංකාවේ සංවිධානය කරන ලදී.

නේපාලයේ ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතිය, ඵලදායී ලෙස යාවත්කාලීන කිරීම සඳහා එහි ඇති අවශ්‍යතාවයන් මත, මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය වන පරිදි මෙම වැඩපිළිවෙල සකස් කර තිබුණි. මේ අනුව, නේපාලයේ සන්දර්භය තුළ ජාතික වෘත්තීය හා සුදුසුකම් රාමු පද්ධතියට අදාළව තායිලන්තයේ හා ශ්‍රී ලංකාවේ අධ්‍යයන චාරිකාවලින් ලබාගත් දැනුම හා හොඳ ක්‍රමවේදයන් පිළිබඳ දැනුම හා අත්දැකීම ලබාදීම කරන ලදී. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ක්‍රමය සහ වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීමේ නව ප්‍රවණතා අධ්‍යයනය කිරීම සඳහා මෙම කණ්ඩායම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතන කීපයක් නිරීක්ෂණය කලහ.

ශ්‍රී ලංකා ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අදාළ අධ්‍යක්ෂවරුන් විසින් වැඩමුළුවක් 2017 ජූලි 10 වන දින පවත්වන ලද අතර එහිදී ශ්‍රී ලංකාවේ වසර 2003 සිට NVQ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන් හා වෙනස්කම් ඉදිරිපත් කරන ලදී. සැසිවාරයේ අවසානයේ දී ප්‍රශ්න හා පිළිතුරු සැසිවාරය සහ නේපාලයේ NVQ ක්‍රියාත්මක කිරීම හා ප්‍රචලිත කිරීම සඳහා NVQ සහ RPL හි ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටළු සාකච්ඡා කරන ලදී.

ශ්‍රී ලංකාව තුළ ඊ - වාණිජ්‍යයේ ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ව්‍යාපෘති සම්පාදනය හා ආරම්භය.

ඊ-වාණිජ්‍යය යනු අන්තර්ජාල වෙළඳාම සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා සහාය වන නැගී එන ගෝලීය ප්‍රවණතාවයකි. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (තාක්ෂණික පුහුණු) මෙම නව තාක්ෂණයන් සඳහා දක්ෂතා ඇති මානව සම්පත දියුණු කිරීම හා ලොව පුරා ඊ-වාණිජ්‍යය වෙළඳාම ක්‍රියාත්මක කිරීම හා ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය වේ.

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතන හරහා ඊ-වාණිජ්‍යය සඳහා නව පුහුණුව සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට මූලික පියවර තබන ලදී. සීපියැං කාර්මික තාක්ෂණ ආයතනය (ZJTIE), පළමු කාණ්ඩයේ විශිෂ්ඨතම ජාතික වෘත්තීය කාර්මික විද්‍යාලයක් වන අතර සීපියැං පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ සීපියැං මැටිරියල් ඉන්ඩස්ට්‍රීරස් සමූහය විසින් අධීක්ෂණය කරන ලද පූර්ණ කාලීන මහජන පළාත් වෘත්තීය විද්‍යාලයක් වේ. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (VTASL) යනු රාජ්‍ය අංශයේ විශාලතම වත්තීය පුහුණු ජාලයට හිමිකම් කියන ආයතනයකි.

ඉහත ආයතන ත්‍රිත්වය අතර සුහද ඇරයුම පරිදි ඊ-වාණිජ්‍යය පුහුණු පාඨමාලාව සඳහාම මූලික අදියර 2017 වසරේ දී ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා පුහුණු මධ්‍යස්ථානයක් නොමිලේ ලබාදීම හා එම සිසුනට චීනයේ ප්‍රායෝගික පුහුණුව, චීන භාෂාව හා ව්‍යවසායකත්ව පුහුණුව ද ලබාදීමට මෙම ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘතිය 2018 වසර තුල ක්‍රියාත්මක කිරීමට නියමිතය.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය

ආදායම්	සටහන	2017 රු.	2016 රු.	2015 රු.
භාණ්ඩාගාර ප්‍රදාන	01	123,422,576	111,334,030	89,250,310
ව්‍යාපෘති ප්‍රදාන	02	56,517,948	43,498,836	27,484,163
ඉපයූ මෙහෙයුම් ආදායම්	03	17,551,157	12,892,261	10,118,202
මූල්‍ය ප්‍රදාන ආපසු ලැබීම්				
ඉපයූ මෙහෙයුම් නොවන ආදායම්	04	320,888	334,786	208,250
		197,812,569	168,059,913	127,060,925
සේවක ණය පොළි ආදායම්	05	831,614	569,400	455,174
ස්ථාවර වත්කම් විකුණුම් ලාභ				
		198,644,183	168,629,313	127,516,099
කල් දැමූ ආදායම්		10,287,724	10,709,174	12,124,776
		208,931,907	**179,338,487**	**139,640,875**
වියදම්				
පාලක මණ්ඩල සහ කළමණාකරන කමිටු දීමනා	06	334,881	969,480	547,500
පුද්ගලික පාරිශ්‍රමික	07	60,526,230	59,632,035	48,378,802
ගමන් වියදම්	08	2,393,790	1,813,492	1,689,008
සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය	09	7,888,983	6,638,910	6,178,919
නඩත්තු වියදම්	10	5,661,316	3,996,515	3,985,584
පුනරුත්තාපන වියදම්	11	630,359	1,443,053	1,243,542
ගිවිසුම්ගත සේවා	12	13,203,376	10,757,571	10,010,560
මෙහෙයුම් වියදම්	13	49,830,111	51,936,841	26,533,239
		140,469,046	137,187,897	98,567,154
ව්‍යාපෘති වියදම්	14	49,797,969	42,166,573	27,526,270
		190,267,015	179,354,470	126,093,424
වර්ෂය සඳහා ක්ෂය	15			12,124,776
		190,267,015	179,354,470	138,218,200
වෙන්කිරීම්වලට පෙර ශුද්ධ අතිරික්තය/ ඌණතාවය		18,664,892	-15,982	1,422,675
පාරිතෝෂික වෙන්කිරීම්		1,752,096		3,370,479
				141,588,679
වෙන්කිරීම්වලට පසු ශුද්ධ අතිරික්තය /ඌණතාවය		**16,912,796**	**-15,982**	**(1,947,804)**

කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලදි.

ඒ.එස්.අමරසිංහ
නියෝජ්‍ය මුදල් අධ්‍යක්ෂිකා

ජේ.එම්.සී.එම්.ජයවර්ධන මැණිකේ
අධ්‍යක්ෂ ජනරාල්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

වත්කම්	සටහන	2017 රු.	2016 රු.	2015 රු.
ජංගම නොවන වත්කම්				
ශුද්ධ ස්පෘශ්‍ය වත්කම්	15	34,567,929	34,880,154	35,772,126
ජංගම වත්කම්				
ණයගැතියෝ	16	9,223,344	7,882,420	7,456,701
තැන්පත් සහ ලැබීම්	17	9,977,296	5,087,031	4,053,559
ඉතිරි තොගය - ශිෂ්‍ය වාර්ථා පොත්	18	2,258,857	1,319,100	549,963
මුදල් හා මුදල් සමකය	19	17,476,470	17,551,752	8,665,511
		38,935,967	31,840,303	20,725,734
මුළු වත්කම්		**73,503,896**	**66,720,457**	**56,497,860**
හිමිකම හා වගකීම්				
		175,452	175,452	175,452
සමුච්චිත අරමුදල	20	14,799,749	299,124	(1,316,891)
මෙහෙයුම් සංචිත		14,975,201	474,576	(1,141,439)
ජංගම නොවන වගකීම්	21	34,567,929	34,880,154	35,772,126
කල් දැමූ ආදායම්		13,710,352	11,968,256	12,985,188
පාරිතෝෂික ප්‍රතිපාදන (උප ලේඛන -01)		48,278,281	46,848,410	48,757,314
		63,253,482	47,322,986	47,615,875
	22	455,130	7,175,841	1,683,702
ජංගම වගකීම්	23	9,795,284	12,221,630	7,198,283
ණයහිමියෝ		10,250,414	19,397,471	8,881,985
ගෙවිය යුතු				
මුළු වගකීම්		**73,503,896**	**66,720,457**	**56,497,860**

කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලදි.

ඒ.එස්.අමරසිංහ
නියෝජ්‍ය මුදල් අධ්‍යක්ෂිකා

ජේ.එම්.සී.එම්.ජයවර්ධන මැණිකේ
අධ්‍යක්ෂ ජනරාල්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2017 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල	මෙහෙයුම් සංචිත	එකතුව
	රු	රු	රු
2015.01.01 දිනට ශේෂය	175,452	625,948	801,400
පෙර වර්ෂ ගැලපුම්		4,972	4,972
ස්ථාවර තැන්පත් පොලි ආදායම ගැලපුම			-
ආරම්භක ශේෂ ගැලපුම		(7)	(7)
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය		**(1,947,804)**	**(1,947,804)**
2016.01.01 දිනට ශේෂය	175,452	(1,316,891)	(1,141,439)
පෙර වර්ෂ ගැලපුම්		33,731	33,731
වෘත්තීය මාර්ගෝපදේශන		1,378,797	1,378,797
ආරම්භක ශේෂ ගැලපුම		219,469	219,469
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය		**(15,982)**	**(15,982)**
2016.01.01 දිනට ශේෂය	175,452	299,124	474,576
ක්ෂය නිවැරදි කිරීම		1,157,183	1,157,183
පෙර වර්ෂ ගැලපුම්		195,539	195,539
අතිරික්ත/ඌණතාව ගැලපුම්		(3,764,893)	(3,764,893)
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය		**16,912,796**	**16,912,796**
2017.12.31 දිනට ශේෂය	**175,452**	**14,799,749**	**14,975,201**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2017.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය	2017 රු.	2016 රු.	2015 රු.
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය	16,912,796	(15,982)	(1,947,804)
වත්කම් විකුණුම් ලාභය			
මූල්‍ය නොවන සිද්ධීන්			
පෙර වර්ෂ ගැලපීම්	1,157,183	1,378,797	4,972
ක්ෂය කිරීම්	10,287,724	10,709,174	12,124,776
ආරම්භක ශේෂ වෙනස ගැලපීම්	195,538	(1)	(7)
ගැලපුම්	(3,764,893)	219,469	
පාරිතෝෂික වෙන් කිරීම්	1,742,096	(1,016,932)	3,370,479
කල්දැමූ ආදායම	(312,225)	(891,972)	(10,474,824)
	26,218,219	10,382,553	3,077,592
පොළී ආදායම්			455,174
පාරිතෝෂික ගෙවීම්			
කාරක ප්‍රාග්ධන වෙනස ගැලපීමට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වල වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	26,218,219	10,382,553	2,622,418
ණයගැතියෝ (අඩුවීම/වැඩිවීම)	(1,340,924)	-425739	(119,439)
තැන්පත් සහ ලැබීම් (අඩුවීම/වැඩිවීම)	(4,890,265)	(1,033,472)	(41,873)
ඉතිරි තොගය (අඩුවීම/වැඩිවීම)	(939,757)	(769,137)	240,910
ණයහිමියෝ (අඩුවීම/වැඩිවීම)	(6,720,711)	5,492,139	(1,391,092)
ගෙවිය යුතු වියදම්සහ තැන්පතු (අඩුවීම/වැඩිවීම)	(2,426,346)	5,023,347	(249,309)
	(16,318,003)	8,287,138	(1,560,803)
පොළී ආදායම්			455,174
මෙහෙයුම් ක්‍රියාකාරකම් වල වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	9,900,216	18,669,711	1,516,789
ආයෝජන වලින් වූ මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම	(9,975,499)	(9,683,470)	(1,649,952)
වත්කම් ඉවත් කිරීමේ ශුද්ධ අගය			
වත්කම් ඉවත් කිරීමේ මුදල් ප්‍රවාහය			

ආයෝජන වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(9,975,499)	(9,683,470)	(1,649,952)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය			
මහාභාණ්ඩාගාරයට මාරුකිරීම්			
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය			
වසර තුල මුදල් හා මුදල් සමකය	(75,282)	8,886,241	(133,163)
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමකය	17,551,752	8,665,511	8,798,674
වසර අවසානයේ වූ මුදල් හා මුදල් සමකය	**17,476,470**	**17,551,752**	**8,665,511**
බැංකු ගත මුදල් ශේෂය			
මහජන බැංකුව - ගිණුම් අංකය -078-1001-72266044	8,159,707	5,247,176	4,364,813
මහජන බැංකුව - ගිණුම් අංකය -078-1001- 42266050	4,208,448	7,976,652	38,712
මහජන බැංකුව - ගිණුම් අංකය - 078- 1001- 12268324	550,011	180,789	365,062
ඉතුරුම් තැන්පත්	4,558,304	4,147,135	3,896,924
	17,476,470	**17,551,752**	**8,665,511**

කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලදි.

ඒ.එස්.අමරසිංහ
නියෝජ්‍ය මුදල් අධ්‍යක්ෂිකා

ජේ.එම්.සී.එම්.ජයවර්ධන මැණිකේ
අධ්‍යක්ෂ ජනරාල්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	උපසටහන	2017 රු.	2016 රු.	2015 රු.
01. භාණ්ඩාගාර ප්‍රදාන				
පුනරාවර්තන		119,850,000	104,000,000	82,200,000
ප්‍රාග්ධන ප්‍රදාන - පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම්	1.1	640,000	1,560,000	1,235,000
ප්‍රාග්ධන ප්‍රදාන - වත්කම්අත්පත් කරගැනීම්	1.2	9,627,424	4,453,970	999,690
ප්‍රාග්ධන ප්‍රදාන - හැකියා ගොඩනැගීම	1.3	2,932,576	5,774,030	5,815,310
		133,050,000	115,788,000	90,250,000
අඩුකලා- කල්දැමු ආදායමට මාරුකිරීම්		9,627,424	4,453,970	999,690

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	උපසටහන	2017 රු.	2016 රු.	2015 රු.
මහාභාණ්ඩාගාරය වෙත නැවත ගෙවීම්				
		123,422,576	**111,334,030**	**89,250,310**
02. ව්‍යාපෘති ප්‍රදාන				
ජා.කම්කරු සංවිධානයේ ප්‍රදාන	2.1			**162,800**
කෙටිකාලීන වැඩසටහන් (දේශීය)	2.2	17,322,377	9,243,043	291,127
නිපුණතා ආංශික සංවර්ධන	2.3	39,195,571	34,255,793	27,030,236
		56,517,948	**43,498,836**	**27,484,163**
03. මෙහෙයුම් ආදායම්				
ආයතන ලියාපදිංචි ගාස්තු	3.1	1,551,047	1,901,300	1,792,200
ප්‍රතීතන ගාස්තු	3.2	1,410,000	3,371,900	2,097,300
ජාතික වෘත්තිය සුදුසුකම් සහතික මුද්‍රණය	3.3	12,393,192	4,803,385	4,140,790
ඇගයුම් නිලධාරීන් ලියාපදිංචි ගාස්තු	3.4	73,739	56,500	369,250
ප්‍රකාශන විකිණීම	3.5	861,500	1,517,847	556,766
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් ශුද්ධ ආදායම	3.6	1,261,680	1,241,329	1,161,896
		17,551,158	**12,892,261**	**10,118,202**
04. මෙහෙයුම් නොවන ආදායම්				
අබලි ද්‍රව්‍ය විකිණීම		6,133	37,495	
ඉදිරිපත් නොකළ චෙක්පත්				
අනුයුක්ත කරන ලද වාහන වෙනුවෙන් ගාස්තු අය කිරීම		20,500	45,451	43,149
ආපසු නොගෙවිය යුතු තැන්පතු මුදල්		6,000	10,500	-
වෙනත්ආදායම්				2,400
අවලංගුකරන ලද චෙක්පත්				56,687
දුරකථන ගාස්තු අයකරගැනීම්		288,255	241,430	106,014
		320,888	**334,876**	**208,250**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	උපසටහන	2017 රු.	2016 රු.	2015 රු.
05. කාර්ය මණ්ඩල ණය පොලී ආදායම්				
කොමිෂන් සභා ණය පොලී		39,772	79,853	52,185
ආපදා ණය පොලී		379,658	237,506	215,908
විශේෂ අත්තිකාරම්පොලී		1,015	1,830	1,701
සුඵාවර තැන්පත් පොලී		411,169	250,211	185,380
		831,614	**569,400**	**455,174**
06.පාලක මණ්ඩල සහ කළමණාකරන කමිටු දීමනා				
පාලක මණ්ඩල දීමනා		244,888	802,500	459,000
කළමණාකරන කමිටු දීමනා		89,993	166,980	88,500
		334,881	**969,480**	**547,500**
07. පෞද්ගලික පඩිනඩි				
වැටුප් හා වේතන		47,807,117	49,008,089	39,245,377
සේවක අර්ථ සාධක අරමුදල		7,501,011	5,685,581	4,848,704
සේවක භාරකාර අරමුදල		1,356,698	1,440,940	1,211,680
අතිකාල හා නිවාඩු දින දීමනා		1,579,155	1,260,925	892,541
පුහුණු දීමනා		1,307,250	1,336,500	1,753,000
සභාපති දීමනා		975,000	900,000	427,500
		60,526,231	**59,632,035**	**48,378,802**
08. ගමන් වියදම්				
දේශීය		435,410	468,646	321,364
විදේශීය		1,958,380	1,344,845	1,367,644
		2,393,790	**1,813,491**	**1,689,008**
09. සැපයුම් හා පරිභෝජන				
මුද්‍රණ ලිපි ද්‍රව්‍ය	9.1	4,540,038	3,258,382	3,548,095
ඉන්ධන - ලිහිසි තෙල්	9.2	1,389,337	2,348,666	1,767,366
ප්‍රවාහන වියදම්		21,514	8,863	11,948
නිළ ඇඳුම්		124,000	126,000	90,000
පුවත්පත්		119,170	115,020	94,425
අනිකුත් සේවා ගාස්තු		1,239,430	171,516	286,588
සංග්‍රහ වියදම්		216,239	314,533	262,207
ජායාපිටපත් මුද්‍රණ ගාස්තු		2,500	5,500	2,900
සුභ සාධන වියදම්		236,755	290,430	115,390
		7,888,983	**6,638,910**	**6,178,919**

	උපසටහන	2017 රු.	2016 රු.	2015 රු.
10. නඩත්තු වියදම්				
වාහන නඩත්තුහා රක්ෂණ වියදම්	10.3	4,590,028	3,447,090	3,217,620
යන්ත්‍ර සූත්‍ර නඩත්තු වියදම්		466,639	141,053	180,358
ගොඩනැගිලි නඩත්තු වියදම්		206,200	23,861	145,278
පරිගණක සේවා		268,365	217,195	105,501
යාන්ත්‍රික හා විදුලි උපකරණ		34,234	106,161	286,011
නඩත්තු වියදම්		95,851	61,155	50,816
		5,661,316	**3,996,515**	**3,985,584**
11. පුනරුත්තාපන වියදම්				
වාහන පුනරුත්තාපන වියදම්		239,660	915,550	555,705
යන්ත්‍ර පුනරුත්තාපන වියදම්			459,800	385,333
ගොඩනැගිලි පුනරුත්තාපන වියදම්		390,699	67,703	302,504
		630,359	**1,443,053**	**1,243,542**
12. ගිවිසුම්ගත සේවා				
දුරකථන ගාස්තු		3,601,843	2,584,912	1,925,928
තැපැල් වියදම්		310,816	526,870	356,474
විදුලි වියදම්		2,382,769	2,740,253	2,815,787
ජල ගාස්තු		222,332	157,463	182,008
වරිපනම්		171,360	190,400	131,040
ආරක්ෂක සේවා		1,129,013	1,231,650	1,231,650
පවිත්‍රතා සේවා		1,218,445	1,329,267	1,329,247
විගණන ගාස්තු			250,000	250,000
නීති ගාස්තු			162,500	75,000
වාර සඟරා සාමාජික ගාස්තු		3,000		-
සාමාජික ගාස්තු -දේශීය		46,300	46,129	31,250
සාමාජික ගාස්තු -විදේශීය		13,484		13,777
කාර්යය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය		495,796	860,371	936,546
රක්ෂණ (මාර්ගස්ත මුදල්)		14,366	13,480	13,929
සේවා ගිවිසුම්		401,026	664,276	717,924
මාරු ගිණුම්		3,192,826		
		13,203,376	**10,757,571**	**10,010,560**
13. මෙහෙයුම් වියදම්				
ඇඟයීම හා ලියාපදිංචිය	13.1	142,430	853,701	863,217
මූල්‍ය ප්‍රදාන	13.2	1,658,780	1,318,435	3,477,557
ප්‍රතිනත වැඩසටහන්	13.3	379,092	1,041,279	1,654,933
ජාතික වෘත්තිය සුදුසුකම් වැඩසටහන්	13.4	32,950,571	31,380,277	15,195,262

		උපසටහන	2017 රු.	2016 රු.	2015 රු.
වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම		13.5	18,504	2,607,538	1,571,360
පලාත් වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් සංවර්ධනය			2,274,710	526,938	290,025
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය වියදම්		13.6		1,440,947	1,348,586
තත්ව කළමණාකරන පද්ධති			535,775		
නිපුණතා සම්මත සංවර්ධනය			473,045	1,029,666	1,346,130
පර්යේෂණ වියදම්			35,090	867,750	492,785
මූල්‍ය ප්‍රදාන නැවත ඇගයීම			752,445	43,800	134,246
පරිවර්ථන ගාස්තු				117,336	158,388
ප්‍රතිපත්ති ලියවිලි පිළියෙල කිරීම			10,287,724		750
වාර්ෂික ක්ෂය			49,830,111	10,709,174	
			51,936,841	**51,936,841**	**26,533,239**
14. ව්‍යාපෘති වියදම්					
ජා.කම්කරු සංවිධානය(නිපුනතා සම්මත)		14.1			162,800
කෙටිකාලීන වැඩසටහන් වියදම් (දේශීය)		14.2	12,573,088	7,910,780	333,234
නිපුණතා ආංශික සංවර්ධන		14.3	37,224,881	34,255,793	27,030,236
			49,797,969	**42,166,573**	**27,526,270**
15. දේපල පිරියත හා උපකරණ	**සටහන්**	**01.01.2017**	**මිලදී ගැනීම්**	**විකුණුම්**	**31.12.2017**
වාහන	15.1	68,451,255			68,451,255
ලීබඩු සහ සවිකිරීම්	15.2	5,251,795	664,259		5,916,054
පිරියත හා උපකරණ	15.3	470,746	6,760,412		7,231,158
කාර්යාල උපකරණ	15.4	8,424,958	804,080		9,229,038
පරිගණක හා උපාංග	15.5	27,382,256	854,290		28,236,546
පුස්තකාල පොත්	15.6	901,392	52,458		953,850
නාම පුවරු	15.7	519,290	-		519,290
මෘදුකාංග	15.8	6,944,979	840,000		7,784,979
		18,346,671	**9,975,499**		**128,322,170**
	%	**01.01.2014**	**වසර සඳහා**	**විකුණුම්**	**31.12.2017**
වාහන	25%	50,633,558	4,454,424		55,087,982
ලීබඩු සහ සවිකිරීම්	10%	2,970,222	254,381		3,224,603
පිරියත හා උපකරණ	25%	269,228	1,059,924		1,329,152
කාර්යාල උපකරණ	25%	4,716,906	977,267		5,694,173
පරිගණක හා උපාංග	33%	18,439,559	3,044,802		21,484,361
පුස්තකාල පොත්	25%	695,764	51,812		747,576
නාම පුවරු	25%	421,543	24,436		445,979
මෘදුකාංග	25%	5,319,738	420,678		5,740,416

	උපසටහන	2017 රු.	2016 රු.	2015 රු.
	83,466,518	10,287,724		93,754,242
	34,880,153			**34,567,929**
	උපසටහන	**2017 රු.**	**2016 රු.**	**2015 රු.**
16. ණය ගැතියෝ				
මෙහෙයුම් ණය ගැතියෝ	16.1	304,695	304,695	285,195
සේවක ණය	16.2	8,918,649	7,577,725	7,171,506
		9,223,344	7,882,420	7,456,701
17. තැන්පත් සහ ලැබීම්				
කාර්ය මණ්ඩල අත්තිකාරම්		8,498,349	488,527	481,287
පිටස්තර පාර්ශවයන්ගෙන් අයවිය යුතු	17.1		2,988,766	2,680,769
කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු අගයන්		279,855	444,679	236,179
කලින් ගෙවීම්	17.2	11,556	74,092	11,169
අයවිය යුතු දුරකථන ගාස්තු		470,802	23,754	17,303
ජාතික වෘත්තිය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්	17.3	716,733	1,067,213	500,352
අත්තිකාරම් ගෙවීම්(රාජ්‍ය අංශ)				126,500
		9,977,296	**5,087,031**	**4,053,559**
18. අවසන් තොගය				
ඉතිරි තොගය - ශිෂ්‍ය වාර්ථා පොත්		**2,258,857**	**1,319,100**	**549,963**
19. මුදල් හා මුදල් සමකය				
මහජන බැංකුව - ගිණුම් අංකය - 078 - 1001 - 72266044		8,159,707	5,247,176	4,364,813
මහජන බැංකුව - ගිණුම් අංකය - 078 - 1001 - 12268324		4,208,448	7,976,652	38,712
මහජන බැංකුව - ගිණුම් අංකය - 078 - 1001 - 42266050		550,011	180,789	365,062
ඇමතුම් තැන්පත්		4,558,304	4,147,135	3,896,924
		17,476,470	**17,551,752**	**8,665,511**
20. මෙහෙයුම් සංචිත				
ආරම්භක ශේෂය		299,124	-1,316,891	625,948
ස්ථාවර තැන්පතු පොලි ගැලපුම			33,731	
අතිරික්ත/ඌණතාවයන් ගැලපුම්		-3,764,893	219,469	
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය		16,912,796	-15,982	(1,947,804)
ආරම්භක ශේෂ ගැලපුම්		195,538		(7)
පෙර වර්ෂ ගැලපුම්		1,157,183	1,378,797	4,972

	උපසටහන	2017 රු.	2016 රු.	2015 රු.
		14,799,749	**299,124**	**(1,316,891)**
21. කල් දැමූ ආදායම				
ආරම්භක ශේෂය		34,880,154	35,772,126	46,246,950
ගැලපුම්			33,732	
		34,880,154	35,805,858	46,246,950
වත්කම් අත්පත්කරගැනිම්		9,975,499	4,453,970	650,262
වත්කම් අත්පත්කරගැනිම් - ව්‍යාපෘති			5,329,500	999,690
		44,855,653	45,589,328	47,896,902
වත්කම් ඉවත් කිරිම්				
		44,855,653	45,589,328	47,896,902
මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශයට මාරු කිරිම්		-10,287,724	-10,709,174	(12,124,776)
		34,567,929	**34,880,154**	**35,772,126**
22. ණයහිමියෝ				
මෙහෙයුම් ණය හිමියෝ	22.1		7,175,841	1,683,702
23. ගෙවිය යුතු තැන්පතු සහ වියදම්				
මහාභාණ්ඩාගාරය වෙත නැවත ගෙවීම්	23.1	1,587,308	600,087	151,566
ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීම්	23.2	78,328	48,251	129,251
ගෙවිය යුතු ව්‍යාපෘති ප්‍රදාන	23.3	4,859,767	4,768,448	3,669,455
ගෙවිය යුතු පෞද්ගලික පඩිනඩි	23.4	20,683	950,530	7,229
ටෙන්ඩර් තැන්පතු		592,994	181,428	70,300
විගණන ගාස්තු		1,170,080	1,170,080	920,080
රදවාගත් තැන්පතු		563,491	162,091	85,110
නිපුණතා සම්මත සංවර්ධනය				-
තත්ව කළමණාකරන පද්ධති තැන්පතු		15,000	15,000	15,000
පර්යේෂණ වියදම්			3,427,229	1,459,848
උපචිත වියදම්		49,536	743,524	
චෙක්පත් අවලංගු කිරීම්		662,575	70,367	
වෘත්තීය පුහුණු අධිකාරිය		110,927		
ගෙවිය යුතු මූල්‍ය ප්‍රදාන		84,595	84,595	
		1,658,780		
		9,795,284	**12,221,630**	**6,507,839**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2017.12.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ උප සටහන්

	2017 රු.	2016 රු.	2015 රු.
2.1 ජාත්‍යන්තර කම්කරු සංවිධාන ප්‍රදාන			
පුහුණු සැලසුම් සංවර්ධනය			**162,800**
2.2. කෙටිකාලීන වැඩසටහන් (දේශීය)			
යෞවන කටයුතු අමාත්‍යංශය		5,147,654	
විදේශ වැඩසටහන්		191,238	291,127
කෙටිකාලීන වැඩසටහන් (දේශීය)	4,272,220	978,500	
Touch your future වැඩසටහන	13,050,158	717,060	
WUSC වැඩසටහන		732,350	
බංගලාදේශ වැඩසටහන		171,241	
UNFPA		1,305,000	
	17,322,378	**9,243,043**	**291,127**
2.3. නිපුණතා ආංශික සංවර්ධන			
නිපුණතා ආංශික සංවර්ධන	**39,195,571**	**34,255,793**	**27,030,236**
3.1 ආයතන ලියාපදිංචි ගාස්තු			
ආයතන ලියාපදිංචි ගාස්තු	1,536,147	1,847,500	1,782,000
ආයතන වර්ග කිරීමේ ගාස්තු		1,000	1,500
ආයතන ලියාපදිංචි ප්‍රමාද ගාස්තු	14,900	52,800	8,700
	1,551,047	**1,901,300**	**1,792,200**
3.2 ආයතන ප්‍රතීතන ගාස්තු			
ආයතන ප්‍රතීතන ගාස්තු	1,410,000	1,881,900	1,672,300
ආයතන ඇගයීම් ගාස්තු		1,490,000	425,000
	1,410,000	**3,371,900**	**2,097,300**
3.3 ජාතික වෘත්තිය සුදුසුකම් සහතික මුද්‍රණාදායම			
ජාතික වෘත්තිය සුදුසුකම් සහතික මුද්‍රණාදායම	967,240	1,958,190	1,568,830
ජාතික වෘත්තිය සුදුසුකම් සහතික නැවත මුද්‍රණාදායම	52,725	45,225	27,600
ජාතික වෘත්තිය සුදුසුකම් සහතික පිටපත් මුද්‍රණාදායම	57,950	18,000	11,500
ජාතික වෘත්තිය සුදුසුකම් සැසඳුම් ආදායම	252,687	205,000	119,000
ජාතික වෘත්තිය සුදුසුකම් සහතික මුලික මුද්‍රණාදායම		661,220	128,800
තනිව කළමණාකරන පද්ධති ඇගයුම්	419,500		
ජාතික වෘත්තිය සුදුසුකම් ඇගයුම් ආදායම	20,000	211,000	
විභාග ගාස්තු	10,623,090	1,704,750	2,285,060
	12,393,192	**4,803,385**	**4,140,790**

	2017 රු.	2016 රු.	2015 රු.
3.4 ඇගයුම් නිළධාරීන් ලියාපදිංචි ගාස්තු			
ඇගයුම් නිළධාරීන් ලියාපදිංචි ගාස්තු	73,739	56,500	57,250
ඇගයුම් බලපත්‍ර ගාස්තු			312,000
	73,739	**56,500**	**369,250**
3.5 ප්‍රකාශන විකිණීම			
ජාතික නිපුනතා සම්මත විකිණීම		45,000	149,250
විෂය මාලා විකිණීම	477,475	685,275	509,675
වෘත්තිය පුහුණු සැලසුම් විකිණීම	1,000	8,000	7,800
වෘත්තිය පුහුණු මාර්ගෝපදේශන අත්පොත් විකිණීම	2,500	16,900	11,000
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශන විකිණීම	1,350	20,400	9,450
මාර්ගෝපදේශන විකිණීම	379,175	803,850	-
	861,500	1,579,425	687,175
අඩුකලා ජාතික නිපුනතා සම්මත විකුණුම් වියදම්			
ජාතික නිපුනතා සම්මත මුද්‍රණ වියදම්		27,900	97,500
ජාතික නිපුනතා සම්මත විකුණුම් කොමිස් වියදම්		33,678	32,909
	861,500	**1,517,847**	**556,766**
3.6 ශිෂ්‍ය වාර්ථා පොත් විකිණීම			
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් ආදායම	3,028,080	3,296,275	2,683,975
අඩු කලා - විකුණුම් වියදම			
ආරම්භක තොගය	614,842	549,963	790,873
ශිෂ්‍ය වාර්ථා පොත්මුද්‍රණ වියදම	1,988,010	1,955,800	1,143,500
ශිෂ්‍ය වාර්ථා පොත්විකුණුම් වියදම		164,025	137,669
	2,602,852	2,669,788	2,072,042
අඩු කලා - ඉතිරි තොගය	836,452	614,842	549,963
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් වලට අදාල මුලු වියදම	1,766,400	2,054,946	1,522,079
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් ශුද්ධ ආදායම	**1,261,680**	**1,241,329**	**1,161,896**
9.1 මුද්‍රණ ලිපි ද්‍රව්‍ය			
ලිපි ද්‍රව්‍ය	2,108,750	2,639,879	2,723,716
මුද්‍රණ වියදම්	849,592	198,528	123,370
පුවත්පත් දැන්වීම්	1,581,696	419,975	701,009
	4,540,038	**3,258,382**	**3,548,095**
9.2 ඉන්ධන - ලිහිසි තෙල්			
අනුයුක්ත වාහන සඳහා ඉන්ධන - ලිහිසි තෙල්	836,944	1,318,549	1,015,193
සංචිත වාහන සඳහා ඉන්ධන - ලිහිසි තෙල්	552,393	1,030,117	752,173
	1,389,337	**2,348,666**	**1,767,366**
10.3 වාහන නඩත්තුහා රක්ෂණ වියදම්			
වාහන නඩත්තු KE-0488	359,625	120,165	211,623
වාහන නඩත්තු KB-9869	235,200	162,862	263,297

	2017 රු.	2016 රු.	2015 රු.
වාහන නඩත්තු KF-6350	565,087	389,502	290,123
වාහන නඩත්තු KF-7354	59,410	68,353	83,077
වාහන නඩත්තු 18-1901	40,464	14,037	10,909
වාහන නඩත්තු PB-4729	275,118	209,968	415,244
වාහන නඩත්තු 57-7603	167,635	184,589	153,548
වාහන නඩත්තු PD-2405	293,713	204,415	445,299
වාහන නඩත්තු KR-7697	228,343	181,381	30,797
වාහන නඩත්තු KS-2350	275,463	266,495	263,026
වාහන නඩත්තු KS-2645	328,295	210,354	230,870
වාහන නඩත්තු NB-2942	512,714	370,774	314,574
වාහන නඩත්තු PE-0572	488,707	381,947	289,885
වාහන නඩත්තු NC -0021	485,860	234,221	104,706
වාහන නඩත්තු PF -6302	274,394	448,027	110,642
	4,590,028	**3,447,090**	**3,217,620**
13.1 ආයතන ලියාපදිංචි වියදම්			
ආයතන ලියාපදිංචි සහ ඇගයුම් වියදම		780,286	774,457
ඉන්ධන වියදම්	9,180	52,445	76,360
ආයතන ලියාපදිංචි සහ ඇගයුම් වැඩසටහන් වියදම්	133,250	20,970	12,400
	142,430	**853,701**	**863,217**
13.2 මූල්‍ය ප්‍රදාන			
රාජ්‍ය අංශය සඳහා මූල්‍ය ප්‍රදාන		126,500	1,509,929
පුද්ගලික අංශය සඳහා මූල්‍ය ප්‍රදාන	1,658,780	856,835	795,973
පීඩාවට පත් අය සඳහා මූල්‍ය ප්‍රදාන		335,100	1,171,655
	1,658,780	**1,318,435**	**3,477,557**
13.3 ප්‍රතිතන වියදම්			
පාඨමාලා ඇගයුම් ගාස්තු	319,010	819,400	676,832
ඉන්ධන වියදම්	59,700	163,879	177,727
ප්‍රතිතන වැඩසටහන්	382	58,000	800,374
	379,092	**1,041,279**	**1,654,933**
13.4 ජාතික වෘත්තිය සුදුසුකම් වැඩසටහන්			
ජාතික වෘත්තිය සුදුසුකම් වැඩසටහන්	236,288	610,560	656,682
ජාතික වෘත්තිය සුදුසුකම් ඇගයුම් සහයන්	377,065	803,803	569,152
ප්‍රවර්ධන වැඩසටහන්	576,756	123,850	558,155
තත්ව කළමණාකරණ පද්ධති/එස් 5 වැඩසටහන්	109,995	163,616	122,100
ජාතික වෘත්තිය සුදුසුකම් ඇගයුම් ගාස්තු	23,627,595	24,872,078	11,041,789
විභාග ගාස්තු	4,747,235	2,268,500	1,553,184
ජාතික වෘත්තිය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්	2,417,712	2,107,870	694,200
ජාතික වෘත්තිය සුදුසුකම් පරිගණක පද්ධති		430,000	
ඇගයුම් බලපත්‍රගාස්තු	68,975		

	2017 රු.	2016 රු.	2015 රු.
පසුවිමසුම් ගාස්තු	562,300		
ඇගයුම්විගණනය	226,650		
	32,950,571	**31,380,277**	**15,195,262**
13.5 වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් පිළියෙල කිරීම			
වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් (නව)	18,504	690,098	1,571,360
වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් (යාවත්කාලීන)		1,917,440	
	18,504	**2,607,538**	**1,571,360**
13.6 ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය වියදම්			
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය/ප්‍රවෘත්ති ලිපි වියදම්	460,954	422,756	582,110
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශ දත්ත සැකසුම්	493,912	146,978	264,772
වෘත්තිය පුහුණු මාර්ගෝපදේශය	509,716	241,250	282,076
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය/ප්‍රවෘත්ති ලිපි තැපල් වියදම්	136,720	428,113	85,430
යුනිවොක් වියදම්	673,408	1,850	3,143
ශ්‍රම වෙළඳපොළ සමීක්ෂණය			131,055
	2,274,710	**1,240,947**	**1,348,586**
14.1 ජාත්‍යන්තර කම්කරු සංවිධාන වියදම් වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම			
වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම			162,800
			162,800
14.3 කෙටිකාලීන වැඩසටහන් (දේශීය)			
යුනිසෙෆ් වැඩසටහන			
අනාගතය පිළිබඳ වැඩසටහන	10,009,839	729,835	42,107
තරුණ සමුලුව			
යු.එන්.එපේ.පී.ඒ වැඩසටහන		1,325,973	
බංගලාදේශ වැඩසටහන		165,692	291,127
ඉංග්‍රිසි වැඩසටහන		5,007,654	
ඇපේගන් වැඩසටහන		63,650	
නේපාල වැඩසටහන		109,856	
WUSK වැඩසටහන		494,945	
යුනිවොක් වියදම්	2,563,249		
අනිකුත්		13,175	
	12,573,088	**7,910,780**	**333,234**
14.3 කෙටිකාලීන වැඩසටහන් (දේශීය)			
යුනිසෙෆ් වැඩසටහන			
අනාගතය පිළිබඳ වැඩසටහන	10,009,839	729,835	42,107
තරුණ සමුලුව			
යු.එන්.එපේ.පී.ඒ වැඩසටහන		1,325,973	
බංගලාදේශ වැඩසටහන		165,692	291,127

	2017 රු.	2016 රු.	2015 රු.
ඉංග්‍රිසි වැඩසටහන		5,007,654	
ඇපේගන් වැඩසටහන		63,650	
නේපාල වැඩසටහන		109,856	
WUSK වැඩසටහන		494,945	
අනිකුත්		13,175	
	10,009,839	**7,910,780**	**333,234**
14.4 නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය			
මූලික සමීක්ෂණ වියදම්		335,444	6,003,996
ආයතන ප්‍රතිනත	136,850	155,100	1,009,960
විෂයමාලා පිළියෙලකිරීම	2,368,998	240,801	844,939
තත්ව කළමණාකරණ පද්ධති	3,993,950	2,886,866	2,279,345
අනිකුත්	1,897,649	5,122,068	1,885,884
නිපුණතා වාර්ථා වියදම්	1,254,155	1,083,764	3,364,189
දීමනා	1,182,489	623,349	684,458
සේවක පුහුණුව හා සංවර්ධනය	3,588,429	4,148,355	10,402,224
පුහුණු ආයතන ලියාපදිංචිය	323,450	521,810	444,240
ඇගයුම් ගාස්තු	16,340	463,844	111,001
මෘදු නිපුණතා	42,450	1,957,951	
8වන මහළ සංවර්ධනය	8,454,616	1,315,075	
පර්යේෂණ වියදම්	726,015	968,035	
ක්ෂේත්‍ර සහා	11,641,174	14,201,077	
ඉංග්‍රිසි වැඩසටහන	1,598,318	232,254	
	37,224,883	**34,255,793**	**27,030,236**
16.1 මෙහෙයුම් ණය ගැතියෝ			
සකුරා පරිගණක ආයතනය	167,895	167,895	167,895
අනිකුත්	136,800	136,800	117,300
	304,695	**304,695**	**285,195**
16.2 කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්			
කොමිෂන් සහා ණය	1,012,319	1,332,488	1,565,151
ආපදා ණය	6,731,598	6,184,465	5,548,283
සුනාමි ණය	39,000	39,000	39,000
උත්සව අත්තිකාරම්	694,800	11,050	11,550
විශේෂ අත්තිකාරම්	67,522	10,722	7,522
සුනාමි ණය (2)	373,410		
	8,918,649	**7,577,725**	**7,171,506**
17.1 අත්තිකාරම්			
සේවක අත්තිකාරම්	2,340,132	488,527	481,287
අනිකුත් අත්තිකාරම්			
ව්‍යාපෘති අත්තිකාරම්- තොරතුරු සන්නිවේදන	1,395,342		

	2017 රු.	2016 රු.	2015 රු.
ව්‍යාපෘති අත්තිකාරම්- නිෂ්පාදන හා ඉංජිනේරු	4,491,870		
ව්‍යාපෘති අත්තිකාරම්- ඉදිකිරීම්	270,980		
ව්‍යාපෘති අත්තිකාරම්- සංචාරක	25		
	8,498,349	**488,527**	**481,287**
17.2 පිටස්තර පාර්ෂවයන්ගෙන් ලැබිය යුතු			
අනිකුත්			
යෞවන කටයුතු අමාත්‍යංශය		1,147,005	1,156,104
නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය		1,841,761	1,524,665
		2,988,766	**2,680,769**
17.3 කලින් ගෙවීම්			
කලින් ගෙවීම් - මාර්ගස්ථ මුදල් රක්ෂණ වාරික	11,556	11,556	11,169
සේවා ගිවිසුම්		62,536	
	11,556	**74,092**	**11,169**
17.4 ලැබිය යුතු ජාතික වෘත්තිය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්			
ජාතික ආධුණිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ ආයතනය	78,931	78,931	210,983
වෘත්තීය පුහුණු අධිකාරිය			38,180
ජාතික තරුණ සේවා සභාව	16,800	16,800	16,800
කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේදෙපාර්තමේන්තුව	254,988	254,988	159,639
ජර්මානු කාර්මික අධ්‍යාපනආයතනය	74,750	74,750	74,750
රාජ්‍ය නොවන සංවිධාන/පුද්ගලික හා රාජ්‍ය ආයතන	291,264	291,264	
	716,733	**716,733**	**500,352**
22.1 මෙහෙයුම් ණය හිමියෝ			
මෙහෙයුම් ණය හිමියෝ	455,130	7,175,841	1,683,702
සේවක			
අනිකුත්			
	455,130	**7,175,841**	**1,683,702**
23.1 මහාභාණ්ඩාගාරය වෙත ගෙවීම්			
රාජ්‍ය භාග ගෙවීම්	1,587,308	600,087	151,566
වැටුප් රහිත අයකරගැනීම්			-
	1,587,308	**600,087**	**151,566**
23.2 ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීම්			
රඳවා ගැනීම් බදු	43,700	10,700	50,900
මුද්දර බදු	34,628	36,600	9,000
වැටුප් මත බදු		951	69,351
	78,328	**48,251**	**129,251**

	2017 රු.	2016 රු.	2015 රු.
23.3 ගෙවිය යුතු ව්‍යාපෘති ලැබීම්			
රුහුණු ආර්ථික සංවර්ධන අධිකාරිය	48,923	48,923	48,923
ජාත්‍යන්තර කම්කරු සංවිධානය	3,103,402	3,103,402	3,103,402
කෙටිකාලීන වැඩසටහන් (විදේශීය)	1,703,950	1,612,631	471,531
කා.අ.සං.ව්‍යාපෘතිය	3,492	3,492	3,492
යෞවන කටයුතු අමාත්‍යංශය			42,107
	4,859,767	**4,768,448**	**3,669,455**
23.4 ගෙවිය යුතු පෞද්ගලික පඩිනඩි			
අතිකාල සහ නිවාඩු දින දීමනා	20,683	13,217	7,229
සේවක භාරකාර අරමුදල		122,258	-
සේවක අර්ථසාධක අරමුදල		815,055	-
	20,683	**950,530**	**-**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2017.12.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශ උප ලේඛන

උප ලේඛන 01 - පාරිතෝෂික වෙන්කිරීම්

නම	සේවා අංකය	පත්වීම් දිනය	වසර ගණන	වැටුප	පාරිතෝෂික වෙන්කිරීම
ඩබ්ලිව්. පී. එම්. පී. ප්‍රේමචන්ද්‍ර	2	2001.07.15	16	83,970.00	671,760
ඩබ්. පී. එස්. ඒ. කීර්ති	5	2001.02.01	16	33,282.00	266,256
එන්. ඩබ්. පී. එන්. පීවන්ත	6	2001.02.01	16	37,155.00	297,240
කේ. සිරිසේන	9	2001.02.05	16	30,262.00	242,096
ආර්. එන්. පී. සිල්වා	10	2001.03.01	16	33,282.00	266,256
ඩී. බී. ආර්. මංජුලා	11	2001.03.01	16	37,155.00	297,240
වයි. පී. එස්. උදයකාන්ති	12	2001.02.01	16	37,155.00	297,240
එම්. එන්. අසංක රංගන	15	2001.09.03	16	27,322.00	218,576
පී. කේ. හෑගොඩආරච්චි	20	2001.11.01	16	33,696.00	269,568
එම්. එල්. එන්. එස්. එදිරිසුරිය	22	2001.11.02	16	63,471.00	507,768
එච්. බී. ඉන්දික සම්පත්	24	2001.11.16	16	37,676.00	301,408
පී. එස්. අමරසේකර	25	2001.11.15	16	29,641.00	237,128
බී. කේ. එස්. දිනේෂ්	26	2001.11.16	16	29,641.00	237,128
පී. පී. අජිත් කුසුම්	28	2001.12.03	16	60,833.00	486,664
ඩබ්. එන්. ටී. අනුර වීරකෝන්	31	2002.07.01	15	60,833.00	456,248
එස්. විජේසේකර	40	2005.04.20	12	29,020.00	174,120
ඩබ්. වී. පී. සී. ජගත් කුමාර	41	2005.05.16	12	27,220.00	163,320
වපිර පෙරේරා	43	2005.06.15	12	78,716.00	472,296
ටී. සෙන්තුරන්	46	2005.01.04	12	55,557.00	333,342
පී. එම්. සී. පී. ගුණාතිලක	47	2005.01.18	12	48,292.00	289,752
ඩබ්. කේ. ඩී. හරිස්චන්ද්‍ර	48	2005.01.03	12	53,247.00	319,482
පී. ඒ. එම්. යූ. ගනේපොළ	49	2005.01.02	12	51,265.00	307,590
යූ. ඒ. පී. ධර්මසේන	51	2005.01.03	12	46,352.00	278,112
එම්. ඩී. චාමලී ද සිල්වා	56	2005.10.06	12	31,212.00	187,272
ආර්. ජේ. සමරවීර	57	2005.11.21	12	56,876.00	341,256
පී. බන්දුල	58	2006.02.20	11	29,020.00	159,610
ඒ. එස්. අමරසිංහ	60	2006.05.16	11	66,109.00	363,600
පී. පී. එස්. කුමාර	62	2006.07.14	11	26,922.00	148,071
එස්. යූ. කේ රූබසිංහ	65	2007.02.02	10	67,740.00	338,700
එම්. විද්‍යානපතිරණ	66	2007.02.02	10	55,557.00	277,785
ජේ. ඒ. ඩී. ජේ. ජයලත්	68	2007.08.01	10	77,148.00	385,740
පී. පී. පී. නානායක්කාර	70	2007.10.15	10	55,557.00	277,785
ඩබ්. ඒ. ඩබ්. සී. ප්‍රේමරත්න	71	2007.11.01	10	66,172.00	330,860
ඩබ්. ජේ. එල්. ඒ. දමයන්ති	72	2007.12.12	10	53,247.00	266,235
සද්ධා මංගල	73	2008.02.01	9	27,406.00	123,327
ආර්. පී. ඒ. ටී. කුමාර	74	2008.11.03	9	28,690.00	129,105
පහළට ගෙන යන ශේෂය					**10,719,935.00**

නම	සේවා අංකය	පත්වීම් දිනය	වසර ගණන	වැටුප	පාරිතෝෂික වෙන්කිරීම
ඉදිරියට ගෙන ආ ශේෂය					**10,719,935**
එන්. ඩී. විජේසේකර	75	2008.11.03	9	30,072.00	135,324
එස්. එස්. කල්පගේ	76	2008.11.03	9	27,241.00	122,585
පී. සී. ජේ. ද සිල්වා	78	2009.09.01	8	28,483.00	113,932
කේ. ටී. අමරසිංහ	80	2009.11.30	8	29,104.00	116,416
ඩී. එම්. එස්. ජේ. සිරිපාල	81	2009.11.30	8	28,897.00	115,588
චින්ද්‍යා හංසිනි	83	2011.04.05	6	28,069.00	84,207
කේ එස් සමීර	84	2011.08.01	6	27,034.00	81,102
පී. සී. එස්. එම්. නානායක්කාර	85	2011.08.01	6	27,034.00	81,102
බී. එස්. ජේ. විපුල්සි	86	2012.01.02	5	38,947.00	97,368
එච්. එම්. ඒ. ඩී. කේ. හේරත්	87	2012.01.02	6	47,301.00	141,903
ඩී. එන්. අයි. ඩී. ද සිල්වා	90	2012.01.02	5	44,454.00	111,135
චන්දි මේනකා	91	2012.03.01	5	27,862.00	69,655
ඒ. පී. ඉන්ද්‍රානි	92	2012.03.01	5	24,858.00	62,145
අයි. පී. කල්ප උදාර	93	2012.07.10	4	38,947.00	77,894
පී. මුතුකුමාරණ	94	2012.11.03	5	37,155.00	92,888
එච්. පී. කේ. එන්. බන්ඩාර	97	2013.02.01	4	48,292.00	96,584
සී. එච්. ඩබ්. දර්ශනිකා	98	2013.03.01	4	27,862.00	55,724
පී. පී. එස්. චතුරංගනී	99	2013.06.06	4	27,862.00	55,724
කේ. ඩී. එල්. පී. කරුනාදාස	101	2013.07.15	4	44,454.00	88,908
ටී. එල්. ඩබ්. මධුෂානි	103	2013.07.15	4	30,654.00	61,308
කේ. ඩබ්. ඒ. අනුරුද්ධිකා	104	2013.07.15	4	29,518.00	59,036
එන්. එල්. එස්. දයාරත්න	105	2013.09.02	4	25,546.00	51,092
බී. පී. එන්. කමල්ප්‍රිය	106	2013.09.10	4	26,476.00	52,952
උඩවත්ත සී.ජේ.	107	2014.01.16	3	37,155.00	55,733
දයාරත්න ඊ. ඩබ්. එස්. එම්.	108	2014.01.20	3	30,961.00	46,442
විජේබණ්ඩාර එච්. ආර්. එම්. යූ.	109	2014.01.27	3	44,454.00	66,681
මදන් ආර්.	110	2014.01.27	3	47,301.00	70,952
දෙල්පච්ත්‍ර එන්. ටී. කේ.	111	2017.01.30	3	29,104.00	43,656
ද. සිල්වා ඊ. ඒ. කේ.	112	2014.02.10	3	42,474.00	63,711
සමරවික්‍රම සී. සී. කේ.	116	2014.08.01	3	30,347.00	45,521
හදපාන්ගොඩ බී. සී.	117	2014.09.15	3	45,403.00	68,105
කුමාර එච්. එල්. කේ. එස්.	118	2014.09.22	3	26,290.00	39,435
කාරියවසම් පී. ඩී. එස්.	119	2014.10.01	3	53,247.00	79,871
ඒ. එච්. එන්. සදමාලි	122	2015.06.03	2	30,040.00	30,040
එච්. ඒ. ඩී. දර්ශිකා	123	2015.06.04	2	30,347.00	30,347
එල්. කේ. කොහොම්බන්	125	2015.06.06	2	30,040.00	30,040
එන්. එච්. එස්. දර්ශන	126	2015.06.07	2	30,040.00	30,040
එස්. බී. කරුණානායක	128	2015.06.08	2	28,897.00	28,897
පහළට ගෙන යන ශේෂය					**13,473,974**

නම	සේවා අංකය	පත්වීම් දිනය	වසර ගණන	වැටුප	පාරිතෝෂික වෙන්කිරීම
ඉදිරියට ගෙන ආ ශේෂය					**13,473,974**
බී. එල්. කේ .පී. සංදීපනි	129	2015.06.09	2	27,034.00	27,034
අයි. එම්. පී. එච්. ලක්මාල්	131	2015.07.08	2	24,858.00	24,858
එච්. එම්. වී. එන්. හේරත්	132	2015.07.22	2	28,897.00	28,897
පී. ඩබ්. එස්. භාෂිනි	136	2016.09.01	1	44,454.00	22,227
එන්. රාජපක්ස	137	2016.09.01	1	44,454.00	22,227
ඩබ්. පී. එස්. කුමාර	138	2016.09.01	1	44,454.00	22,227
ඊ. සී. යූ. ගුණතුංග	139	2016.09.01	1	44,454.00	22,227
ඩබ්. එම්. ඩබ්. බී. විජේසිංහ	140	2016.09.01	1	44,454.00	22,227
කේ. එම්. ඩී. එච්. ලක්මිණි	141	2016.09.01	1	44,454.00	22,227
එස්. එන්. බී. ඩබ්. එන්. ඩබ්. මන්ත්‍රිපාල	142	2016.09.01	1	44,454.00	22,227
					13,710,352

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විවිවඅ/ඊ/ටීවිඑසි/1/17/19 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 පෙබරවාරි 08 දින

Chairman, Director General, Deputy Director General
25 FEB 2019
TVEC

අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත් -
1. ලේකම් - නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ඊවිවඅ/ඊ/ඊවිඊසි/1/17/19

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019 පෙබරවාරි 08 දින

අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 50 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ 10(ඇ) (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි නිරණය කිරීමට මට නොහැකිය.

2 මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී වර්ෂයේ මෙහෙයුම් ලාභය තුල ඇතුළත් නොවූ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය තුල ගැලපුම් කර තිබූ පෙර වර්ෂ ගැලපුම් හා ආරම්භක ශේෂ

වෙනස්වීම් රු.1,352,722 ක් මෙහෙයුම් ලාභයට එකතුකර දක්වා තිබූ අතර රු.3,764,893 ක් අඩි/ඌන වෙන් කිරීම් ගැලපුම් ලෙස අඩුකර දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාලව විලම්බිත ආදායම් ලෙස රු.10,287,724 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබූ නමුත් මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී රු.312,225 ක් පමණක් ලාභයට ගැලපීම් කර තිබුණි.

(iii) ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා ලබා දී තිබූ භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන රු.9,627,424 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒම් ලෙස දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයෙහි 14 ඡේදය ප්‍රකාරව වත්කම් අයිතමයක හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් අස්ථිත්වය වෙත ගලා ඒමේ භව්‍යතාවක් ඇති විට වත්කම් ලෙස ගිණුම්ගත කලයුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස අටවන මහලේ සංවර්ධන කටයුතු සඳහා 2016 සහ 2017 වර්ෂවලදී වැය කර තිබූ පිළිවෙලින් රු.1,315,075 ක් හා රු.8,454,616 ක් පුනරාවර්තන වියදම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. ඒ අනුව, 2016 වර්ෂයේ ඌනතාවය රු.1,315,075 කින් අධිගණනය වී තිබූ අතර 2017 වර්ෂයේ අතිරික්තය රු.8,454,616 කින් ඌනගණනය වී තිබුණි.

(ii) මූල්‍ය අංශයේ කාර්යාල පරිශ්‍රය බෙදා වෙන්කිරීම (Partition) වෙනුවෙන් දරන ලද රු.194,500 ක මුදල ප්‍රාග්ධනිත නොකර ගොඩනැගිලි පුනරුත්ථාපන වියදම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 5.2 අනුව, වත්කම්වලට අදාල ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් විලම්බිත ආදායම් ලෙස හඳුනාගන්නා බව දක්වා තිබුණද වර්ෂය තුල ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සඳහා ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන රු.9,627,424 ක් වුවද එය රු.9,975,499 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව භාවිතා කළ 'තිබස්' ගිණුම්කරණ පැකේජය 2017 මැයි 09 දින සිට අක්‍රීයව තිබූ බැවින් නව ගිණුම්කරණ පැකේජයක් භාවිතා කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. එහිදී පැරණි පැකේජය තුලින් 2017 මාර්තු 31 දිනෙන් අවසන් මාස 03 සඳහා ලබාගන්නා ලද ශේෂ පිරික්සුමේ ශේෂ 2017 අප්‍රේල් 01 දිනට ආරම්භක ශේෂ ලෙස නව පැකේජයට ඇතුළත් කර ලබා ගන්නා ලද 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශේෂ පිරික්සුමක් ඇසුරෙන් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. එහෙත් 2017 මුල් මාස 03 හි ශේෂ, 2017 අප්‍රේල් 01 දිනට ඉදිරියට ගෙන ඒමේදී පහත වෙනස්කම් නිරීක්ෂණය විය. මෙම වැරදි ගිණුම් කැඩීම් 2017 අප්‍රේල් 01 දිනෙන් පසු ජර්නල් සටහන් මඟින් නිවැරදි කර නොතිබූ බැවින් එමඟින් මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොවුනේය යන්න විගණනයේදී බැහැර කිරීමට නොහැකි විය.

(i) මුල් මාස තුනේ ලෙජර් ගිණුම් 52 ක අවසාන හර ශේෂ හා ලෙජර් ගිණුම් 31 ක අවසාන බැර ශේෂ 2017 අප්‍රේල් 01 දිනට එම ලෙජර් ගිණුම්වල ආරම්භක හර හා බැර ශේෂ අතර පිළිවෙලින් රු.5,443,442 ක හා රු. 1,893,230 ක වෙනස්කම් පැවතීම.

(ii) මුල් මාස තුනට අදාල ශේෂ පිරික්සුමෙහි ඇතුළත් එකතුව රු.11,960,433 ක් වූ හර ශේෂ 67 ක් හා එකතුව රු.7,920,373 ක් වූ බැර ශේෂ 25 ක් 2017 අප්‍රේල් 01 දිනට වූ ශේෂ පිරික්සුමට ඇතුළත් කර නොතිබීම.

(iii) මුල් මාස තුනේ ශේෂ පිරික්සුමට ඇතුළත් නොවූ එකතුව රු.14,718,451 ක් වූ හර ශේෂ 15 ක් හා එකතුව රු.3,434,717 ක බැර ශේෂ 10 ක් 2017 අප්‍රේල් 01 දිනට වූ ශේෂ පිරික්සුමට ඇතුළත් කර තිබීම.

(ආ) මාරුකිරීමේ ගැලපුම් ගිණුම (Transfer for Adjustment Account) නමින් වූ අවිනිශ්චිත ගිණුමක අවස්ථා 17 කට අදාලව රු.1,086,305 ක් වූ හඳුනානොගත් ලැබීම් හා අවස්ථා 71 කට අදාලව රු.4,279,131 ක් වූ හඳුනානොගත් ගෙවීම් සටහන්කර එම ගිණුමේ ශේෂය වූ රු.3,192,826 ක හර ශේෂය ආදායම් ප්‍රකාශනයේ ගිවිසුම්ගත සේවා (Contractual Services) යටතේ වියදමක් ලෙස දක්වා තිබුණි. මෙම ලැබීම් හා ගෙවීම්වලට අදාල ලැබීම් කුවිතාන්සි, බිල්පත්, වවුචර් ආදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම සහ එම ගනුදෙනු

පිළිබඳව කරන ලද නියැදි පරීක්ෂාවකදී අනාවරණය වූ පහත කරුණු හේතුවෙන් ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කර ඇති බවට විගණනයේදී නහවුරු කර ගැනීමට නොහැකි විය.

(i) අංක 240113 සිට 240119 දක්වා වූ වවුචර්වල සඳහන් වියදම්වල එකතුව රු.78,990 ක් වුවද ඒ සඳහා නිකුත් කර තිබූ චෙක්පතෙහි වටිනාකම සඳහා බැංකු ප්‍රකාශනය සහ මුදල් පොත අනුව රු.92,500 ක් ගෙවා තිබූ අතර වෙනස වූ රු.13,510 ක වටිනාකමට අදාළ වියදම් හඳුනා ගැනීමකින් තොරව ඉහත අවිනිශ්චිත ගිණුමට හර කර තිබීම.

(ii) කුවිතාන්සි අංක 259919 මඟින් ලැබුණු රු.159,950 ක මුදල, භාණ්ඩාගාර ප්‍රදාන මුදල් පොතේ දෙවරක් සටහන් කර තිබූ අතර සාවද්‍ය ලෙස ඉහත මාරු කිරීමේ ගිණුමට බැර කර තිබීම.

(iii) චෙක්පත් 05 ක් මඟින් විවිධ ණයගිමියන් හා වියදම් සඳහා ගෙවීම් කර තිබූ රු.273,854 ක් ව්‍යාපෘති මුදල් පොතෙහි හා භාණ්ඩාගාර ප්‍රදාන වෙනුවෙන් වූ මුදල් පොතේ යන මුදල් පොත් දෙකෙහිම ගෙවීම් ලෙස සටහන් කර මාරු කිරීමේ ගිණුමට හර කර තිබීම.

(ඇ) 2016 වර්ෂයේ ණයගිමියන් හා ස්ථාවර වත්කම් ලෙස ගිණුම්වලට ඇතුළත් කර තිබූ වටිනාකම රු.312,500 ක් වූ පරිගණක හා උපාංග විගණිත අවස්ථාව වූ 2018 ඔක්තෝබර් මාසය වන විටත් කොමිෂන් සභාව වෙත ලැබී නොතිබුණි. ඒ හේතුවෙන් ස්ථාවර වත්කම් හා ණයගිමියන් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබූ අතර ආයතනයේ නොමැති වත්කමක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.103,125 ක ක්ෂය ප්‍රතිපාදන සලසා තිබීමෙන් වර්ෂයේ අතිරික්තය ඌනගණනය වී තිබූ අතර ක්ෂය වෙන්කිරීම් අධිගණනය වී තිබුණි.

(ඈ) විගණනයේදී සිදු කළ ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික වියදම රු.3,122,471 ක් වුවද එය රු.1,752,096 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ අතිරික්තය සහ පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.1,370,375 කින් පිළිවෙලින් අඩි සහ ඌන ගණනය වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල රු.114,000 ක පර්යේෂණ පොත් (Research Book) මුද්‍රණ වියදම් පෙර වර්ෂ ගැලපුම් ගිණුමට ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වසරේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ වටිනාකම රු.3,705,040 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 05 ක් මිලදීගත් දින පදනම් කරගෙන ක්ෂය නොකිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.373,411 කින් වැඩියෙන් දක්වා තිබූ අතර වසරේ අතිරික්තය හා දේපළ පිරියත උපකරණවල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද 2016 වර්ෂයට අදාල රු.1,044,593 ක වියදම් පෙර වර්ෂ ගැලපුම් ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට ගලපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාල ගෙවීම් ප්‍රේෂණ පත් අනුව සේවක අර්ථසාධක සඳහා සියයට 12 ක් වූ ආයතනයේ දායකය රු.5,907,230 ක් වුවද සේවක අර්ථසාධක අරමුදල් ගිණුමට අනුව එය රු.7,501,011 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.1,593,781 කින් අධිගණනය වී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාල සේවක භාරකාර අරමුදල් දායක ගෙවීම් රු.1,475,814 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.1,356,698 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ වියදම රු.119,116 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් රු.122,086 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඒ) 2017 දෙසැම්බර් මාසයේ වැටුපෙන් අයකරගෙන තිබූ රු.162,612 ක ආපදා ණය වාරික, ආපදා ණය අත්තිකාරම් ගිණුමට ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ආපදා ණය අත්තිකාරම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුලදී අත්තිකාරම් පියවීම සඳහා යොදන ලද ජර්නල් සටහන් 22 කට අදාල රු. 395,205 ක වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා ලැබිය යුතු සේවක අත්තිකාරම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී සභාව වෙත ලැබී තිබූ රු.540,800 ක් වටිනා ලිඛිත හා සවිකිරීම් ගිණුගත කර නොතිබුණි.

(ක) 2017 අප්‍රේල් මාසය සඳහා ගෙවූ වැටුප් ගිණුම්ගත කිරීම සඳහා වූ අංක 143 දරන ජර්නල් සටහන ලෙජරයේ දෙවරක් සටහන් කිරීම නිසා වැටුප් හා වේතන රු.4,707,763 කින් සහ අදාල බැරකම් සහ ආදායම් ගිණුම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

තවද, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වැටුප් හා වේතන වියදම් රු.47,807,117 ක් වුවද, විගණනයේදී සිදු කළ ගණනය කිරීම් අනුව එම වියදම් රු.51,001,833 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයට අදාළ වැටුප් හා වේතන වියදම් රු.3,194,716 කින් ඌනගණනය වී තිබුණි.

(ග) 2017 මැයි සිට දෙසැම්බර් මාසය දක්වා ස්ථිර කාර්යමණ්ඩලයට ගෙවන ලද වැටුප්වලට අදාල රු.1,374,087 ක වැටුප් අවකරණ, ජර්නල් සටහන් මගින් අදාල ගිණුම්වලට ගැලපුම් කර නොතිබීම හේතුවෙන් අදාල අවකරණ ගිණුම් එම වටිනාකමින් ඌනගණනය වී තිබුණි.

(ඝ) 2017 ජනවාරි 01 දින ස්ථාවර වත්කම් ක්ෂය වෙන්කිරීමේ ගිණුමේ ආරම්භක ශේෂ නිවැරදි කිරීමට ජර්නල් සටහන් අංක 385 මගින් ලෙජරයට ගිණුම්ගත කරන ලද රු.775,620 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ච) සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.23,627,595 ක් වූ ඇගයීම් ගාස්තු තුල 2015 හා 2016 වර්ෂයන් සඳහා ගෙවන ලද ගාස්තු ද ඇතුළත්ව තිබූ අතර ඒ සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. කෙසේ වුවද, නියැදි පරීක්ෂාවේදී 2017 ඔක්තෝබර් මාසය තුල ගෙවා තිබුණු රු.3,906,715 ක ඇගයීම් ගාස්තු තුල 2016 වර්ෂයට අදාල රු.932,965 ක් වූයෙන් ඉකුත් වර්ෂයට අදාල වියදම් සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඩ) 2017 මැයි මාසයට අදාල සභාපතිවරයාගේ රු.75,000 ක් වූ මාසික දීමනාව සහ රු.12,300 ක් වූ ඇගයීම් ගාස්තුව මුදල් පොතේ සහ අදාල වියදම් ගිණුම්වල තෙවරක් සටහන් කිරීම හා වෙක්පත් 12 ක් මගින් ගෙවන ලද රු.196,300 ක් වූ වියදම් මුදල් පොතේ සහ අදාල වියදම් ගිණුම්වල දෙවරක් බැගින් සටහන් කිරීම නිසා මුදල් පොතේ ශේෂය රු.370,900 කින් ඌනගණනය වී තිබූ අතර අදාල වියදම් එම ප්‍රමාණයන්ගෙන් අධිගණනය වී තිබුණි.

(න) සමාලෝචිත වර්ෂයට අදාල 2018 වර්ෂයේදී ගෙවන ලද රු.1,149,142 ක් වූ විවිධ වියදම්, සමාලෝචිත වර්ෂයට අදාලව උපචිත වියදම් ලෙස ගිණුම්ගත නොකිරීමෙන් වර්ෂයේ අතිරික්තය සහ 2017 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩි සහ ඌනගණනය වී තිබුණි.

(ත) 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම් ශීර්ෂය යටතේ දැක්විය යුතු විලම්භිත ආදායම් ප්‍රදාන ගිණුම් ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ගිණුම් 03 ක ශේෂය රු.8,438,717 ක් වුවත් විගණනයට ඉදිරිපත් කළ විස්තරාත්මක උපලේඛන අනුව එම ණය ශේෂවල එකතුව රු.6,431,601 ක් වූයෙන් රු.2,007,116 ක වෙනසක් විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම අනුව, ගිණුම් අයිතම 10 ක ශේෂයන්ගේ එකතුව රු.74,172,354 ක් වුවත් ලෙජරය අනුව එම ශේෂවල එකතුව රු.68,234,831ක් වූයෙන් ශේෂ පිරික්සුම හා ලෙජර් ගිණුම් අතර රු.5,937,523 ක වෙනසක් පැවතුණි.

	ගිණුම් අයිතමය	ශේෂ පිරික්සුම අනුව වටිනාකම (රු.)	ලෙජරය අනුව වටිනාකම (රු.)
1.	කොමිෂන් සහා ණය	1,012,319	950,875
2.	කොමිෂන් සහා ණය පොළී	39,772	43,491
3.	අත්තිකාරම්	259,000	9,000
4.	ආපදා ණය	6,731,598	7,069,548
5.	ආපදා ණය පොළී	379,658	402,445
6.	උත්සව අත්තිකාරම්	694,800	679,800
7.	ජාතික වෘත්තීය සුදුසුකම් පරීක්ෂණ ගාස්තු	10,623,090	10,625,089
8.	බැංකු ගිණුම (PB– 12268324)	4,208,448	1,219,682
9.	ආපසු ගෙවිය යුතු ප්‍රදාන(ටව් යුවර් ෆියුවර්)	11,028,098	9,881,092

10.	ආපසු ගෙවිය යුතු ප්‍රදාන (ලෝක බැංකු)	39,195,571	37,353,809
	එකතුව	74,172,354	68,234,831

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම් අනුව ගිණුම් අයිතම 09 ක එකතුව රු.30,852,444 ක් වූවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.32,830,312 ක් වූයෙන් ශේෂ පිරික්සුම් හා මූල්‍ය ප්‍රකාශන අතර රු.1,977,868 ක වෙනසක් විය.

	ගිණුම් අයිතමය	මූල්‍ය ප්‍රකාශනය අනුව වටිනාකම රු.	ශේෂ පිරික්සුම් අනුව වටිනාකම රු.
1.	සමුච්චිත ක්ෂය - පරිගණක	21,484,361	20,924,366
2.	සමුච්චිත ක්ෂය - කාර්යාල උපකරණ	5,694,175	5,478,548
3.	වර්ෂයේ ක්ෂය - පරිගණක	3,044,802	2,484,807
4.	වර්ෂයේ ක්ෂය - කාර්යාල උපකරණ	977,267	761,642
5.	ඇගයීම් ගාස්තු	-	11,500
6.	මූල්‍ය ප්‍රධාන මාරු ගිණුම	-	6,000
7.	ගෙවිය යුතු උපයන විට බදු අයකිරීම්	-	8,449
8.	පෙර වර්ෂ ගැලපුම්	1,157,183	1,177.132
9.	ටව් යුවර් ෆියුවර් වැඩසටහන (වෙනත්)	472,524	-
		32,830,312	30,852,444

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් විධිමත්ව අංකනය කරන ලද සියලු ගෙවීම් වවුචර් හා වවුචර් අංකය සහිත වෙක්පත් උපපත්‍රිකා විගණනයට ඉදිරිපත් නොකෙරුණු බැවින් ඒ පිළිබඳ සාධාරණ සහ ප්‍රමාණවත් විගණනයක් සිදුකිරීමට නොහැකි විය.තවද මුදල් පොත ඇතුළු ලෙජර් ගිණුම් නිසි පරිදි පවත්වා නොගැනීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගනුදෙනු සහ ශේෂවල නිවැරදිභාවය සහ සම්පූර්ණත්වය පිළිබඳ විගණනයේදි තහවුරු කර ගත නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව බැංකු සැසඳුම් විධිමත් පරිදි පිළියෙල කර නොතිබීම හේතුවෙන් බැංකු සැසඳුම් වල නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් 2007 වර්ෂයේ සිට පෞද්ගලික ආයතනයකින් අයවිය යුතු රු.167,895 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වසර 05 ක් ඉක්ම වූ රු.117,140 ක සේවක ණය ශේෂ 07 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි අංක 272 (1), (3)	මුදල් රෙගුලාසිය පරිදි අදාල මාසය අවසන් වී සති 6 ක් තුළ එකී මාසයට අදාල ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල ගෙවීම් වවුචර් 155 ක් විගණිත අවස්ථාව වූ 2018 ඔක්තෝබර් 15 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 341	මුදල් රෙගුලාසි ප්‍රකාරව උපපත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(iii)	මුදල් රෙගුලාසි 372	කොමිෂන් සභාවේ නිළධාරීන් වෙත විවිධ කටයුතු සඳහා ලබා දී තිබූ අත්තිකාරම් පිළිබඳ අත්තිකාරම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 396	2017 දෙසැම්බර් 31 දිනට පැවති නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 07 සිට අවුරුදු 2 ක් දක්වා කාලයක් ඉකුත් වී තිබූ රු.1,321,122 ක් වටිනා චෙක්පත් 147 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි නියමයන් පරිදි කටයුතු කර නොතිබුණි.
(v)	මුදල් රෙගුලාසි 454 (I)	ආයතනයේ භාවිතා කරන ඉන්වෙන්ට්‍රි බඩු පිළිබඳ වාර්තා ඇතුළත් බඩු ලේඛන පොතක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ආ)	2016 මාර්තු 31 දිනැති 05/2016 රාජ්‍ය මුදල් චක්‍රලේඛය	කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා 2017 දෙසැම්බර් 22 දින සහ 2018 ඔක්තෝබර් 04 යන දිනවලදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර තිබූ නමුත් චක්‍රලේඛය ප්‍රකාරව 2018 නොවැම්බර් 10 දින වන විටත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,912,796 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,982 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,928,778 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමස්ත වියදම රු.3,281,150 කින් වැඩි වී තිබුණද රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.12,088,546 කින් හා මෙහෙයුම් ආදායම රු.4,658,896 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන ලෙස හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ රු.4,846,384 ක් වූ ඌනතාවය 2017 වර්ෂය වන විට රු.16,912,796 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැළපීමේ දී 2013 වර්ෂයේ දී රු.39,198,869 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු.87,726,750 ක් දක්වා වර්ධනය වී තිබුණි.

3.2 ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මූල්‍යාධාර ආපසු අය කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් පෞද්ගලික පාර්ශවයකට එරෙහිව එක් නඩුවක් හා බාහිර පාර්ශවයන් විසින් කොමිෂන් සභාවට එරෙහිව එක් නඩුවක්ද, පවරා තිබූ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 - 2018 කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාව විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂයට අදාලව යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන්වල ප්‍රගතිය දැක්වෙන පරිදි කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතු වුවත් කාර්යසාධන වාර්තාව ඒ අනුව සකස්කර නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පනත ප්‍රකාරව ජාතික වශයෙන් පිළිගත් සහතික පත්‍ර පිරිනැමීම සඳහා ක්‍රමයක් ලෙස කොමිෂම විසින් හඳුන්වා දී තිබූ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ප්‍රදාන ක්‍රමය අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම කොමිෂන් සභාවේ ප්‍රධානතම කාර්යභාරය විය. එහෙත් ඒ සඳහා කොමිසමට ප්‍රමාණවත් සම්පත් නොමැති වීම හේතුවෙන් ඇගයීමකරුවන් පත්කිරීම, ඇගයීම් කිරීම, ඇගයීමකරුවන්ට ගෙවීම් කිරීම හා එම සහතික නිකුත් කිරීම යන සියලු පියවරයන්හිදී ප්‍රමාදයන් සිදු වී තිබුණි. තවද NVQ සහතික පත් ප්‍රදානය කිරීමේ අධීක්ෂණ කටයුතු ඒ හේතුවෙන් ප්‍රමාණවත් පරිදි සිදු නොවන බව පහත කරුණුවලින් නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂයේ අලුතින් රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතන 150 ක් හා පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු ආයතන 210 ක් ලෙස ආයතන 360 ක් ලියාපදිංචි කිරීම සඳහා ඇගයීම් කිරීමට සැලසුම්කර තිබූ නමුත් කාර්යසාධන වාර්තාව අනුව පිළිවෙලින් ආයතන 37 ක් හා 173 ක් ලෙස ආයතන 210 ක් පමණක් ඇගයීම් කර තිබුණි. ඒ අනුව ලභා කරගෙන තිබූ සමස්ත කාර්යසාධනය සියයට 58 ක් පමණක් විය.

(ii) 2017 වර්ෂයේ රාජ්‍ය අංශය මෙහෙයවන වෘත්තීය පුහුණු පාඨමාලා 400 ක් හා පෞද්ගලික අංශය මෙහෙයවන වෘත්තීය පුහුණු පාඨමාලා 100 ක් ලෙස පාඨමාලා 500 ක් අලුතින් ප්‍රතීතනය සඳහා ඇගයීම් කිරීමට සැලසුම් කර තිබූ නමුත් කාර්යසාධන වාර්තාව අනුව පිළිවෙලින් පාඨමාලා 195 ක් හා 78 ක් ලෙස පාඨමාලා 273 ක් පමණක් ඇගයීම් කර තිබුණි. ඒ අනුව ලභා කරගෙන තිබූ සමස්ත කාර්යසාධනය සියයට 55 ක් පමණක් විය.

(ආ) 2017 වර්ෂයේ වාර සහරා 02 ක් මුද්‍රණය කර බෙදාහැරීම සඳහා සැලසුම්කර තිබූ නමුත් මුද්‍රණය කර බෙදාහැර තිබුණේ එක් වාර සහරාවක් පමණක් විය.

(ඇ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂය තුල පුහුණු මධ්‍යස්ථාන 90 ක් සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කර තිබූ මධස්ථාන සංඛ්‍යාව 65 ක් පමණක් විය.

(ඈ) 2014 – 2020 සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක අනුව ඉදිකිරීම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, ලුහු ඉංජිනේරු හා නිෂ්පාදන සහ ආගන්තුක සත්කාර හා සංචාරක යන අංශ සඳහා නිපුණතා සහා 4 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පිහිටුවා තිබූ අතර ඊට අදාල පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) නිපුණතා සහා තුනක් වෙනුවෙන් 2017 වර්ෂයේ දී, රු.මිලියන 11.64 ක් වැයකර තිබුණද ඒ සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තා ඉදිරිපත් කර නොතිබීම.

(ii) සභාවල කටයුතු අමාත්‍යාංශය හෝ නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය විසින් අධීක්ෂණය කර නොතිබීම.

(iii) ව්‍යාපාර සැලැස්ම අනුව එම සහා ආරම්භ කළ වර්ෂයේ සිට ආදායම් ඉපයීම කළ යුතු වුවත් එබඳු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම.

(iv) ඇපයෙන් සීමිත සමාගම් වශයෙන් ක්‍රියාත්මක මෙම ආයතනවල වාර්ෂික ගිණුම් වාර්තා විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබීම.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලේ තුන්වන මහලේ ස්ථාපිත කොමිෂන් සභාවට අතිරේක ඉඩ පහසුකම් ලබාගැනීම සඳහා එහි අටවන මහල සුදුසු පරිදි සකස් කිරීමට 2016 නොවැම්බර් 24 දින මාසයක කොන්ත්‍රාත් කාලයකට යටත්ව රු.6,575,375 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අටවන මහල සංවර්ධනය කිරීමට පූර්වයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබීම සහ අටවන මහල·කොමිෂන් සභාවේ කටයුතු සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා කොමිෂන් සභාව අතර විගණිත අවස්ථාව වූ 2018 සැප්තැම්බර් 07 දින වන විටත් ගිවිසුමකට එළඹ නොතිබීම.

(ii) ගිවිසුම පරිදි උක්ත පළමු අධියරේ සංවර්ධන කටයුතු නියමිත කාලය තුල අවසන් කර නොතිබූ අතර දින 142 ක් ප්‍රමාද වී 2017 මැයි 23 වන දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමද සිදුකර නොතිබූ අතර ඒ වෙනුවෙන් ප්‍රමාද ගාස්තු රු.466,856 ක් අයකරගත යුතු වුවත් රු.144,658 ක් පමණක් අයකරගෙන තිබීම.

(iii) අටවන මහල සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රථම සැලසුම අංග සම්පූර්ණ නොවීමෙන් එහි ඇතුළත් නොවූ කොටස් සංවර්ධනය කිරීම සඳහා 2017 සැප්තැම්බර් මාසයේදී නැවත ලංසු කැඳවා තිබුණි. එහෙත් ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබූ අවම ලංසුව වූ රු.6,552,695 කට කොන්ත්‍රාත්තුව නොපවරා නැවත වරක් ලංසු කැඳවීම් කර තිබූ අතර ඒ අනුව රු.7,628,324 කට දින 90 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 29 දින පිරිනමා තිබුණි.

(iv) 2017 දෙසැම්බර් 31 දින වන විට අටවන මහල සංවර්ධනය කිරීමේ අධියරයන් දෙක සඳහා රු.9,769,691 ක් වැයකර තිබූ නමුත් කොමිෂන් සභාවේ කාර්යාල කටයුතු සඳහා භාවිතා කිරීමට සුදුසු මට්ටමක එම මහල නොපවතින බැවින් නැවත සම්පූර්ණ සංවර්ධනයක් කළ යුතු බව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) විසින් කොමිෂන් සභාව වෙත 2018 ඔක්තෝබර් 31 දින ලබා දී තිබූ වාර්තාව මගින් දක්වා තිබුණි.

(v) 2018 මාර්තු 02 දිනැති නියෝජ්‍ය අධ්‍යක්ෂගේ ලිපිය ප්‍රකාරව වැසි ජලය කාන්දු වීම හේතුවෙන් අටවෙනි මහලේ තිබූ කොමිෂන් සභාවට අයත් උපකරණ හා ලිපි ලේඛනවලට හානි වී තිබූ අතර හානිවීම් සම්බන්ධයෙන් වූ අලාභය තක්සේරු කර නොතිබූ අතර කාර්යාල මේස 02 ක් සඳහා රු.22,000 ක් පමණක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන තිබුණි.

(ආ) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත III වන පරිච්ඡේදයේ 14 (I) වගන්තිය යටතේ ලියාපදිංචි නොකර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සැලැස්වීම සඳහා කිසිදු ආයතනයක් පිහිටුවීම, කළමනාකරණය කිරීම, පවත්වාගෙන යාම හෝ පාලනය කිරීම නොකළ යුතු වුවද 2014 වර්ෂයේ දී කරන ලද පර්යේෂණයකට අනුව දිවයිනේ සමස්ත වෘත්තීය පුහුණු ආයතන සංඛ්‍යාව 2,701 ක් වූ අතර කොමිෂන් සභාවේ ලියාපදිංචි කර තිබූ අධ්‍යාපන ආයතන සංඛ්‍යාව 1,080 ක් හෙවත් සියයට 40 ක් පමණ විය. විධිමත් පරිදි වර්ෂ 02 කට වරක් මෙම ආයතන ලියාපදිංචිය අලුත් නොකිරීම නිසා විගණිත අවස්ථාව වූ 2017 ඔක්තෝබර් 01 දින වන විට ලියාපදිංචි

ආයතන සංඛ්‍යාව 692 දක්වා අඩු වී තිබුණි. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිළිතුර අනුව පනතේ ප්‍රතිපාදන නොමැති වීම නිසා ලියාපදිංචිය නොලැබූ සහ අලුත් නොකරන ලද පුහුණු ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගැනීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි.

(ඇ) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ III වන පරිච්ඡේදයේ 15 (I) වගන්තිය යටතේ ලියාපදිංචි නොකර යම් තෘතීයික හා/හෝ වෘත්තීය අධ්‍යාපනය සඳහා වන නිශ්චිත පාඨමාලා නොපවැත්විය යුතු වුවද 2014 වර්ෂයේ දී කරන ලද පර්යේෂණයකට අනුව කොමිෂන් සභාවේ ජාතික නිපුණතා සුදුසුකම් මට්ටම් සඳහා ලියාපදිංචි කරගෙන තිබූ පාඨමාලා සංඛ්‍යාව 2,442 ක් විය. විධිමත් පරිදි වර්ෂ 02 කට වරක් පාඨමාලා ලියාපදිංචිය අලුත් නොකිරීම නිසා විගණිත අවස්ථාව වූ 2017 ඔක්තෝබර් 01 දින වන විට ලියාපදිංචි පාඨමාලා සංඛ්‍යාව 1,625 ක් දක්වා අඩු වී තිබූ අතර සියලු පුහුණු ආයතන හා පාඨමාලා ලියාපදිංචි කරගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් ආයතනය විසින් අනුගමනය කර නොතිබීම මේ සඳහා හේතු වී තිබුණි.

(ඈ) පනත යටතේ සාදන ලද නියෝග හෝ රීති, පුහුණු ආයතන හා පුහුණුවන්නන් විසින් පිළිපදින බව ආයතනික පරීක්ෂාව තුළින් තහවුරු කරගැනීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් කොමිෂන් සභාව සතු නොවුවද පනතේ 50 සහ 51 වගන්ති මගින් එම කටයුතු ඉටු කිරීම සඳහා මෙම පනත යටතේ සංස්ථාපිත කර ඇති ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට පරීක්ෂකවරුන් බඳවාගෙන තිබුණද ඔවුන් ලවා හෝ එම පරීක්ෂණ කටයුතු සිදු කරවා ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) ආයතනයේ පරිගණක පද්ධතිය 2017 මැයි 09 දින වන විට ක්‍රියාවිරහිත වීම සහ ඊට අදාල දත්ත ගබඩාකර (Back-ups) තබා, නොගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඊට වගකිව යුතු පාර්ශව හඳුනාගැනීමට සභාව විසින් විගණිත අවස්ථාව වූ 2018 සැප්තැම්බර් වන විටත් ක්‍රියාකර නොතිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ ලියාපදිංචි කළ ආයතන විසින් දැනට පවත්වාගෙන යන පාඨමාලා, නිපුණතා සම්මත පාඨමාලා ලෙස වැඩිදියුණු කිරීම සඳහා කොමිෂන් සභාව මඟින් මූල්‍යාධාර ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂයේදී රාජ්‍ය අංශයේ ආයතන 03 කට අයත් මධ්‍යස්ථාන 104 ක් විසින් මූල්‍යාධාර ලබාගැනීම සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කර තිබුණි. ඒ අතුරින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මධ්‍යස්ථාන 03 ක පාඨමාලා 06 ක් සඳහා පමණක් උපකරණ අයිතම 382 ක් ලබාදීම සඳහා ඇගයීමකර නිර්දේශද ලබාදී තිබුණි. එහෙත් වර්ෂය තුල කිසිදු රජයේ හෝ පීඩාවට පත් වූ අංශයන් සඳහා මූල්‍යාධාර පිරිනමා නොතිබුණි.

(ii) 2017 වර්ෂයේ පාඨමාලා සංවර්ධනය සඳහා මූල්‍යාධාර ලබාගැනීමට පෞද්ගලික ආයතන 52 කින් අයදුම්පත්‍ර ඉදිරිපත් කර තිබූ නමුත් ඉන් එක් වෘත්තීය පුහුණු ආයතනයට පමණක් රු.2,686,526 ක මූල්‍යාධාර ලබාදී තිබුණි.

(iii) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු ආයතන වෙත මූල්‍යාධාර සැපයීමේ අරමුණ වන්නේ හඳුනාගත් පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතිනතය කර ඒවා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමට ගෙන ඒම විය. එහෙත් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පාඨමාලා 18 කට අදාලව රු.3,285,890 ක් මූල්‍යාධාර වශයෙන් ලබාදී තිබුණද එම පුහුණු පාඨමාලාවලින් කිසිවක් විගණිත අවස්ථාව වූ 2018 ඔක්තෝබර් 05 දින වන විටත් ප්‍රතිනතය කර නොතිබුණි.

(iv) 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පාඨමාලා ප්‍රතිනතයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත කොමිෂන් සභාව විසින් මූල්‍යාධාර ලෙස ලබාදී තිබූ රු.10,427,342 ක් එම අරමුණට භාවිතා නොකර 2017 දෙසැම්බර් 31 දින වන විටත් වෘත්තීය පුහුණු අධිකාරියේ ගිණුම්වල නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පාඨමාලා පවත්වාගෙන යන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල තත්ත්ව සහතිකකරණ අවශ්‍යතා සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම කොමිෂන් සභාව වෙත පැවරී තිබූ අතර ඒ සඳහා රු. මිලියන 04 ක් 2017 වර්ෂය තුල වැය කර තිබුණි. මේ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අභ්‍යන්තර නිලධාරීන් 20 ක් හා බාහිර නිලධාරීන් 13 ක් ඇතුලු තත්ත්ව කළමනාකරණ විගණකයින් 33 දෙනෙකු ප්‍රධාන විගණකයින් ලෙස පුහුණු කර තිබුණි. එහෙත් බාහිර නිලධාරීන් විගණකයින් ලෙස බඳවා ගැනීමේදී අවශ්‍ය සුදුසුකම් ඇතුලු පිළිගත හැකි නිර්ණායක හඳුනාගෙන නොතිබූ අතර ඉන් නිලධාරීන් 10 දෙනෙක් කිසිදු විගණන කටයුත්තක යෙදී නොතිබුණි.

(ii) අභ්‍යන්තර නිලධාරීන් අතුරින් 06 දෙනෙකු 27 සිට 35 දක්වා වාර ගණනක් විගණන කටයුතු සිදුකරන විට 14 දෙනකු 1 ත් 16 ත් අතර වාර ගණනක් විගණන කටයුතු සිදුකර තිබීම හා බාහිර නිලධාරීන් අභ්‍යන්තර නිලධාරීන්ට සාපේක්ෂව අඩුවෙන් විගණන කටයුතු සඳහා යොදවාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(iii) 2017 වර්ෂයේදී වෘත්තිය පුහුණු අධිකාරිය හා ජාතික ආධුනිකත්ව පුහුණු කිරීම අධිකාරිය විසින් මෙම ක්‍රමයට ඇතුළත්වීම සඳහා රු.මිලියන 25.83 ක් වැයකර පෙර සූදානම්වීම් සිදුකර තිබූ නමුත් එම මධ්‍යස්ථාන කොමිෂන් සභාව විසින් විගණනය කර නොතිබුණි.

(iv) තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සහ එම පද්ධති විගණනය සඳහා ආයතන තෝරා ගැනීම, විගණන නිලධාරීන් පත්කිරීම යනාදී කටයුතු විනිවිදභාවයකින් සිදුවන බවට තහවුරු කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

(v) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කොමිෂන් සභාවේ තීරණ අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වර්ෂ 03 ඇතුළතදී තත්ත්ව සහතිකකරණ ගාස්තු රු.50,000, රු.25,000 හා රු.7,500 ලෙස අවස්ථා 03 කදී වෙනස් කර තිබුණි.

(vi) තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපනය සඳහා විගණන කටයුතුවල යොදාගන්නා ලද අභ්‍යන්තර නිලධාරීන් වෙත ප්‍රවාහන දීමනා, නවාතැන් දීමනා හා පෙරදින දීමනා වශයෙන් පිළිවෙලින් දිනකට රු.3,500, රු.2,000 සහ රු.500 බැගින් ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 4.5 ඡේදයට පටහැනිව ගෙවා තිබූ අතර භාණ්ඩාගාර අනුමැතියක්ද මේ සඳහා ලබාගෙන නොතිබුණි.

4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

කොමිෂන් සභාවට අයත් පිරිවැය රු.2,150,000 ක මෝටර් රථයක් 2017 සැප්තැම්බර් 18 දින සිට ක්‍රියාවිරහිතව තිබූ නමුත් අලුත්වැඩියා කිරීමකින් තොරව විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 25 දින වන විටත් නිශ්ක්‍රීයව පැවතුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ අනුමත කාර්යමණ්ඩලය 116 ක් වුවද තථ්‍යකාර්ය මණ්ඩලය 96 ක් විය. ඒ අතර අත්‍යාවශ්‍ය තනතුරු වන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර, අධ්‍යක්ෂ තනතුරු 02 ක් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 04 ක් ද පැවතුණි.

(ආ) ආයතනය සඳහා නිලධාරීන් බඳවාගැනීමේ නියමිත ක්‍රමවේදයට පරිබාහිරව අනුමත කාර්ය මණ්ඩලය තුල නොවූ සම්බන්ධතා ප්‍රතිසංස්කරණ සහ පුහුණු සංවර්ධන තනතුර සඳහා මාණ්ඩලික පත්‍රිකා අංක 218/18 මගින් අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් පදනමින් 2017 ඔක්තෝබර් 01 ත් 2018 ඔක්තෝබර් 21 ත් අතර කෙටි කාලය තුල අවස්ථා කිහිපයකදී නිලධාරීන් තිදෙනෙකු බඳවාගෙන ඒ වෙනුවෙන් රු.714,665 ක මුදලක් ගෙවා තිබුණි.

4.6 අරමුදල් උපයෝජනය

ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් 2012 සහ 2013 යන වර්ෂවලදී ලැබී තිබූ එකතුව රු.3,300,000 ක මුදලක් පාලක මණ්ඩල හෝ භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සහ කොමිෂන් සභාවේ අරමුණුවලට පටහැනිව ස්ථාවර තැන්පතු 03 ක ආයෝජනය කර තිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම.

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය " ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පැවතියද සමාලෝචිත වර්ෂයට අදාලව කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. ඒ හේතුවෙන් තම කාර්යයන් සම්බන්ධව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලගා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ලභා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් කොමිෂන් සභාවේ 2017 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන දින 190 ක ප්‍රමාදයකින් පසු 2018 සැප්තැම්බර් 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 05 දෙනෙකු වූ නමුත් එයින් සහකාර අධ්‍යක්ෂ_තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රමාණවත් විගණනයක් සිදු වී නොතිබුණි. අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 04 දෙනෙක්ම අධීක්ෂණ මට්ටමේ වූ අතර තත්‍ය වශයෙන් වර්ෂය තුල නිලධාරීන් දෙදෙනෙකු අධීක්ෂණ මට්ටමේ සේවය කර තිබුණි.

6.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 20 සිට සියයට 148 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

6.4 නොවිසඳී ඇති විගණන ඡේද

2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 4.4.ආ ඡේදයේ දක්වා ඇති පරිදි බඳවා ගැනීමේ පරිපාටියේ 4.1.2 වගන්තිය අනුව කළමනාකරණ සේවා ගනයෙහි තනතුරු සඳහා ඉල්ලුම් කරන අභ්‍යන්තර අයදුම්කරුවන් කනිෂ්ඨ කළමනාකරණ සේවා ගනයෙහි I ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළයුතුය. එහෙත් පහළ කළමනාකරණ මට්ටමේ නියමිත පරිදි සේවා පලපුරුද්ද සම්පූර්ණ නොකළ අභ්‍යන්තර නිළධාරීන් හය දෙනෙකු සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවාගෙන තිබුණි. තවද ලකුණු දීමේ පරිපාටිය හඳුනාගෙන තිබුණද අමතර සුදුසුකම් හා පලපුරුද්ද සඳහා සියළු අයදුම්කරුවන්ට සාධාරණ වන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දී නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණය
(අ)	ගිණුම්කරණය	(i) නව පරිගණකගත ගිණුම් පද්ධතියට 2017 වර්ෂයට අදාළ සියලු වවුචර් ඇතුලත් කර නොතිබීම.
		(ii) 2017 මැයි මාසයේ දී පරිගණකගත ගිණුම් පද්ධතිය ක්‍රියා විරහිත වීමත් සමග විධිමත් පරිදි දත්ත පිටත ගබඩා කර නොතිබීම (Back up) නිසා පරිගණකගත දත්ත සම්පූර්ණයෙන්ම විනාශ වීම.
(ආ)	මූල්‍ය පාලනය	(i) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ලබාදී තිබූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම.
		(ii) බැංකු සැසඳුම් ප්‍රකාශ නිවැරදිව සකස් කර නොතිබීම.
(ඇ)	මානව සම්පත් පරිපාලනය	ඇගයීම්කරුවන්ගේ අවශ්‍යතාවය තක්සේරු කිරීම, බඳවා ගැනීම හා ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දී නොතිබීම.
(ඈ)	ලේඛණවල ආරක්ෂාව	විගණනය සඳහා වවුචර් ඉදිරිපත් කිරීමේදී හිඟ වවුචර් සඟිනව ඉදිරිපත් කර තිබූ අතර වගකිව යුතු නිලධාරියකු විසින් පරීක්ෂා කර නොතිබීම, වවුචර් ආරක්ෂා කර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබීම.

ඒ.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල,

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ඔබගේ අංක VTY/E/TVEC/1/17/19 හා 14 (2) සී සහ 2019/02/08 දිනැති උක්ත විගණන වාර්තාව සඳහා වර්තමාන තත්වය හා ගෙන ඇති ක්‍රියාමාර්ග මේ සමඟ ඉදිරිපත් කරමි.

2. මූල්‍ය ප්‍රකාශන

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

(අ)

i. මෙහිදී ඌණ අධි වෙන්කිරීමට අදාළව මෙහෙයුම් ලාභයට ගලපා ඇති රු.3,764,893 ශේෂයෙහි අඩංගු අගයන් බැංකු සැසඳුම් වාර්තාව පිළියෙළ කිරීමත් සමඟම නිරාකරණය කරමින් පවතී. රු.1,352,722 ලෙස පෙර වර්ෂ ගැලපුම් ලෙස දක්වා ඇත්තේ 2016 වර්ෂයට අදාළ වියදම් 2017 වර්ෂයෙහි ගිණුම්ගත කර තිබූ බැවින් ඒ අගයන් හඳුනාගෙන ඒවා පෙර වර්ෂ ගැලපුම් ගිණුම් තුළින් නිරාකරණය කළ අගයන්ය.

ii. මෙහිදී මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී විලම්භිත ආදායමේ අගය ලෙස ගෙන ඇත්තේ 2016 වර්ෂයෙහි මූල්‍ය තත්ව ප්‍රකාශයේ විලම්භිත ආදායමේ ශේෂය හා 2017 වර්ෂයෙහි මූල්‍ය තත්ව ප්‍රකාශයේ විලම්භිත ආදායමේ ශේෂය අතර වෙනසයි.

iii. මෙහිදී මිලදී ගැණුම්වලට අදාළ මූල්‍යමය අගය වන රු.9,975,499 මුදල් ආයෝජන යටත් මුදල් ගලායාමක් ලෙස දක්වා ඇති බව සඳහන් කරමි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

i. මෙහිදී 8වන මහළ වැඩි දියුණු කිරීමට අදාළ වියදම් ගොඩනැගිලි වැඩි දියුණු කිරීම් යටතේ දක්වා ඇති අතර ගොඩනැගිලි ඉදිකිරීමක් ලෙස ගිණුම්ගත නොකළ බව සඳහන් කරමි.

ii. මෙහිදී ද ගොඩනැගිලි පිළිබඳ අයිතිය රේඛීය අමාත්‍යාංශය සතුවන බැවින් ඒ සඳහා කළ වැඩිදියුණු කිරීම් ගොඩනැගිලි පුනරුත්ථාපන වියදම් ලෙස ගිණුම්ගත කළ බවට සඳහන් කරමි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම වෙනස පෙර වර්ෂ ගැලපුම් මඟින් 2018 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන ලදී,

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මෙහිදී සඳහන් කර ඇති අඩුපාඩු මඟහරවා ගැනීම පිණිස පැරණි පැකේජය භාවිතයෙන් 2017.03.31 දිනට ලබාගන්නා ලද ශේෂ පිරික්සුම උපයෝගී කරගෙන 2017.04.01 දිනට ආරම්භක ශේෂය වශයෙන් නව පැකේජයට ඇතුළත් කරන ලදී.

i. මෙම වෙනස්කම් නිරීක්ෂණය වූ බැවින් ඉහතින් සඳහන් කළ පරිදි පැරණි පැකේජය භාවිතයෙන් ලබාගන්නා ලද ශේෂ පිරික්සුමෙහි සඳහන් අගයන් නව පැකේජයේ 2017.04.01 දිනට ආරම්භක ශේෂයන් වශයෙන් ඇතුළත් කරන ලදී

ii, iii. ඉහත i සඳහන් පිළිතුරම මේ සඳහා අදාළ වේ.

(ආ) i, ii, iii දක්වා ඇති මෙම සියළු අඩුපාඩු බැංකු සැසඳුම් ප්‍රකාශනය සකස් කිරීම තුළින් හඳුනාගතහැකි වේ. ඒ අනුව මෙම මාරු කිරීම් ගිණුමට යොදා ඇති සටහන් නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඇ) දක්වා ඇති ස්ථාවර වත්කම් ගිණුමේ රු.312,500 වටිනා පරිගණක උපාංග හා එයට අදාළව වෙන්කරන ලද ක්ෂය ප්‍රමාණය නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන් යොදා ඇත.

(ඈ) පාරිතෝෂික ගිණුමේ ශේෂයද නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඉ) 2018 වසරේ අවසන් ගිණුමේ ශේෂයද නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඊ) රු.373,411 ක් වූ වැඩියෙන් දක්වා තිබූ ක්ෂය අගය නිවැරදි ජර්නල් සටහන් යෙදීමෙන් නිවැරදි කර ඇත.

(උ), (ඌ), (එ)
සඳහන් කර ඇති සියළු අඩුපාඩු 2018 ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කර ඇත.

(ඒ) ආපදා ණය ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඔ) දෙවරක් සටහන් යොදන ලද අත්තිකාරම් ගිණුමෙහි ජර්නල් සටහන් අංක 22 පරීක්ෂා කරබලා නිවැරදි කිරීමට පියවර ගනිමින් සිටී.

(ඕ) සඳහන් කර ඇති රු. 540,800 ක් වටිනා ලී බඩු හා සවිකිරීම් පිළිබඳ පරීක්ෂා කර බලා ගිණුම් ගත කිරීමට පියවර ගනිමින් සිටී.

(ක), (ග), (ජ)
ඉහත අංක යටතේ දක්වා ඇති අධිගණනය වීම් සහ ඌණ ගණනය වීම් 2018 ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කර ඇත.

(ට) 2017 වසරේදී ගෙවීම් සඳහා ඇගයුම් ගාස්තු වවුචර්පත් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වූ බැවින් වර්ෂ අනුව වර්ග කිරීම අපහසු විය. මේ අනුව එම සියල්ල 2017 යටතේ ගිණුම්ගත කිරීමට සිදු වූ බව සඳහන් කරමි. මේ අනුව ඉදිරියේදී අදාළ වර්ෂය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට පියවර ගනිමි.

(ඩ) 2017 මැයි මාසයට අදාළ සභාපතිවරයාගේ දීමනාව තෙවරක් සටහන් කර තිබුණද මුදල් ප්‍රවාහයක් සිදුව ඇත්තේ එක්වරකි. තවද සඳහන් කර ඇති ඇගයුම් ගාස්තු සහ 196,300 අදාළ වියදම් පිළිබඳ සොයා බලා නිවැරදි සටහන් යෙදීමට කටයුතු කරමින් සිටී.

(ණ) උපචිත වියදම් නිසි ලෙස ගණනය කර අදාළ පරිදි ගිණුම් පිළියෙළ කිරීමට පියවර ගනිමින් සිටී.

(ත) විලම්භිත ආදායම් ප්‍රදාන මූල්‍ය තත්ව ප්‍රකාශයේ හිමිකම් ශීර්ෂය යටතේ දැක්වීමට කටයුතු කරමින් සිටී.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) 2018 සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී පෙන්වා ඇති වෙනස්කම් හඳුනාගෙන විස්තරාත්මක උප ලේඛන හා මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් ණය ශේෂ සැසඳුම් කිරීමට පියවර ගනිමින් සිටී.

(ආ) ශේෂ පිරික්සුම හා ලේජරය අතර පැවතුන වෙනස්කම් වලට අදාල විස්තර පහත පරිදි වේ.

ගිණුම		ශේෂ පිරික්සුම අනුව වටිනාකම රුපියල්	ලෙජරය අනුව වටිනාකම රුපියල්	පැහැදිලි කිරීම
1	කොමිෂන් සභා ණය	1,012,319	950,875	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
2	කොමිෂන් සභා ණය පොළී	39,772	43,491	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
3	අත්තිකාරම්	259,000	9,000	වෙනස පිළිබඳ පරීක්ෂා කොට නිවැරදි කිරීමට පියවර ගනිමි
4	ආපදා ණය	6,731,598	7,069,548	වෙනස පිළිබඳ පරීක්ෂා කොට නිවැරදි කිරීමට පියවර ගනිමි
5	ආපදා ණය පොළී	379,658	402,445	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
6	උත්සව අත්තිකාරම්	694,800	679,800	වෙනස පිළිබඳ පරීක්ෂාකොට නිවැරදි කිරීමට පියවර ගනිමි.
7	ජාතික වෘත්තීය සුදුසුකම්	10,623,090	10,625,089	මෙම වෙනස පිළිබඳව පරීක්ෂාකොට නිවැරදි කිරීමට පියවර ගනිමි.
8	බැංකු ගිණුම	4208448	1219682	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
9	ආපසු ගෙවීය යුතු ප්‍රදාන	11,028,098	9,881,092	මෙයට හේතුව පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට පියවර ගනිමි.
10	ආපසු ගෙවිය යුතු ප්‍රදාන	39,195,57	37,353,809	මෙයට හේතුව ගිණුම් පිළියෙල කිරීමෙන් අනතුරුව හඳුනාගන්නා ලද ජිනල් සටහනක් නිවැරදි කිරීමයි.

(ඇ) ශේෂ පිරික්සුම හා ලේජරය අතර පැවතුන වෙනස්කම් වලට අදාල විස්තර පහත පරිදි වේ.

ගිණුම		ශේෂ පිරික්සුම අනුව වටිනාකම රුපියල්	ලෙජරය අනුව වටිනාකම රුපියල්	පැහැදිලි කිරීම
1	සමුච්චිත ක්ෂය	21,484,361	20,924,366	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
2	සමුච්චිත ක්ෂය - කාර්යාල උපකරණ	5,694,175	5,478,548	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
3	වර්ෂයේ ක්ෂය - පරිගණක	3,044,802	2,484,807	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
4	වර්ෂයේ ක්ෂය - කාර්යාල උපකරණ	977,267	760,642	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
5	ඇගයීම් ගාස්තු		11,500	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
6	මූල්‍ය ප්‍රධාන මාරු කිරීම්		6,000	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
7	ගෙවිය යුතු උපයන විට බදු අයකිරීම		8,449	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
8	පෙර වර්ෂය ගැලපුම් ගිණුම	1,157,183	1,177,132	නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී
9	ටව් යුවර් ෆයුවර් වැඩසටහන	472,524		නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මෙම පෞද්ගලික ආයතනයට එරෙහිව නඩුවක් ක්‍රියාත්මක වෙමින් පවතී. එහිදී ලැබෙන තීන්දුව මත අවශ්‍ය කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ඇත.

(ආ) සේවයෙන් ඉවත් වූ සහ ඉවත් කළ අය විසින් ගෙවිය යුතු ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ)

i. ගිණුම්කරණ පද්ධතියේ දත්ත විනාශ වීම නිසා සිදු වූ ප්‍රමාදය නිසා මෙම වවුවර්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම සිදු විය. එවැනි ප්‍රමාද ඉදිරියේදී වළක්වා ගැනීමට පියවර ගෙන ඇත.

ii. බැංකු ගිණුම් තුනටම අදාළ වන පරිදි උප පත්‍රිකා පොත් තුනක් නඩත්තු කෙරේ.

iii. ගිණුම්කරණ පැකේජය භාවිතා කරමින් සකස් කල අත්තිකාරම් ලේඛනය ප්‍රමාණවත් නොවන බව විගණනයෙන් දැක් වූ බැවින් 2018 වසරේ සිට අත්තිකාරම් ලේඛනය පෙර පරිදි පොත්වල සකස් කර ඇත.

iv. මෙහිදී තැපෑලේදී වන ප්‍රමාදවීම් ඇතුළු නොයෙකුත් හේතූන් මත ගෙවීම්ලාභීන් චෙක්පත්හි කාලය ඉකුත් වීම මත ගිණුම් අංශය වෙත ඉදිරිපත්කර දින දීර්ඝකර ගනු ලබයි. මෙය ගිණුම් කරන පද්ධතිය හරහා සිදු නොවන බැවින් පැරණි චෙක්පත් දිනයට බැංකු සැසඳුම් හි පෙන්නුම් කෙරේ. මෙම දින වෙනස් කිරීමට අදාළ රෙජිස්ටරයක් ගිණුම් අංශයේ නඩත්තු කෙරේ.

v. ආයතනයේ භාවිතා කරන ඉන්වෙන්ට්‍රි බඩු පිළිබඳ පොතක් නඩත්තු කෙරෙන අතර එය යාවත්කාලීන කිරීමට අදාළ පියවර ගනිමි.

(ආ) 2017 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදු කළ නමුත් 2017 වර්ෂයේදී ගිණුම්කරණ පරිගණක පද්ධතියේ සිදු වූ තොරතුරු විනාශ වීමක් හේතුකොටගෙන එම වාර්තාවන්හි නිවැරදිතාවය පිළිබඳව ගැටළුවක් පැවතුණි. මෙවැනි තත්වයක් තුළ 2017 භාණ්ඩ සමීක්ෂණයේ නිවැරදි වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපහසු විය. එනමුත් 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මඟින් එම දෝෂ සහගත තත්වයන් නිවැරදි කරගෙන කටයුතු කිරීමට පියවර ගෙන ඇත.

4.1 කාර්යය සාධනය

4.1.1 සැලසුම් කිරීම

(අ) 2014-2018 කාලය සඳහා සංයුක්ත සැලැස්ම යාවත්කාලීන නොවීමට හේතුව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 දරණ ලේඛනයට අනුව සැලැස්ම ක්‍රියාත්මකවීම තාවකාලිකව නවතා දැමීමයි. එසේ වුවද එම වර්ෂවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්ම අනුව සකස් වී ඇත. කෙසේ වෙතත් 2019 වර්ෂයේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා වැඩපිලිවෙලක් දැනට සකස්කර ඇත. මෙය 2019 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේද අඩංගුව ඇත.

(ආ) 2017 වර්ෂය සඳහා කාර්යය සාධන වාර්තා පිළියෙළ කළද එය ක්‍රියාකාරී සැලැස්මට අනුරූපීව පිළියෙළ නොවීම වැළැක්වීමට මේ වන විට කටයුතු කර ඇත. ඒ අනුව ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්මට අනුරූපීව සැලසුම් කරන ලද කාර්ය සාධන ඉදිරිපත් කිරීමට පියවර ගනිමි.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ)

i. 2017 වර්ෂයේ ආයතන ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් නව ලියාපදිංචි සඳහා ඇගයීම් 360ක්ද පවතින ලියාපදිංචි ඇගයීම් සඳහා ඇගයීම් 400ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව නව ලියාපදිංචි සඳහා ඇගයීම් 294ක් සිදු කළ අතර ලියාපදිංචිය අළුත් කිරීම සඳහා ලියාපදිංචි 425ක් කර තිබුනි. ඒ අනුව සමස්ථය ඇගයීම් 760ක් ඉලක්ක කර ඇගයීම් 719ක් සිදු කර ඇත. ඒ අනුව ඉහළ කාර්යය සාධනයක් ලඟා කරගෙන ඇත.එමෙන්ම සිදු කරන ලද ඇගයීම් වලින් අදාළ ආයතන සපුරා තිබූ ලියාපදිංචි වීමේ සුදුසුකම් අනුව අළුත් ආයතන 119ක් ද ලියාපදිංචිය අළුත් කිරීම සම්බන්ධයෙන් ආයතන 314ක් ද ලෙස සමස්ථ ආයතන 433 ක ලියාපදිංචිය සිදු වී ඇත.

ii. 2017 වර්ෂයේ පාඨමාලා ප්‍රතීතනය කිරීම සම්බන්ධයෙන් නව ප්‍රතීතනය සඳහා ඇගයීම් 100ක්ද පවතින ප්‍රතීතනය ඇගයීම් සඳහා ඇගයීම් 400ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණි. සමස්ථය ඇගයීම් 743ක් සිදුකර පාඨමාලා 573ක් ප්‍රතීතනය කර ඇත. ඒ අනුව ඉහළ කාර්යය සාධනයක් ලඟා කරගෙන ඇත.

(ආ) 2017 වර්ෂයේ වාර සඟරා 02ක් මුද්‍රණය කර බෙදාහැරීම සඳහා සැලසුම්කර තිබූ නමුත් මුද්‍රණය කර බෙදාහැර තිබුණේ එක් වාර සඟරාවක් පමණක් විය.

සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් දත්ත ලබා දීම ප්‍රමාද වීම නිසා දෙවන වාර සඟරාව 2017 අවසන් කාර්තුවේදි නිමකර 2017.12.18 දින මුද්‍රණය සඳහා මිල ගණන් කැඳවීම සිදුකරන ලද අතර 2018 වර්ෂයේදි මුද්‍රණය කර බෙදා හරින ලදි.

(ඇ) මධ්‍යස්ථාන 65කට සීමාවී ඇත්තේ, අනෙක් ආයතන බාහිර විගණනයන් සඳහා සූදානම් නොමැතිවීමයි. තවද, QMS සහතිකය ලබාදීමට ආයතනය සඳහා බාහිර විගණන දෙකම සාර්ථකව අවසන්විය යුතුවේ.

2017 වසර සඳහා අපේක්ෂිත විගණන ඉලක්ක වූයේ විගණන 150 ක් වන අතර එයින් 104 ක් විගණනය කිරීම සිදු කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස 69% ක් වේ.

එමෙන්ම QMS විගණනයන් සඳහා ඉල්ලුම් කිරීම සහ සුදුසුකම් ලැබීම එම පුහුණු ආයතනවල දායකත්වය මත සිදුවන අතර ඔවුන්ගේ QMS ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය දිරිමත් කිරීමට අප විසින් තව තවත් කටයුතු කරනු ඇත.

(ඈ)

i. නිපුණතා ආංශික සභා විසින් ඔවුන්ගේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ යුතු වේ. එම ක්‍රියාකාරී සැලැස්ම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය (Commission) වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය. එම අනුමැතිය ලැබූ ආංශික සභා වෙත මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රදානය කරනු ලබන ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය වෙත නිපුණතා ආංශික සභාවල ප්‍රගතිය සෘජුව ලබා දෙන අතර එහි පිටපතක් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ද ලබා දී ඇත.

ii. සියලුම ආංශික නිපුණතා සභාවන් SSDP හි ADB ප්‍රතිපාදන සඳහා DLI අනුව ස්ථාපිත කර ඇති අතර අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම පමණක් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සිදු කරනු ලබයි. ඒ අනුව මෙම සභා නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් අධීක්ෂණය කර මුදල් නිදහස් කිරීමට ඔවුන් විසින් අපහට උපදෙස් දෙනු ඇත.

iii. ආදායම් ඉපයීම පිළිබඳව අදාල ආංශික නිපුණතා සභා වෙත නොකඩවා දැනුම් දී ඇති අතර මේ වන විට එම ආංශික නිපුණතා සභාවන් පහත පරිදි ආදායම් උත්පාදනය කර ඇත.

a. ඉදිකිරීම් ආංශික නිපුණතා සභාව - රු.500,000.00

b. තොරතුරු හා සන්නිවේදන ආංශික නිපුණතා සභාව - රු. 53,400.00

c. නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාව - රු. 205,677.00

d. සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව - රු. 10,000.00

2020 අවසානය වන විට නිපුණතා ආංශික සභා විසින්ම ප්‍රතිපාදන උපයාගත යුතු බව ආංශික සභා පිහිටුවීමේ අවබෝධතා ගිවිසුමෙන් එකඟ වී ඇත.

iv. මෙම ආංශික නිපුණතා සභාවන්හි විගණන කටයුතු එම ආංශික නිපුණතා සභාවන් විසින් තෝරාගන්නා ලද විගණන ආයතනයක් මඟින් විගණනය කරනු ලබයි. එහි පිටපතක් ඔවුන් කොමිෂන් සභාව වෙතද ඉදිරිපත් කර ඇත.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ)

i. අප ආයතනයද අමාත්‍යාංශය යටතේ පවතින බැවින් ලිඛිත ගිවිසුමකින් තොරව ලිපියක් මඟින් පමණක් මෙම අටවන මහළ පවරා දෙන ලදී. (මෙම අටවන මහළ කොමිෂන් සභාව නිර්ණය කළ එකක් නොවන අතර කොමිෂන් සභාවේ ඉඩපහසුකම් අපහසුතාවය මත ලබාදුන් විසඳුමක් ලෙස මෙම අටවන මහළ කොමිෂන් සභාව වෙත ලැබුනි.) නමුත් මේ වන විට අප එම අටවන මහළ නැවත රේඛීය අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.

ii. පළමු අධියරේ සංවර්ධන කටයුතු නිම කල බව ලිඛිතව සැපයුම්කරු විසින් කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති අතර, 2017 මැයි 23 දින වන විට සියලු ඉදිකිරීමෙන් අනතුරුව අවසන් ඉන්වොයිස් පත නිකුත් කර ඇත. ඒ අනුව සියළු ඉදිකිරීම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව දින 47ක් සඳහා ප්‍රමාද ගාස්තු අයකරගැනීමෙන් අනතුරුව 2017/7/3 වන දින ගෙවීම් සිදුකර ඇත.

iii. අටවන මහළ සංවර්ධනය සඳහා මිළ කැඳවීම් ලබා දීමට ඉදිරිපත් වී සිටියේ එක් සැපයුම්කරුවකු පමණි. මෙම සැපයුම්කරු ඉදිරිපත් කර තිබූ මුළු මුදල රු.7,071,095 කි. නමුත් ඇගයීම් කමිටුව මඟින් එම ඉදිරිපත් කර තිබූ මිළ කියුමෙහි එක් රේටයක දෝෂ සහගත තත්වයක් මත මිළ කියුමෙහි අගය රු.6,552,695 ක් විය යුතු බව දක්වා ඇත.

ඒ අනුව එම ආයතනය සංශෝධිත මිළ පිළිගැනීමට ඉදිරිපත් නොවීමත් මෙම ටෙන්ඩරයේ දෙවනි සැපයුම්කරුවකු නොවීම නිසාත් නැවත මිළ කැඳවීම් සිදු කිරීමට සිදු විය. ඒ අනුව දෙවන මිළ කැඳවීම් ඉදිරිපත් වූ පසුව අවම ලන්සුව වන රු.7,628,324මෙම අටවන මහළ සංවර්ධනයට ලබා දී ඇත.

iv. නිපුණතා පියසේ අටවන මහළේ මෙම කොමිෂන් සභාවට අයත් සහතික පත් අංශය ස්ථාපනය කිරීමට පෙර ගොඩනගා තිබූ 8 වන මහළෙහි විදුරු, සුළඟට කඩා වැටීමේ අවදානම් තත්ත්වයක් නිර්මාණය වී තිබූ බැවින් ද එය සේවකයන්ට අනතුරුදායක බැවින් ද CECB ආයතනයෙන් වාර්තාවක් කැඳවන ලදී. මෙම වාර්ථාවට අනුව එම 08 වන මහළෙහි සේවකයින් රැඳිසිටීම නුසුදුසු බවත් එය සුදුසු පරිදි නැවත නවීකරණය කලයුතු බවත් එම වාර්ථාවේ සඳහන්කර තිබුණි. කෙසේ නමුදු මෙම වාර්ථාව ලැබීමට පෙර ආරම්භ කරනලද නවීකරණ කාර්යයන් ඉටුකරන ලද්දේ එම මහළේ සේවය කරන නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් ලබාදීමටය.

v. 2018/08/23 දින AKK ඉංජිනේරු ආයතනයට (කොන්ත්‍රාත් සමාගම) දෙවන වාරික මුදල ගෙවීමේදී ජල කාන්දු හේතුවෙන් සිදු වූ අලාභයට රු.500,000 ක මුදලක් අයකර ඉතිරි මුදල ගෙවා ඇත.

(ආ) පුහුණු ආයතන ලියාපදිංචි නොකිරීම සම්බන්ධයෙන් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතට අනුව ඔවුන්ට විරුද්ධව කටයුතු කිරීමට ප්‍රතිපාදන නොමැත. එමෙන්ම 2017 ඔක්තෝබර් 01 වන දින වන විට ලියාපදිංචි ආයතන අඩුවීමට හේතු ලෙස පහත කරුණු දක්වමු.

1. ආයතන ලියාපදිංචිය සහ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ආයතන ඉල්ලුම් නොකිරීම

2. ඉල්ලුම් කළ නිබුණා ද ඒ සඳහා අදාල ගෙවීම් කර නොනිබීම

3. Online මඟින් යොමු කරන අයදුම් පත්‍ර අසම්පූර්ණා වීම

ගෙන ඇති ක්‍රියාමාර්ග -

1. කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට මේ වන විටත් පියවර ගෙන ඇත.

2. ආයතන ලියාපදිංචිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. 2017 දෙසැම්බර් මස වන විට වැඩමුලු 12 ක් පවත්වා ඇත.

3. ගෙවීම් නොකළ ආයතන වලට දුරකථනයෙන් දැනුම් දී ඇත.

4. වැඩමුළු මගින් සාර්ථකව අන්තර්ජාලය මගින් අයදුම් පත්‍ර යොමු කරන ආකාරය දැනුවත් කිරීම.

5. ව්‍යාපාර ලියාපදිංචි ක්‍රියාවලියේ දී වෘත්තීය පුහුණුව ලබා දෙන ආයතන සඳහා TVEC ලියාපදිංචිය ලබාගත යුතු බව "සමාගම් මැදුර" සහ ව්‍යාපාර ලියාපදිංචිය ලබාදෙන පලාත් පාලන ආයතන දැනුවත් කිරීම.

ඒ අනුව මේවන විට ආයතන ලියාපදිංචිය පැහැදිලි ප්‍රගතියක් පෙන්නුම්කර ඇත.

ලියාපදිංචි වී ඇති මුළු ආයතන සංඛ්‍යාව පහත පරිදි වේ.

වර්ෂය	2014	2015	2016	2017	2018
ලියාපදිංචි ආයතන ප්‍රමාණය	2096	2242	2424	2537	2658

තවද සක්‍රීයව පැවති ආයතන සංඛ්‍යාව 2018.04.30 දින වන විට 786ක් වූ අතර එය 2019.03.29 වන විට 1228 දක්වා වර්ධනය වී ඇත.

(අෑ) 2017 ඔක්තෝබර් 01 වන දින වන විට පාඨමාලා ප්‍රතීතනය අඩුවීමට හේතුවී ඇත්තේ ප්‍රතීතන කටයුතු 2017 වර්ෂයේ මුල්වරට online ක්‍රමවේදය ඔස්සේ ක්‍රියාත්මක වීම නිසා නව තාක්ෂණය සමඟ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පුහුණු ආයතන මැලි වීමයි. නමුත් එම ප්‍රමාණය වැඩිකරලීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- පාඨමාලා ප්‍රතීතනය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. 2017 දෙසැම්බර් මස වන විට වැඩමුලු 12 ක් පවත්වා ඇත.

මේ වන විට සාර්ථක ප්‍රගතියක් ලඟාකරගෙන ඇත.

ප්‍රතීතනය වී ඇති මුළු පාඨමාලා සංඛ්‍යාව පහත පරිදි වේ.

වර්ෂය	2014	2015	2016	2017	2018
පාඨමාලා ප්‍රතීතනය	1115	1678	2359	2843	3211

තවද සක්‍රීයව පැවති පාඨමාලා සංඛ්‍යාව 2018.04.30 දින වන විට 1817ක් වූ අතර එය 2019.03.29 වන විට 2325 දක්වා වර්ධනය වී ඇත.

(අෘ) ආයතන පරීක්ෂාව සඳහා නිපුණතා සංවර්ධන නිළධාරීන් දැනටමත් යොදාගන්නා අතර, 2018 අගභාගයේ හා 2019 වර්ෂයේ සිට NAITA පරීක්ෂකවරුන් ලවා පරීක්ෂාව සිදුකරගෙන යනු ලබයි.

(ඉ) කොමිෂන් සභාවේ ගිණුම්කරණ පද්ධතිය ස්ථාපිත පරිගණක පැකේජය අනපේක්ෂිත ලෙස ක්‍රියා විරහිතවීම හේතුකොටගෙන ගිණුම් කටයුතු සඳහා භාවිතා කරන ලද තිබස් පරිගණක පැකේජය සම්පූර්ණයෙන් අක්‍රීය විය. එහි අඩංගු දත්ත නැවත ස්ථාපිත කරගැනීම සඳහා තොරතුරු පද්ධති අංශයද උත්සාහ කළ අතර, බාහිර ආයතන කිහිපයක් වෙත යොමු කළද එම උත්සාහය සාර්ථක නොවීය. මෙයට හේතු වී තිබුණේ මෙම ගිණුම්කරණ පද්ධතිය ස්ථාපනය කිරීමේදී එම බාහිර පාර්ශවයන් විසින් දෝෂ සහගත ලෙස ගිණුම්කරණ පද්ධතියේම දත්ත ගබඩා කිරීම් සිදු කර තිබීමයි.

එනම් එම දත්ත වෙනත් පරිගණකයක ගබඩා කර නොතිබීමයි. එවැනි තත්වයක් තුළ නව ගිණුම්කරණ පද්ධතියක් මිලදී ගැනීම සඳහා කටයුතු කළ අතර එහි දත්ත ගබඩා කර තබා ගැනීම මේ වන විට සිදු කර ඇත.

4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(අ)

i. මෙම ආයතන මඟින් පවත්වනු ලබන තෝරාගත් පාඨමාලාවලට අදාළ උපකරණ සඳහා මිල අයකුම්පත් නියමිත කාලය තුල ඉදිරිපත් නොකළ බැවින් මූල්‍යාධාර ප්‍රදානය නොකරන ලදී.

ii. කොමිෂන් පත්‍රිකා අංක 226/15 මඟින් මාස 03ක පාඨමාලා සඳහා මූල්‍යාධාර ලබා දීම තීරණය කරන ලදී. පෞද්ගලික අංශයට අයත් දොන් බොස්කෝ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මඟින් පවත්වනු ලබන මාස 03 න් අවසන් වන පාඨමාලා සඳහා මූල්‍යාධාර ප්‍රදානය කරන ලෙස උපදෙස් හා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, මාස 03 න් අවසන් වන ආයතන 03කට අයත් පාඨමාලා 05ක් සඳහා 2017 වර්ෂයේදී මූල්‍යාධාර ප්‍රදානය කරනලදී.

iii. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍යාධාර ප්‍රදානය කරන ලද රාජ්‍ය අංශයේ ආයතන අතුරින් පාඨමාලා 05 ක් පමණක් ප්‍රතීතනයකර නොමැත. මෙම පාඨමාලා ප්‍රතීතනය ලබාගැනීමට අවශ්‍ය කඩිනම් පියවර ගන්නාබව ලිඛිතව දන්වා ඇත.පෞද්ගලික අංශයේ ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා 07 ක් සඳහා නිතිමය පියවර ගෙන ඇති අතර තවත් පාඨමාලා 03 ක් පමණක් ප්‍රතීතන තත්ත්වය ලඟාකරගෙන නොමැත.

ප්‍රතීතනය නොවූ පාඨමාලා ප්‍රතීතනය සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා පාඨමාලා ප්‍රතීතන අංශයට යොමුකර ඇත.

iv. 2011 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලසීමාව තුල රාජ්‍ය අංශය සඳහා මූල්‍යාධාර ප්‍රදානය යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා මූල්‍යාධාර ප්‍රදානයකර ඇත්තේ 2011 වර්ෂය දක්වා පමණි. එම වර්ෂය තුලදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් ආයතන 18ක පාඨමාලා 23 ක් සඳහා රු. 7,382,110.00 ක මුදලක් ප්‍රදානයකර ඇති අතර, පාඨමාලා 18 ක් මේවන විට ප්‍රතීතනය ලබාගෙන ඇත. 2012 වර්ෂයේ සිට අප අමාත්‍යාංශයෙන් පරිබාහිර පුහුණු ආයතනවලට මූල්‍යාධාර ප්‍රදානය කරන ලද අතර 2012 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා මූල්‍යාධාර ප්‍රදානය කර නොමැත.

(ආ)

i. තත්ව කළමනාකරණ විගණකයින් ලෙස ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනයෙන් සහතික ලත් නිළධාරීන් මෙම විගණනයන් සඳහා යොදා ගනී. බාහිර විගණකයින් ඉහත සුදුසුකම් ඇති සහතිකලත් විගණිකයින් ලෙස ලබා ගනී. නමුත් බොහෝ විට මෙම නිළධාරීන් වෙනත් ආයතන වල ස්ථිර රාජකාරියේ නියුක්ත වීම නිසා අප කොමිෂන් සභාව විසින් සිදුකරන විගණනයන් සඳහා QMS විගණකවරු ලෙස ඔවුන් නිදහස් නොකරනු ඇත. එම ගැටළුව මත අදාළ නිළධාරීන්ගේ සේවය ලබා ගැනීමට අපහසු වී ඇත. එමෙන්ම අභ්‍යන්තර QMS විගණකයින් ගේ සේවය ලබා ගැනීම මේ වන විට සිදු කරන අතර, 2017 වසරේ පුහුණු වූ විගණකයින් සමඟ මේ වන විට ගිවිසුම්ගතව ඇති අතර ඉදිරියේදී සියළු විගණකයින්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

ii. බාහිර විගණකයින් ඉහත සුදුසුකම් ඇති සහතිකලත් විගණිකයින් ලෙස ලබා ගනී. නමුත් බොහෝ විට මෙම නිළධාරීන් වෙනත් ආයතන වල ස්ථිර රාජකාරියේ නියුක්ත වීම නිසා අප කොමිෂන් සභාව විසින් සිදුකරන විගණනයන් සඳහා QMS විගණකවරු ලෙස ඔවුන් නිදහස් නොකරනු ඇත. එම ගැටළුව මත අදාළ නිළධාරීන්ගේ සේවය ලබා ගැනීමට අපහසු වී ඇත. එමෙන්ම අභ්‍යන්තර QMS විගණකයින් ගේ සේවය ලබා ගැනීම මේ වන විට සිදු කර ඇත.

iii. වෘත්තීය පුහුණු අධිකාරිය සහ ජාතික ආධුනිකත්ව පුහුණු කිරීමේ අධිකාරිය තත්ත්ව කළමණාකරණ පද්ධතිය ස්ථාපිතකිරීමට අවශ්‍ය සාධන මට්ටම සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් කොමිෂන් සභාව විසින් විගණන කටයුතු සිදුනොකරන ලදී.

එම සාධන මට්ටම ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම එම ආයතන සතුවේ.

iv. මෙම කරුණාට අදාලව දත්ත ලේඛනයක් වර්තමානයේදී පවත්වාගෙන යනු ලබයි. මේ නිසා අදාල වසරේ අයඳුම්කල ආයතන, අයඳුම්කල දිනයන් සහ පළමු විගණනය (Stage - 01) සහ දෙවන විගණනය (Stage - 02) සිදුකල දිනයන්, සහභාගී වූ විගණකවරුන් පිළිබඳ විස්තර ඇතුළත් මෘදුකාංගයක් සකස්කර ක්‍රියාත්මකකර ඇත. එසේ වුවද ඉහත දත්ත ඒ ඒ ආයතනවලට වෙන් කරන ලද ලිපිගොනු වල ද සඳහන්ව ඇත.

v. මූලිකව සහතික කරණ ගාස්තුව වශයෙන් රුපියල් 25,000.00 ක්ද විගණක ගාස්තු රුපියල් 10,000.00 ක් ලෙසත් අනුමැතිය ලබා ක්‍රියාත්මක කෙරුණි.

කෙසේ වෙතත් පසුව එවකට හිටපු සභාපති තුමන්ගේ යෝජනාවකට අනුව ඔහු විසින් කමිටුවක් පත්කර සහතික කරණ ගාස්තු ලෙස රුපියල් 50,000.00 ද විගණක ගාස්තු රුපියල් 10,000.00 ක් සඳහා අනුමැතිය ලබා දුන්නද නැවතත් නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් අදාල ගාස්තු සහතික කරණ ගාස්තු ලෙස රුපියල් 25,000.00 විගණක ගාස්තු රුපියල් 10,000.00 ක් ලෙසත් සංශෝධනය කරන ලදි.

එසේ තිබියදී එවකට සිටි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වරයා ඔහුට ලබාදුන් පෞද්ගලික ආයතන 50 ක ඉලක්කය සඳහා ඔහු විසින් රුපියල් 7,500.00 ක සහතික කරණ ගාස්තුවකට ආයතන කිහිපයකින් අදාල මුදල් අයකරගෙන තිබුණි. (මේ සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබාගෙන ඇත) කෙසේ වෙතත් දැනට මෙම ගාස්තු අයකිරීම රුපියල් 25,000.00 සහ රුපියල් 10,000.00 වන අතර එය ඒකාකාරීව අයකරනු ලැබේ.

තවද අමාත්‍යංශ ලේකම්තුමියගේ මගපෙන්වීම යටතේ වඩාත් උචිත මුදල (සහතික කරණය සඳහා) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් විමසීමක් මේ වන විට සිදුකර ඇත.

vi. මෙම ක්‍රියාවලියට අදාල වෘත්තීමය සුදුසුකම් (Lead Auditor) ඇති නිළධාරීන්ට පමණක් විගණන කලහැකි බැවින් මේ සඳහා අදාල දීමනාව ලබාදීමට කොමිෂන් අනුමැතිය ලබාගෙන ඇත. එමෙන්ම මෙම දීමනා නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියේ අනුමැතිය සහ එහි ප්‍රතිපාදන අනුව ගෙවීම් සිදුකරනු ඇත. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිළධාරීන්ගෙන් 10 % ක රාජ්‍ය භාගය අඩුකරගනු ලැබේ. එසේම නිළධාරීන්ට දිරිදීමනාවක් නොලැබුන හොත් ලබා දී ඇති ඉලක්ක සම්පූර්ණ කිරීම බාධාකාරී වනු ඇත.

4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලද අඩුම පිරිවැය සහිත KF- 7354 මෝටර් රථයේ අමතර කොටස් වර්තමාන වෙළඳපල තුල මිලට ගැනීමට නොමැති වීම තුල අලුත්වැඩියා කිරීමට නොහැකි තත්වයක් පැන නැගුනි. ඒ අනුව අඩුම පිරිවැය සහිත භාණ්ඩ තෝරා ගැනීම තුල ඒවායේ ගුණාත්මක තත්වය හා වෙනත් සාධක පිළිබඳ ප්‍රායෝගික ගැටළුවක් පැන නගියි.

මිලදී ගත් ආයතනයේ බාහිරින් පෙනෙන කොටස් පමණක් අලුත්වැඩියා කල හැකි බව මිල ගණන් කැඳවූ AMW ආයතනය විසින් දන්වා ඇති අතර එම ආයතනය විසින් වැඩිදුරටත් පවසා ඇත්තේ මෙම වාහනයේ අලුත් වැඩියා කල යුතු අත්‍යාවශ්‍ය අංග මේ වන විට නිපදනොවන බව හා ආනයනය නොකරන බවයි. ඒ අනුව ඉතා විශාල පිරිවැයක් දරා මෙය අලුත්වැඩියා කල නොහැකි බැවින් මෙම වාහනය අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) කාර්ය මණ්ඩල පුරප්පාඩු අතර පැවති නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා මේ වන විට බඳවා ගැනීම් සිදුකර අවසන් ව ඇති අතර පුරප්පාඩුව පැවති නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු අතුරින් තනතුරු 03ක් සඳහා උසස් වීම් සිදුකරන ලදී. එසේ උසස් වීමට හේතුව නම් නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා සෘජු බඳවා ගැනීම් නොමැති වීමයි.

(ආ) සම්බන්ධතා ප්‍රතිසංස්කරණ හා පුහුණු සංවර්ධන තනතුර සඳහා බඳවා ගැනීමට අනුමැතිය සභාපතිකා අංක 218/18 මඟින් ලබාගැනීමෙන් අනතුරුව බඳවා ගැනීම සිදු කර ඇත. මෙය එවකට පැවති සේවා අවශ්‍යතා මත නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් වැටුප් ගෙවීමට එකඟව මෙම තාවකාලික බඳවා ගැනීම් සිදු කර ඇති අතර කාර්යය අවසන් කිරීමෙන් පසු ඔවුන්ගේ සේවය අවසන් කර ඇත.

4.6 අරමුදල් උපයෝජනය

ගිණුම් කාරක සභා නිර්දේශ මත ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් ලද ප්‍රතිපාදන වල ඉතිරි මුදල ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත. මෙමඟින් පොළී ආදායමක් ආයතනය වෙත උපයාගත හැකි විය. සඳහන් කර ඇති පරිදි මේ සඳහා පාලක මණ්ඩලයෙන් හා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමි.

5.1 තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ලඟාකර ගැනීම

තිරසාර සංවර්ධන අරමුණු 2019 වර්ෂයේ යාවත්කාලීන කිරීමට නියමිත සංයුක්ත සැලැස්මට ඇතුලත්කොට ඇත. ඒ අනුව 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ඇත.

6. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

භාවිතා කළ ගිණුම්කරණ පැකේජය සම්පූර්ණයෙන්ම විනාශ වූ නිසා 2017 වසරේදී මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බව සඳහන් කරමි.

6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ කාර්යය මණ්ඩලය සඳහා අනුමත සහකාර අධ්‍යක්ෂවරු දෙදෙනාගෙන් එක් අයෙකු අනියුක්ත කර ඇති අතර අනිකුත් සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා නිළධාරියෙකු පත්කර නොමැති නමුත් ඒ සඳහා සංවර්ධන නිළධාරීන් දෙදෙනකු අනියුක්ත කර ඇත. ඒ අනුව විගණන අංශයේ සැලැස්මට අනුකූලව එම අභ්‍යන්තර විගණනය අංශයේ කාර්යයන් ආවරණය කර ගත හැක.

එනමුදු යම් යම් අවස්ථාවලදී විගණන දිගුව අනුව කාලය නිර්ණය වීම හේතුවෙන් අවදානම් අඩු විෂය සහිත ප්‍රදේශයන්හි විගණනයන් සිදු වී ඇත්තේ අඩුවෙන් බව සටහන් කිරීමට කැමැත්තෙමි.

6.3 අයවැය ලේඛනමය පාලනය

නම්‍ය ආදායම් හා වියදම් අයවැය ගත අදායම් හා වියදම් සමඟ සසඳා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලනකාරකයක් ලෙස උපයෝජනය කර ගැනීමට කටයුතු කරමි.

6.4 නොවිසඳී ඇති විගණන ඡේද

බඳවා ගැනීමේ පරිපාටියට අනුව අභ්‍යන්තර නිලධාරීන් සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් සිදුකරන ලදී.

2017.06.07 දිනැති යොමු අංක VTY/E/A/TVEC/2016/13/04 මඟින් යොමු කළ විගණන විමසුමට ප්‍රතිචාර වශයෙන් 2017.07.13 දිනැති යොමු අංක TVEC/E2/Audit Query අනුව මෙම පත්වීම් ලබාදීමේදී සමහර ලකුණු ලබාදීමේ පිළිවෙල ලකුණු ලබාදීමේ නිර්නායකයන්ට අනුව සිදුවී නොමැති බවද එම නිර්නායක කොමිසන් සභාව විසින් සකස් කරගත් නිර්නායක වන බැවින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත මේ අනුව ලකුණු ලබාදීමට මෙම

නිර්නායක පදනම් කර නොගත් බව දන්වා ඇත. තවද එහිදී ඉංග්‍රීසි දැනුම සඳහා ප්‍රමුඛත්වයක් දක්වන ලද බවද දක්වා ඇත.

7. පද්ධති හා පාලනයන්

(අ) ගිණුම්කරණ

i. වවුචර්පත් නව පැකේජයට ඇතුළත් කිරීමේදී අදියර 02ක් යටතේ ඇතුලත් කරන ලදී. මෙසේ ඇතුලත් කිරීමේදී ඇති වූ අත්හැරීම් දෝෂ මඟ හරවා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත.

ii. පැරණි පැකේජය අක්‍රිය වීම නිසා සිදුවූ හානිය වළක්වා ගැනීම පිණිස නව පැකේජයෙහි දත්ත මූල්‍ය අංශයේද, එසේම තොරතුරු පද්ධති අංශයේද වෙනමම ගබඩා කර තැබීමට පියවර ගෙන ඇත.

(ආ)

i. සමාලෝචිත වර්ෂයේදී සැලසුම්කළ පරිදි නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් දුන් ප්‍රතිපාදන පූර්ණ ලෙස උපයෝගී කරගෙන නොතිබූ අතර 2018 වසරේදී ඌණ උපයෝජනය වළක්වා ගැනීමට කටයුතු කරමි

ii. බැංකු සැසඳුම් ප්‍රකාශ නිවැරදිව සකස් කිරීමට අවශ්‍ය පියවර ගනිමි.

(ඇ) ඇගයීම්කරුවන්ගේ අවශ්‍යතාවය තක්සේරු කිරීම සිදුවනුයේ ප්‍රතිඵලය කරන ලද පාඨමාලා සංඛ්‍යාව අනුවය. බඳවා ගැනීම් වර්ෂය පුරා අවශ්‍යතාවය අනුව සිදුවේ. ගෙවීම් කිරීමේ ප්‍රමාදයක් සිදුවූයේ ප්‍රතිපාදන ලැබීම් ප්‍රමාදවීම නිසාය. එනමුදු මේ වන විට ගෙවීම් කිරීම ආරම්භකර ඇති අතර 2018 දෙසැම්බර් මස අවසානයට පෙර සියළු ගෙවීම් අවසන් කර ඇත.

(ඈ) විගණනය සඳහා වවුචර්පත් ඉදිරිපත් කිරීමේදී වගකිව යුතු නිළධාරියෙකු විසින් පරීක්ෂාකර බලා ඉදිරිපත් කිරීමටත් වවුචර්පත් ආරක්ෂා කර ගැනීම පිණිස දිනපතා ගොනුගත කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීමටත් අදාළ පියවර ගෙන ඇත.

එස්.ඒ.කේ.රුබසිංහ
අධ්‍යක්ෂ ජනරාල් (ආවරණ)

පිටපත් - ලේකම් - කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු දිගකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය(දැ.ගැ.ස)

විගණන අධිකාරී - රජයේ විගණන අංශය (දැ.ගැ.ස)

නියෝජ්‍ය අධ්‍යක්ෂ - (අභ්‍යන්තර විගණක හා විමර්ෂණ)- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (දැ.ගැ.ස)



Tertiary and Vocational Education Commission

(Ministry of Skills Development and Vocational Training)

'Nipunatha Piyasa', 354/2, Elvitigala Mawatha,

Colombo 05, Sri Lanka

Tel : +94 (0)11 7608000, Fax : +94 (0)11 2555007

email: info@tvec.gov.lk

Web: www.tvec.gov.lk